## 2025-08-12 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ.

## සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව.

මෙදිනපෙ.ව 9.30 ට සාමාන්‍ය මහා සභා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා | ගරු සභාපති |
| 02. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 03. | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 08. | ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 09. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 10. | ගරු මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 11. | ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා | සභික |
| 12. | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 13. | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 14. | ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 15. | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 16. | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 17. | ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 18. | ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා | සභික |
| 19. | ගරු මන්ත්‍රිනී ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 20. | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සභික |
| 21. | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 22. | ගරු මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා | සභික |
| 23. | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 24. | ගරු මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |
| 25. | ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා | සභික |
| 26. | එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා | සභික |
| 27. | එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා | සභික |
| 28. | සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය | සභික |
| 29 | පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා | සභික |

**නොපැමිණීම්:-**

*ගරුමන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා.
*ගරු මන්ත්‍රීඑච්.ආරියදාස මැතිතුමා.
*ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා.
*ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා.
*ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා.
*ගරු මන්ත්‍රිනි එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය.
*ගරු මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය.

01.ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා සභාවේ ලේකම් ලෙස සහභාගී විය.

**සභාපතිතුමා:-**
සියලු දෙනාටම සුභ උදෑසනක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම අපේ මාධ්‍ය හිතවතුන්ට.ඒ වගේම අපේ ප්‍රාදේශිය සභාවේ ලේකම්තුමාට,ඒ වගේම අපේ ප්‍රාදේශිය සභාවේ නිලධාරීන් දෙපලට,සියලු දෙනාටම සුභ උදෑසනක් වේවා කියලා ප්‍රාර්තනා කරනවා.සභාවේ වැඩකටයුතු ආරම්භ කිරිමටයි සූදානම් වන්නේ.

**සභාපතිතුමා:-**
ප්‍රථමයෙන් ම තිබෙන්නේ පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

**01.පසුගිය සභා වර්තාව සභා සම්මත කිරීම.**

**01.01.2025.07.08වන දින පැවති සාමාන්‍ය මහා සභා වර්තාව සභා සම්මත කිරීමටමම යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි 2025.07.08 වන දින පැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සංශෝධන සහිතව ස්ථිර කරනවා.

ඒ අනුව 2025-07-08වන දින පැවති සාමාන්‍ය මහා සභා වර්තාව සංශෝධන සහිතව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

**02. සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ නිවේදන.**

2025 වර්ෂයේ කාර්ය සාධන සැලැස්ම ,ක්‍රියාකාරී සැලැස්ම හා තිරසර සංවර්ධන සැලැස්ම පිලිබඳ සභික මණ්ඩලය දැනුවත් කිරිම සම්බන්ධවයි.

2025.06.25 වන දින පැවති විගණන කළමණාකරණ කමිටු රැස්වීමේ දී 2025 වර්ෂයේ කාර්ය සාධන සැලැස්ම ,ක්‍රියාකාරී සැලැස්ම හා තිරසර සංවර්ධන සැලැස්ම ගරු සභාපතිතුමන් ,ගරු උපසභාපතිතුමන් හා සභික මණ්ඩලය වෙත දැනුවත් වීම සඳහා ඉදිරිපත් කරන ලෙසට අප වෙත උපදෙස් ලැබී ඇත.

ඒ අනුව 2025.08.12 වන දින පැවැත්වීමට නියමිත මීළඟ සභා වාරයේදී ඉහත සැලසුම් ,ගරු සභාපතිතුමන්, ගරු උපසභාපතිතුමන් ප්‍රමුඛ සභික මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිමට ඔබතුමාගේ අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**සභාපතිතුමා:-**

මේ සම්බන්ධව සියලුම තොරතුරු විෂයභාර නිලධාරි තුමියගෙන් ලබා ගන්න පුළුවන්.

**සභාපතිතුමා:-**

තුන මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා එවා ඇති ලිපි සභාගත කිරිම.

**සභාපතිතුමා:-**

**03. මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා ඇති ලිපි සභාගත කිරිම.**

අද දින විශේෂයෙන්මලිපි හතක් තියෙනවා.මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් හත් දෙනෙක් නිවාඩු අනුමත කරගෙන තියෙනවා. එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා, පී.ඩිල්ෂාන් කාවින්ද රාජපක්ෂ මැතිතුමා,කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා,එච්.ආරියදාස මැතිතුමා,ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා,එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය,ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය.මම සභාවට යෝජනා කරනවා එම නිවාඩු අනුමත කරන ලෙසට.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම නිවාඩු අනුමත කිරිමේ යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
**04.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.**

**සභාපතිතුමා:-**

පැමිණිලි හා සංදේශ අපට කිසිවක් ලැබී නෑ..

**සභාපතිතුමා:-**

**05.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

**සභාපතිතුමා:-**

ලැබී නැත.

**සභාපතිතුමා:-**

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**සභාපතිතුමා:-**

ප්‍රථම යෝජනාවසභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 6.1 යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.1.බෝපැත්ත මාර්ගයේ සිට දෙහිඕවිට දක්වා අතුරු මාර්ගය (වඩුගන්ගොඩ මාර්ගය) සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,වඩුවන්ගොඩ මාර්ගය දෛනිකව පාසල් ළමුන් 500 ක් පමණ ගමන් කරන මාර්ගයක්.ඊට අමතරව ප්‍රදේශයේ අතුරු මාර්ගයක් ලෙස පනාවල සිට බොපැත්ත මාර්ගයට අතුරු මාර්ගයක් ලෙස මෙම මාර්ගය විශාල පිරිසක් භාවිතා කරනවා.මේ මාර්ගයේ අපි සැලකියයුතු ප්‍රමාණයක් සංවර්ධනය කරලා තියෙනවා.තව සුළු ප්‍රමාණයක් සංවර්ධනය කරන්න නියමිතයි.මම මේ යෝජනාවෙන් අපේක්ෂා කරල තියෙන්නේ තාක්ෂණ නිලධාරීන්ගේ සහය ඇතිව ප්‍රදේශිය සභාවේ සේවකයින් හතර පස් දෙනෙක් යොදල ඒ දෙපැත්ත කාණු පද්ධතිය සුද්ද කරන්නත්,දෙපැත්ත ඉඩම් වලින් ගස් හිටවල වැව්ල තියෙන වැටිය සකස් කරන්නත්,පළාත් සභාවට අයිති පාර ක්ලීය කරන්නත්,අවශ්‍ය ප්‍රමාණය නිවරදි කරන්නත්,තමයි ප්‍රවේශයක් ගන්නත්,ඒ සඳහා ප්‍රදෙශිය සභා ට්‍රැක්ටරයක් ලබා දෙනව නම්,මට ශ්‍රම දායකත්වය ලැස්ති කර දීමේ හැකියාව තියෙනවා.ඒකේ දැනට ගස් තියෙන තැන්වල පාරේ සමහර තැන්වල ත්‍රීවිල් දෙකක් මාරු කරන්නත් බැරි තත්ත්වයක් වෙලා තියෙනවා.ඒ නිසා ඒක අත්‍යවශය කාරණයක් සේ සලකා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා මං ඉල්ලා සිටිනවා.

ඒ අනුව අතුරලිය මන්ත්‍රීතුමාගේ 6.1.බෝපැත්ත මාර්ගයේ සිට දෙහිඕවිට දක්වා අතුරු මාර්ගය (වඩුගන්ගොඩ මාර්ගය) සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
අතුරලිය මන්ත්‍රීතුමාගේ දෙවන යෝජනාව 6.2
**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.2.ඇහැලියගොඩ මූලික රෝහලට විකල්ප මාර්ගයක් ලෙස ජානිස් මාවත සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභිකපී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අතුරලිය මන්ත්‍රීතුමා විසින් ගෙන ආ ඒ යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ ජානිස් මාවත කියන එක මං හිතන්නේ අවුරුදු ගානක ඉදලා දැඩි උත්සහයක් ගත්ත,පසුගිය රජයන් දැඩි උත්සහයක යෙදුනා මේ මාර්ගය සංවර්ධනය කරන්න.මං හිතන්නේ ඒ රජයන්වලට බැරි වුණා.මං හිතන්නේ පවතින රජය,දැන් රජය නිවරදි දැක්මකුත් එක්ක කාලෝචිත අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා කියන පදනම මත ගෙනිච්ච රජයක්.ඒ නිසා මේ ජානිස් මාවත සංවර්ධනය කිරිමේ කටයුත්තට හොඳ ප්‍රවේශයක් ගන්න කියලා මං යෝජනා කරනවා.ඒ සඳහා අවශ්‍ය සෞඛ්‍ය අමාත්‍යාංශය,පළාත් සෞඛ්‍ය ඒකක,ඊට අමතරව මාර්ග සංවර්ධන අධිකාරිය,පළාත් සභාව,රෝහලට අදාළ තාක්ෂණික නිලධාරීන්,ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලය ඇතුළු,ව්‍යාපාරික ප්‍රජාව විශේෂයෙන් ,යාය පාර ව්‍යාපාරික ප්‍රජාව ගිය රජයට දැඩි දෝෂාරෝපණයක් කළා මේ කටයුත්ත සිදු කරලා දුන්නෑ කියලා.ඒ නිසා මේ කටයුත්තට ප්‍රමුඛතාව ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.
**සභිකපී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං ඒකට තව ඉල්ලීමක් කරනවා.මොකද ඇත්තටම ඔය පාර පුළුවන්නම් පොලීසියට අපි දැනුම් දිමක් කළොත්,වන් වේ කරන්න පුළුවන් කියලා.ඒකෙ ලෙඩ්ඩුනේ අරන් යන්නේ.ත්‍රිවිල් දෙකක් දැම්මට පස්සේ ඇත්තටම වාහන දෙක මාරු වෙන්නලොකු වෙලාවක් යනවා.හැකියාවක් තියෙනව නම්සභාවේ සියලු දෙනාම ඒකටපාට පක්ෂ භේදයකින් තොරව ඒකට වැඩි නැඹුරුතාවයක් යොමු කරලා. මං හිතන්නේ ප්‍රායෝගිකයි කියලා වන්වේ කරන එක.හදිස්සි ලෙඩෙක් ගෙනාව කියමුකො,හාර්ට් ඇටැක් ලෙඩෙක් එහෙම කියමුකෝ,අරන් යන්න බෑ.තව විනාඩි 10 ක් 15 ක් යනවා වාහන දෙක මාරුවෙන්න.

**සභික සුජීව විජේසුරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ අතුරලිය මන්ත්‍රීතුමාකාලෝචි යෝජනාවක් ගෙනාවේ.ඒ කාලෙත් මේ සභාවට යෝජනාව ගෙනාව.ඒත් අපට ඒ කටයුත්ත කර ගන්න බැරි වුණා.ඒක මං පිළිගන්නවා.එම නිසා එතුමා කිව්වා වගේ පොදු කටයුතුවලදී අවශ්‍ය කටයුතුවලදී සහයෝගය ලබා දීලා අපි ඒ පුනරුදය කියන ප්‍රතිපත්ති ප්‍රකාශයත් එක්ක ඒක අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස ඔබතුමා නායකත්වය දෙයි කියලා මං විශ්වාස කරනවා.ඔබතුමාගේ

නායකත්වය තුළ ඔබතුමා වැඩේ කරද්දී,යම් යම් ගැටලු මතුවෙන්න පුළුවන් සභාපතිතුමා.සරල නෑ.හැබැයි අපිට අපි සත්භාවයෙන් ගන්නා වූ සෑම තීන්දුවකදීම අපට අවසානය හොඳ ප්‍රතිඵලයක් එයි.ඒ නිසා ඔබතුමා ඒ කාරුණික අවධානය යොමු කොට සුදුසුවැඩපිළිවෙලක් යොදන්න.

ඒ අනුව අතුරලිය මන්ත්‍රීතුමාගේ 6.2.ඇහැලියගොඩ මූලික රෝහලට විකල්ප මාර්ගයක් ලෙස ජානිස් මාවත සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

මී ළඟට සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමාගේ 6.3 යෝජනාව

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,

**6.3.නුගදණ්ඩ කප්පලාල්ල මාර්ගයේ ධර්මසිරි ජයමාන්න මහතාගේ නිවස අසල පැති බැම්ම සකස් කර දෙන ලෙස මම යෝජනා කරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම මාර්ගය නුගදණ්ඩ විද්‍යාලය අසලින් කප්පලාල්ල හරහා ඉංගිරිය දක්වා දිවෙන මාර්ගයක්. මේකෙන් නුගදණ්ඩ පාසලට එන කප්පලාල්ල ප්‍රදේශයේ,මැලේ කන්ද ප්‍රදේශයේ ඒ වගේ ම පාසල් ළමුන් විශාල ප්‍රමාණයක් ගමන් කරනවා.ඒ වගේම දවස ගානේ බඩු ලොරි 5 ක් විතර මේ මාර්ගයේ යනවා ඒනවා.ඒ වගේම විකල්ප මාර්ගයක් ලෙස ඉංගිරියට යන්නත් භාවිතා කරනවා.ඒ වගේම තමයි දේශිය සංචාරකයෝ එන හෝටලයක් තියෙනවා මේ කප්පලාල්ල ප්‍රදේශයේ.ඒ අයත් භාවිතා කරන්නේ මේ මාර්ගය.ඒ වගේම කොළඹ ප්‍රාදේශිය සභාව විසින් යෝජනාවක් කරලා තියෙනවා මැලේ කන්ද ප්‍රදේශය සංචාරක කලාපයක් විදිහට සංවර්ධනය කරන්න.එතකොට මේ මාර්ගය තමයි භාවිතා වෙන්නේ.ඒතකොට එම නිසා මේක අත්‍යවශ්‍ය මාර්ගයක්. අපි මේක දෙතුන්පාරක් විතර ප්‍රතිසංස්කරණය කළා.එ වුණාට ඒක සාර්ථක වුන් නෑ.ඒ නිසාමං ප්‍රමුඛ දෙයක් සේ සලකා මේ මාර්ගය පැති බැම්ම සංවර්ධනය කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මං දිගුවක් ඉදිරිපත් කරන්න කැමතියි.මං හිතන්නේ මේ ප්‍රදේශය සංවර්ධනය කිරීම තුළින් ප්‍රදේශිය සභාවට ආදායමක් උත්පාදනය කර ගැනිමට අවස්ථාවක් උදාවෙමින් පවතිනවා.විශාල වශයෙන් ආගමික ස්ථාන කිහිපයක් පිහිටලා තියෙනවා මේ ප්‍රදේශයේ.මං හිතන්නේ ලංකාවේ හැම දෙසින්ම මේ සඳහා ප්‍රවේශ මාර්ගයක් ලෙස භාවිතා කරනවා.ඒනිසා රුවන්සිරි මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලෝචිතයි.ඒ සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මං පොඩි දෙයක් කියන්න ඕන.මෙහි ආගමික ප්‍රදේශයක් ගැන කිවුවා.නුගදන්ඩ කිනගහවිල.ඒ ප්‍රදේශයේ මට ආරංචි වුණා මේ දවස්වල,සමාජ මාධ්‍ය ඔස්සේ දැඩි විවේචනයට ලක් වුණා,දැඩි පාරිසරික හානියක් කරමින් ආගමික ස්ථානයක් ස්ථාපනය කරන්න යනවා කියලා.ඒකෙ පරිසර වාර්තාවක් අරගෙන ද ඒ ආගමික ස්ථානය හදන්නේ සභාපතිතුමා.නැත්නම් නියමිත ගොඩනැගිලි සැලසුමක් එක්කද කියලා අපිට පොඩ්ඩක් අපේ ජනතාව දැනුවත් කරන්න ඕන. මට ඒකත් දැන් ආරංචි වුණ විදිහට,ඒ සොබා සෞන්දර්ය පිරි ප්‍රදේශයක් විදිහටත් ඒ වගේම සංචාරකයෝ ඇදී ගෙන එන ප්‍රදේශයක් විදිහටත් අපට තිරසාරව පරිසරය ආරක්ෂා කර ගෙන,යම් කිසි ආගමික ස්ථානයක් හදනව නම් එය සුදුසුයි.නමුත් පරිසර විනාශ කරමින් ආගමික ස්ථාන හැදීම අපිට අනුමත කරන්න බෑ.මං දැක්ක පසුගිය දවස්වල සමාජ මාධ්‍ය ඔස්සේ මහා පරිමාණ පාරිසරික සුද්ද කරලාඒ ආගමික ස්ථානය ගොඩනැගෙමින් පවතිනවා කියලා.මං ඊ ළඟ සභාවට මං තවත් දැනුවත් වෙලා ඒ පිළිබඳව සභාව දැනුවත් කරන්න සුදානමින් ඉන්නේ.නමුත් දැනට තියෙන තොරතුරුත් එක්ක සභාපතිතුමනි මං ඒ මාතෘකාව කතා කරපු හින්දා කිවුවේ.එහෙම ප්‍රදේශිය සභාව දැනුවත් කරන්නේ නැතුව අනවසරයෙන් පරිසරය කපලා දාල විනාශ කරලා ආගමික ස්ථාන සෑදීම අපිට කිසිසේත් ම අනුමත කරන්න බෑ.ඒ හින්ද ඒ පිළිබඳව පොඩ්ඩක් සොයා බලන්න කියලා මං මේ වෙලාවේ දී මං ඔබතුමාට යෝජනා කරනවා.

**සභාපතිතුමා:-**

ඇත්තටම මේ රුවන්සිරි මන්ත්‍රීතුමාගේ යෝජනාවට ඒක පොඩ්ඩක්වත් සම්බන්ධයක් නෑ.ඒ යෝජනාවේ තියෙන්නේ නුගදණ්ඩ කප්පලාල්ල මාර්ගයේ ධර්මසිරි ජයමාන්න මහතාගේ නිවස අසල පැතිබැම්ම සකස් කර ගැනීම කියන යෝජනාව.මං හිතන්නේ අපේ දිලීන් මන්ත්‍රීතුමා ඒකට සම්බන්ධ වෙන්න ඇත්තේ,අතුරලිය මන්ත්‍රීතුමාගේ අර ඌණ පූර්ණයත් එක්ක වෙන්න ඕනේ.නමුත් ඒ යෝජනාවත් එක්ක සම්බන්ධයක් නෑ.මන්ත්‍රීතුමා අපි ඒ ගැන කතා කරන්න අවස්ථාවක් යොදා ගමු.මේ වෙලාවේ දෙන්න බෑ.අපි ඒකට වෙනම යෝජනාවක් හැටියට මේකෙ පාරිසරික තත්ත්වය ආගමික ස්ථානය කුමක්ද කියන ඒ ගැන කතා කරමු.රුවන්සිරි විමලරත්න මන්ත්‍රීතුමාගේයෝනාවට ඒක සම්බන්ධ නෑ.ඒ සම්බන්ධව පසු වෙලාවක පසු දිනෙක ඒ සම්බන්ධයෙන් කතා කරන්න පුළුවන්.

ඒ අනුව රුවන්සිරි විමලරත්න මන්ත්‍රීතුමාගේ**6.3.**නුගදණ්ඩ කප්පලාල්ල මාර්ගයේ ධර්මසිරි ජයමාන්න මහතාගේ නිවස අසල පැති බැම්ම සකස් කර ගැනීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
ඊ ළඟට රුවන්සිරි මන්ත්‍රීතුමාගේ 6.4. යෝජනාව.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.4. අක්කර40 B කොටස (උතුරු කරදන )මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් දමා සංවර්ධනය කර ගැනීමට මම යෝජනා කරමි.**

**සභිකකේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ අක්කර 40 ගමේ ඒ කොටස හා බී කොටස වශයෙන් උතුරු කරදන වසමේ ගම්මාන දෙකක් තියෙනවා.මේ ගම්මාන දෙකම සාමාන්‍ය ප්‍රදේශයෙන් හුදෙකලා වෙලා වගේ තියෙන්නේ.මේකෙ මේ අක්කර 40 බී කොටසේ දැඩි බැවුම් සහිත ප්‍රදේශයේ තමා මේ ගම්මානය තියෙන්නේ.ඒකේ සැලකිය යුතු ප්‍රමාණයක් සංවර්ධනය කරලා තියෙනවා.ඉතුරු වෙලා තියෙන කොටසේ දැන යන්නම බැරි තරමට පාර අබලන් වෙලා තියෙන්නේ.ඒක නිසා මේකටත් ලක්ෂ 5 ක් වගේ මුදලක් යයි.මම යෝජනා කරනවා එම නිසා මෙම මාර්ගය හැකි ඉක්මනට සංවර්ධනය කරලා දෙන්න කියලා.
ඒ අනුව රුවන්සිරි විමලරත්න මන්ත්‍රීතුමාගේ 6.4**.**අක්කර 40 B කොටස (උතුරු කරදන )මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් දමා සංවර්ධනය කර ගැනීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
ඊ ළඟට සභික එච්.එල්.ජයසේකර මන්ත්‍රීතුමාගේ 6.5. යෝජනාව.
**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.5.දියවේල්ල කමල් කුමාර මහතාගේ නිවස අසල නාන ළිඳ සංවර්ධනය කිරිමට මම යෝජනා කරමි.**

**සභිකකේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම ළිඳ පායන කාලෙට ජලය හිඳෙන් නෑ.පායන කාලෙටත් මිනිස්සු ප්‍රයෝජනයට ගන්නවා.(සද්දෙ මදි නිසා තියන වචන පැහැදිලි නෑ.)

ඒ අනුව එච්.එල්.ජයසේකර මැතිතුමාගේ 6.5දියවේල්ල කමල් කුමාර මහතාගේ නිවස අසල නාන ළිඳ සංවර්ධනය කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
ඊ ළඟට සභික එච්.එල්.ජයසේකර මන්ත්‍රීතුමාගේ 6.6. යෝජනාව.
**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.6.ගොඩමාවිට නාන පීල්ල සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එස්.එල්.දීපාල්මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ පිල්ලත් ඒ වගේම නියගෙට හිඳෙන්නේ නෑ.විශාල දෙනෙකුට ප්‍රයෝජනවත් වෙනවා. මේ නාන පීල්ල.මේ නාන පීල්ල සංවර්ධනය කිරිම තමයි මං යෝජනා කරන්නේ.

ඒ අනුව එච්.එල්.ජයසේකර මැතිතුමාගේ6.6.ගොඩමාවිට නාන පීල්ල සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
ඊ ළඟට සභික එච්.එල්.ජයසේකර මන්ත්‍රීතුමාගේ 6.7. යෝජනාව.
**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,

**6.7.හිඳුරංගල මහ පොල්වත්ත ප්‍රාථමික සෞඛ්‍ය ඒකක ගොඩනැගිල්ලට ඉදිරියෙන් (20×10)රෝගීන්ට වාඩි වී සිටීම සඳහා ආවරණයක් සැකසීම හා ප්ලාස්ටික් පුටු 25 ක් ලබා දීමට යෝජනා කරමි.**

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,හිඳුරංගල මහ පොල්වත්ත ප්‍රාථමික සෞඛ්‍ය ඒකකයක් තියෙනවා.ඒකෙ ගැබිනි මාතාවන්ගේ සායන පවත්වනවා,ඒවගේමරෝගීන්ට ඇවිත් ඉඳගන්න හරි හමන් ඉඳගන්න තැනක් නෑ.ගස් යට ඉන්න තත්ත්වයක් තමයි ඉන්නේ. ඒකට 20×10 වගේ හට් එකක් ගහල පුටු 25 ක් ලබා දීම තමයි මං යෝජනා කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක ඉතාමත් හොඳ යෝජනාවක් ඇත්තටම.ඒ වගේ දෙයක් හැබැයි ප්‍රාදේශිය සභාවට කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තියෙනවා.යෝජනාව හොඳයි.මිනිසුන්ට ඒ වගේ වැඩ වෙන්න ඕන.ප්‍රාදේශිය සභා විෂය පථය තුළ ඒ හට් එකට පුටු අරන් දෙන්න පුළුවන්ද කියන එක ප්‍රශ්නයක් තියෙනවා.ඒමොකද දන්නවද ඒකෙන් මං අදහස් කරන්නේ සභාපතිතුමනි, මගේ යෝජනා තුනක් මං දැම්මා,එකක් ආපසු රිටන් කරලා තිබ්බා.මම ඒක දැම්මෙ මොකද ඒක හරි ප්‍රශ්නයක්. ගියසැරෙත්,අපි විරෝධතාවය ප්‍රකාශ කළා,අපි ලිපියක් මඟින් ඔබතුමාට ඉදිරිපත් කළා.අපිට තියෙන්නේ ජනතාව වෙනුවෙන් කතා කරන්න මේ ප්‍රාදේශිය සභාව විතරයි.දැන් පළාත් සභාවක් නැනේ.හැබැයි අපේ ගමේ අපේ ගෙදරට යන්න තියෙන පාර පළාත් සභා පාරක්.අපේ මේ ප්‍රාදේශිය සභාවේ ජීවත් වෙන මිනිස්සු.ඉතින් ඒ පාර හදල දෙන්න කියලා,ඒ යෝජනාව සභාවට ඉදිරිපත් කළාම ඒක ප්‍රාදේශිය සභා විෂය පථයට අයිති නෑ. කියලා ඒක අයින් කරනවා.හැබැයි ඒක අපි යෝජනාවක් විදිහට අරන් අපි මිනිසුන්ට උදව් කරන්න ඕන.මේක විෂය පථයට තියෙනවද කියන එක මට ගැටලුවක්.එතකොට මෙතුමටඑකයි,මට එකයි,මත දෙකක් වෙන්න විදිහක් නෑ සභාපතිතුමා.එතකොට මම නම් කියන්නේ මම එදත් ඒකයි කිවුවේ අපි යෝජනා ගෙනාව වැඩියි තමයි,මන්ත්‍රීවරු වැඩියි තමයි,හැබැයි අපි ඔක්කොම සාකච්චා කරලා මේවා කතා කරන්න ඕන තැන් කියලා තමයි,අපි නම් සලකන්නේ.අපිට මිනිසුන්ගේ ප්‍රශ්න මෙතන නැතුව වෙන තැනක් නෑ සභාපතිතුමා කතා කරන්න.සභාපතිතුමන්ලා කලින් කෘෂිකර්ම කමිටුව විතරක් තිබ්බා.ඒකට ආණ්ඩු පක්ෂේ මන්ත්‍රීවරු විතරයි ගියේ.ඊට පස්සේ AG office එකේ රැස්වීමක් තිබ්බා.ඒකටත් ආණ්ඩු පක්ෂය විතරයි ගියේ.හැබැයි මේක ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් නම් ඔබතුමන්ලා විශ්වාස කරනව නම් පසුගිය කාල සීමාව තුළ එහෙම වුණේ නෑ කියලා මේක අලුත් සිස්ටම් එකක් හදන විදිහ,මේක අලුත් සිස්ටම් එකක් හදන විදිහට ඔබතුමන්ලා විශ්වාස කරනව නම් මේ විපක්ෂ මන්ත්‍රීවරුත් ඒ වගේ තැන්වල ඉන්න ඕන.එහෙම කිසිම ආරාධනාවක් නෑ අපිට.සම්බන්ධීකරණ කමිටුවට එන්න කියන්නෙත් නෑ.මේවා කතා කරන්න.අපිට වෙන තැන්වලට ආරාධනාවක් කරන්නෙත් නෑ.ඒවා වලක්වනවා සමහර වෙලාවට.මං දන්නෑ මොකක්ද මේ සිසිටම් එකේ වෙනස කියලා.හැබැයි මිනිස්සු අපිව විශ්වාස කරලා ඔබතුමාලට ඡන්දෙ දුන්නේ මේ සිස්ටම් එක වෙනස් කරලා හොඳ තත්ත්වයකට ගේන්න.එතකොට ඒ හොඳ තත්ත්වයකට ගේනකොට ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ අපේ විපක්ෂෙ නැත්නම් අපේ මේ වම් පැත්තේ ඔබතුමා සඳහන් කරන විදිහට ඔබතුමා මුලින් සඳහන් කරපු විදිහට වම්පස කණ්ඩායමේ අදහස් කොහෙද අපි ඉදිරිපත් කරන්නේ.අපිට ඉදිරිපත් කරන්න අවස්ථාවක් නැනේ.ඒක හින්ද මේ වගේ යෝජනා පළාත් සභාව සම්බන්ධ වෙන්න පුළුවන් මධ්‍යම රජය හා සම්බන්ධ වෙන්න පුළුවන්.අපි පහුගිය කාල සිමාව තුළ අපි කලින් මන්ත්‍රීවරු විදිහට යෝජනා ගෙනැත් කතා කළා.මේවයෙ කතා කරලා මේවයෙ සම්මත කරගෙන අපි අදාළ ආයතනවලට යැවුවා.යවලා යැවුව ඒවාට උත්තර ලබා ගත්තා.ඒක හින්ද ඒ අවස්ථාව නැති කරන්න එපා.ඒක පළාත් සභා පාරක් කියලා ඒක ඉවතට දාන්න එපා.ඒක මධ්‍යම රජයේ පාරක් කියලා ඒක ඉවතට දාන්න එපා.ඒක එච්චර හොඳ දෙයක් නෙමෙයි කියලා මං විශ්වාස කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ වෙලාවේ මතක් කරන්න ඕන අපට පලවෙනි සභා රැස්වීමට එන්න බැරි වුණා.නමුත් ලේකම්තුමත් කියලා තිබුණා මෙතන රීති ප්‍රශ්නයක් හදල තියෙන්නේ සභාවේ විෂය පථයට අදාළ කරුණු පමණයි ගෙන එන්න පුළුවන් කියලා.එසේ රිතියක් .එසේ නීතියක් තිබෙනවා නම් අපි ඒ රීතියට ගරු කරනවා.නමුත් මේ වෙලාවේ මතක් කරන්න ඕන දෙයක් තමයි අපේ දිලීන් කරුණාපාල මන්ත්‍රීතුමා කිවුව වගේ මම දැම්ම පාසලේ පැවැත්වෙන දෙමාපිය රැස්වීමක් ගැන,පාසල තුළ පැවැත්වෙන දෙමාපිය රැස්වීම් එක් මාසක දින කිහිපයක් නොපවත්වා එක් දිනක් යොදා ගැනීම,ඒ යෝජනාව දැම්මා.ඒකට එවලා තියෙනවා ඒකට මට එවලා තියෙනවා ලිවුමක්,අපි යෝජනාවක් දැම්මහම ඒක ප්‍රතික්ෂේප වූ කාරණාව පැහැදිලි කරලා ලිපියක් එවීම පිළිබඳව ඔබතුමාට ගෞරවනිය ස්තුතිය පුද කරනවා.ඒකෙ තියෙනවා අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් කාර්යක්.තීන්දු තීරණ ගැනිම එකී පාසල්වල විදුහල්පතිවරුන් විසින් ඉටු කෙරේ. ඔබතුමා දැනුම් දීලා තියෙනවා.ගරු සභාපතිතුමනි දිලීන් මන්ත්‍රීතුමා කිවුව වගේ අපි කතා කරන්න ඕන. මං 2021.01.20 වෙනිදා ප්‍රාදේශිය සභාවේ ,ඒකෙ මං යෝජනාවක් දාල තිබුණා ඇහැලියගොඩ මූලික රෝහලට දිසා අධිකරණ වෛද්‍ය වරයෙක් අවශ්‍යයි කියලා.ඒකක්.ඊට පස්සේ ඇහැලියගොඩ නගරයට අත්‍යවශ්‍ය වනරජයේ ස්පා එකක් ලබා ගන්න ඕන කියලා යෝජනා දෙකක් දැම්මා.ඒ යෝජනා දෙකම සභාපති විසින් ඒ යෝජනා දෙකම ස්ථිර කළා.එවකට විපක්සයේ හිටපු අපේ උපසභාපතිතුමන්ලා සභාපතිතුමන්ලා සියලුම මන්ත්‍රීවරු සියලු දෙනාම ඒකට පක්ෂව අදහස් දැක්වූවා ස්තුති කරලා.හැබැයි මේක සභාවෙන් ඉටු කරන්න බෑ.අපි මේක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට යොමු කළා.ඒ යොමු කළාට පස්සේ එවකට හිටපු සෞඛ්‍ය අමාත්‍ය ගරු ඇමතිනී පවිත්‍රාදේවී වන්නිආරච්චි මැතිණිය විසින් අධිකරණ වෛද්‍යවරයෙක් අවුරුදු 50කට 60කට පස්සේ ලබා දුන්නා.දැන අපි අවුරුදු 5 ක් තිස්සේ,අපි අවිස්සාවේල්ලටත් රත්නපුරේටත් නොගොස් අද මිනී පර්යේෂණ වාර්තා ගන්නවා.මරණ පරීක්ෂණ වාර්තා ගන්නවා.ඒ නිසා ගරු සභාපතිතුමනි අපි මේවනකොටඅපේ මේවන විට

පළාත් සභාව නෑ.මන්ත්‍රීවරු නෑ.එතකොට අපි පළාත් සභාවට ලිපි ගෙනිහිල්ල යොමු කරන්න විදිහක් නෑ.ග්‍රාමීයව ඉන්න එකම මහජන නියෝජිතවරයා අපි.අපි මාසෙකට සැරයක් මෙතනට රැස් වෙනවා.රැස් වීමේ දී ඒ මිනිස්සු විසින් කියන දේවල් අරන් ඇවිත් මෙතන ප්‍රකාශයට පත් කරන ඕන, පත් කරන කොට ඔබතුමන්ලා තීරණයක් ගන්න ඕන,එහෙනම් අපි මේක සංවර්ධන කමිටුවකට දාමු,එහෙම නැත්නම් මේක මේ මේ තැනට යොමු කරමු කියන යෝජනාව ඉටු කරන්න කියන එකවත් එහෙම නැත්නම් නැවත වතාවත් නීති සම්පාදනය කිරීමේදී,ඔබතුමාට හමුවන ස්ථානයේදී පැහැදිලි කිරීමක් කරන්නසභාවේ මන්ත්‍රීවරු ගේන යෝජනා අපි සභාවේ කතා කරලා එහි වැදගත්කම,එහි ගුණාත්මක භාවය කතා කරලා අපි මේ කටයුත්ත ඒ විදිහට විසඳගන්න,නීති වෙනස් කරන්න කියලා යෝජනාවක් ගෙනැල්ල සංශෝධනය කර ගන්න.මොකද හේතුව එහෙම නොවුනොත් අපිට මොනවද මේ සභාවට ඇවිත් කතා කරන්න තියෙන්නේ.මම ඒ යෝජනාවෙන් ගෙනාවේ මිනිසුන්ගේ දුක් ගැනවිල්ලක්.මං කෙටියෙන් අදහස් ප්‍රකාශ කරන්න අවශ්‍යයි,මොකද හේතුව මේ පාසල් පද්ධතියේ තියෙන රැස්වීම් වලට එකම පවුලේ හතර දෙනෙක් ඉන්නව නම්, රාජ්‍ය සේවයේ ප්‍රාදේශිය ලේකම්ගේ එතනින් ගිහාම කම්කරුවන්ගේ ළමයි.මේ ළමයි දෙන්නෙක් හිටියත් රැස්වීම් තුන හතරක් පැවැත්වෙනවා.ඇයි ශිෂ්‍ය නායක එකේ ඉන්නවා එක්කෙනෙක් ,ඊට පස්සේ තව මොහකට ,හරි ඉන්නවා එතකොට දවස් දෙක තුනක් ඒ ගොල්ලන්ට දවස් දෙක තුනක් කැඳවනවා පාසලට.මිනිසුන්ගේ දෛනික ජීවිතේ කීයක් හරි හොයාගන්න තියෙන කාලය නාස්ති වෙනවා.නමුත් අපි මේ කියන්නේ ඒකට විරුද්ධ ප්‍රකාශ කිරීමක් නෙමේ,ඒක අපි පළාත් සභාවට යොමු කරලා හෝ වේවා,වෙනයම් හෝ ආයතනයකට යොමු කරලා මේ පිළිබඳ සංශෝධනයක් ඇති කරලා ගැසට් කරලා,විදුහල්පතිවරු දැනුවත් කිරීමත්,මේ කාල සටහන අනුව ඔයගොල්ලෝ මේ රැස්වීම් ලබා දෙන්න එන දවසක කියලා.ඒක කළාද නොකරද කාරණාවක් නෑ. ඕක කලින් මං ලබුගම කලටුවාව ජලාශයෙන් කොළඹ දිස්ත්‍රික්කෙට වතුර යනවා.නමුත් එය සබරගමුවේ අපේ සම්පතක්.ඒ නිසා ඒ සම්පතින් ලැබෙන මුදලින් ශත 25 ක් ලැබෙන්න කටයුතු කරන්න කිවුවහම,ඒ කාලෙ තීරණයක් ආවා එහෙම කරන්න බෑ,එකෙ අපි පසුවිපරමක් කරලා බැලුවැන් පස්සේ,ඒක එදා ඉඳන් නීති සම්පාදනය කරලා බස්නාහිර පළාතේ සභාවට යනවා කියලා කිවුවා.එතනින් අපි නිහඬ වෙලා හිටියා.යෝජනාව ඒක එහෙමයි.ඒක හින්දා ගරු සභාපතිතුමනි, මින් ඉදිරියට යම් කිසි දෙයක් කරන කොට,අපි මෙන්න මේ මහජන නියෝජිතයෝ මෙතනට ඇවිල්ලා,ඒ ප්‍රකාශයන් කොහොමද අපි සභාවේ කරන්නේ කියලා. කන්දරාවක් තියෙනවා තමයි සංවර්ධන යෝජනා දීලා.මේක කරන්න පුළුවන්ද බැරිද කියන එක අපිට බැහැ තීරණය කරන්න.මේ කෙ කරන්නත් බෑ තමයි.අපි කරුණාවෙන් ඔබතුමාගෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා,ඉදිරියේදී අපියම්කිසි නීති සම්පාදනය කරනකොට,මෙන්න මේ අලුතින් හදල තියෙන නීති ගොඩක් වෙනස් කරන්න සිද්ධ වෙනවා.ඒ මොකද මහජනයා අපිට ඇවිල්ලා දෙන පැමිණිලිත් එක්ක.සෝට් ෆෝම් කතා කලේ.ඉදිරි සභාවකට යොමු කරනවා.බොහොමත්ම ස්තුතියි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්නමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ඔබතුමාගේ එදා කතාවේ කියවුණා,ඔබතුමා වම්පස හා දකුණුපස කියලා විතරක් කතා කරනවා කියලා.හැබැයි සභාපතිතුමනි මේ ආසන පැනවීමේ සිටම යම්කිසි වරදක් තියෙනවා.ජ්‍යෙෂ්ඨත්වයේ පිළිවෙලට නෙමෙයි ආසන පනවලා තියෙන්නේ.හැබැයි මං දකිනවා ඔබතුමා ඒ වෙනස්කම් දිගටම සිදු කරමින් අපේ මන්ත්‍රීවරුන්ට පමණක් ඔබතුමා විෂයපථයට අදාළ නොවන ඒවා ඉවත් කරලා අර ඔබතුමාගේ දකුණුපස අය කියලා කියාගන්නා ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා සඳහා අවස්ථාව ලබා දෙනවා.ගැරු සභාපතිතුමනි මෙහෙම වුණාම ඇති වුණාහම අපි කොහොමද විශ්වාසයෙන් කටයුතු කරන්නේසභාව තුළ .ඔබතුමත් දේශපානය කරනවා,අපිත් දේශපාලනය කරනවා.හැබැයි සභාවේ තියෙන සම්පත් භාවිතා කරලා,සභාවේ තියෙන අරමුදල් භාවිතා කරලා යම් කිසි තින්දු අරගෙන සංවර්ධන ක්‍රියාමාර්ගයක් ගන්නව නම් හැබැයි සභාවේ විෂය පථයට අදාළ වන්නේ නැත්නම් ඒ යෝජනා අපේ ඔබතුමාගේ වම්පස සිටින පිරිසගේ යෝජනා පමණක් ඉවත් කර දකුණුපස සිටින අයගේ යෝජනාවලට ඉඩකඩ ලැබුණු,හිතා මතා කටයුතු කිරීම(ඝෝෂාව පැහැදිලි නෑ)බොහොම ස්තුතියි.

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ඔබතුමා බොහොම සත්භාවයෙන් මේ කටයුත්තු කර ගෙන යන බව පේනවා.හැබැයි විශ්වාස කරනවා ඔබතුමාටකොච්චර සත්භාවයෙන් මේ සියලුම මන්ත්‍රීවරුන්ට ආණ්ඩු පක්ෂය විපක්ෂය කියන්නේ නැතුව අපේ ඔබතුමාගේ වම්පස හා දකුණුපස කියලා ඔබතුමා ආමන්ත්‍රනය කරමින් සත්භාවයෙන් ඔබතුමා වැඩ කරගෙන යනකොට මට හිතෙනවා,අපට හිතෙනවා ඔබතුමාට යම් යම් බලපෑම් ඇවිල්ලා ඔබතුමාගෙ මතය අබිබවා ගිහිල්ලා ඔබතුමාට රිසි සේ මේ කටයුත්ත කරන්න දෙන් නෑ කියලා අපට හැඟීමක් ඇති වෙනවා.අපි එකට කාරණා අධ්‍යනය කරමින් යන්නේ ගරු සභාපතිතුමනි. ඔබතුමා මේ ප්‍රදේශයට බොහොම ලෙන්ගතුව මේ කටයුතු සියල්ලම එකට එකතුවෙලා යම් බොහොම සත්භාවයෙන් ,ද්වේශ සහගත තත්ත්වයෙන් තොරව කටයුතු කරන්න උත්සහ කළත් ,යම් යම් හදිසි හස්ත ඔබතුමාට ක්‍රියාත්මක වන බව පේනවා.ඔබතුමාගේ හර්ද සාක්ෂිය කියයි,මම මේ කියන කතාව හරිද වැරදිද කියලා.ඔබතුමා යම් යම් තැන්වල තර්ක කරනවා.ඔබතුමා ඔබතුමාගේ නායකයන් එක්ක තර්ක කරනවා. අපට ආරංචි වෙලා තියෙනවා.අපි තොරතුරු ලබා ගෙන තියෙනවා.ඒ නිසා ගරු සභාපතිතුමනි,ඔබතුමා අපි වම්පස කණ්ඩායම හා දකුණුපස කණ්ඩායම වශයෙන් ඔබතුමාගේ හෘර්ද සාක්ෂියට එකග වුණාට එදා ගොවිජන සේවා එකේ රැස්වීමට දකුණු පස විතරයිරැස්වීමට වාර්තා කළේ.අස්වැසුම දුක්ගන්නා රැස්වීමට,විශේෂයෙන්ම සම්බන්ධ වෙන්න ඕන අපි.අපේ මිනිසුන්ට තමයි අසාධාරණය වී ගෙන යන්නේ.හැබැයි ඔබතුමාගේ හදිසි හස්තයක් ක්‍රියාත්මක වෙලා ,ඔබතුමාට උපදෙස් ලැබෙනවා දකුනුපස විතරක් වාර්තා කරන්න කියලා.හැබැයි මං හිතනවා ඔබතුමා ඒඒ තැන්වලදී යම් යම් ගැටලු වලට මුහුණ දුන් බවත් අපි දන්නවා.හැබැයි ගරු සභාපතිතුමනි,ඔබතුමා විශ්වාස කරන විදිහට මේක දකුණු පස හා වම් ලෙස ක්‍රියාත්මක කරනව නම් ඔබතුමා අපේ යෝජනා මේ සභාවට දාන්න ඕන.අපේ ඉදිරියට මේ අපේ දිලින් මන්ත්‍රිතුමා කිවුව, ගයාෂාන් මන්ත්‍රීතුමා කිවුව වගේ මේක සත්භාවයෙන් කරනව නම් ඉස්සරහට යන්. සත්භාවයෙන් තොරව ඔබතුමා තීරණ ගන්නවනම්අපිත් ඒකට සූදානම් කියන පණිවිඩයත් ඔබතුමාට දෙනවා.ගරු සභාපතිතුමනි එදා ඔබතුමා දන්නවාපලීගල පාර පළාත් සභා මාර්ගයක්,ඒ පාර දංකුඹුර මිනිස්සු,බුළුගහපිටිය මිනිස්සු,පලීගල මිනිස්සු,මියනකොලතැන්න මිනිස්සු,ධම්මාලෝක මාවතේ මිනිස්සු

එනවා.ඔබතුමාට ඡන්දෙ දීපු වැඩි පිරිසක් ඉන්නේ බුළුගහපිටිය පාරේ.පාවිච්චි කරන්නේ.ඔබතුමා මට කියනවා.ඔබතුමා මට කියනවා,ඒ කැඩිච්ච තැන දැම්මහම.මගේ යෝජනාව ඔබතුමා අයින් කරනවා.ඒක ඔබතුමාගේ නොදනුවත්කමද,විෂය කරුණු නොදන්නාකමද,මට ගැටලුවක් තියෙනවා.හැබැයි ඔබතුමා ද්වේශ සහගතව නෙමේ කළේ. ඒකත් මං පිළිගන්නවා.හැබැයි ගරු සභාපතිතුමනි, මේක මරණාධාර සමිතියේවත් මේක අපේ ගමේ වනිතා සමිතියේවත් මේක අපේ ගෙදර සාකච්චා කරන්න අපට බෑ.අපට බෑ.අපට තියෙන්නේ මේ සභාව.අපේ ගමේ මිනිස්සුන්ගේ අපට ඡන්දෙ දුන්නු හෝ නොදුන්නත්,ඒ මිනිසුන්ගේ ප්‍රශ්න කතා කරන්න තියෙන්නේ මෙතන.ඒක හින්ද මේකට අවස්ථාවක් දෙන්නැත්තන්,ඔබතුමන්ලා ගන්නා වූ ඕනෑම තීන්දුවකට අපි විරුද්ධ වෙනවා.ඒක මතක තියා ගන්න.ඔබතුමාටත්,උපසභාපතිතුමාටත් මේ මන්ත්‍රීවරුන්ටත්,මේක බොහොම අවංකව කරන්න පුළුවන්කම තියෙනවා.හැබැයි ඔය ඇමතිවරුන්ගේ ලේකම්වරු පාවිච්චි කරලා උන්ට මේක හැඟීමක් නෑ, උන් මේ සභාව ගැන දන්නෙත් නෑ. මතක තියා ගන්න.තමුන්නාන්සේලාට ඡන්දෙ දුන්නේ ගම්වල අහිංසක මිනිස්සු.තමුන්නාන්සේලාට මේ ප්‍රශ්න වලට උත්තර හොයන්න ඕන.නමුත් තියෙන හස්ථ මේකෙ ලේකම්වරු කියන වුන්.මේකෙ දැන් පේනවනේ ,ඇමතිවරු ලේකම්වරු කරන වැඩ,පිස්සු කෙලලා,ලස්සනට කරගෙන තියෙන්නේ.ඕක යහපාලනය එපා,මහින්ද චින්තනය එපා,අපිය ඕනේ පුනරුදය කිකලා ආවේ. දැන් පුනරුදය දැක්කනේ.ඒකනිසා ඔබතුමා කරුණාකරලා කියන්න.අපේ මේ සභාවේ මේ සියලුම මේ 18 දෙනාම,එකෙක් දෙන්නෙක් පිස්සු කෙලින්න පුළුවන්.පිස්සු කෙලපුවාවේ,අපට ඒක ප්‍රශ්නයක් නෑ.අපි ජනතා නියෝජිතයෝ.මේ පනත මේ පනත නැත්තන් මේ පනත නැත්තන් අපි මෙතනට ගන්නවද? මේ පනත නැත්තම්.ඒ නිසා කරුණාකරලා ඔබතුමාගේ අපි..... එකහයි,හැබැයි ඔබතුමාට වෙන හස්ත පාවිච්චි කරලා මේ දකුණුපස වම්පස කියලා කතා කරගෙන ආපු ,බෙදීමක් ඉල්ලනවා දැන් අපි බෙදීමක් ඉල්ලනවා.බෙදීමක් ඉල්ලනවා දැන්. අපි දිනන්නත් පුළුවන්,පරදින්නත් පුළුවන්,හැබැයි අපිව ජනතාව එවලා තියෙන්නේ සත්භාවයෙන් තීන්දු ගන්න.මේක ගමේ තියෙන මරණාධාර සමිතියවත් ,ගමේ තියෙන කාන්තා සමිතියවත් නෙමේ.එක්ලක්ෂ දහදාහක් නියෝජනය කරන,වසම් 44 ම නියොජනය කරන.ඒකනිසා ගරු සභාපතිතුමනි ඔබතුමා හස්තවලට අහුවෙන්න එපා.ඔබතුමා බොහොම සත්භාවයෙන් ,ඔබතුමා 1997 ඉඳන් මේ පලාත්පාලනයට උත්සහ කරලා.ඔබතුමා ඒකට වැඩකරපු පුද්ගලයෙක්.අපි ඒක දන්නවා.අද ඔබතුමාට අවස්ථාවක් ලැබිල තියෙනවා.අපේ උපසභාපතිතුමාටත් ඒ අත්දැකීම තියෙනවා.ඒ නිසා කරුණා කරලා,ඔබතුමා අපට මේ දේට විරුද්ධ වෙන්නේ ද්වේශ සහගතව නෙමෙයි,හැබැයි ඔබතුමා විශ්වාස කරනව නම්, ඔබතුමාගේ වම්පස හා දකුණු පස එකයි කියලා,ඒ සියලු දෙනාටම ලැබිය යුතුයි.ඒ නිසා අපි ඔබතුමා ගෙනා ඒ යෝජනාවට බෙදීමක් ඉල්ලනවා ගරු සභාපතිතුමනි

**සභික අයි.එච්.රණවීරමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මට ඇත්තටම මේ වෙලාවේයම් පැහැදිලි කිරිමක් කළ යුතුයි.මොකද අපි සමාජ ක්‍රියාවලියක් ඉදිරියට යන්නේ ගැටලුත් එක්ක.සමාජයේ ගැටලු නැත්නම් සමාජයක් ඉස්සරහට යන් නෑ. ගැටලු වර්ග දෙකක් තියෙනවා.පළවෙනි ගැටුම වර්ගය තමා මිතුරු ගැටුම.පළවෙනි එකට අපි කියනවා මිතුරු ගැටුම කියලා.මිතුරු ගැටුමක් කියන්නේ එක අරමුණක් තියෙන හැබැයි විවිධ ක්‍රියා මාර්ග ගන්නවා.හැබැයි අරමුණ එකයි,හැබැයි ඉස්සරහට වන මාර්ගය වෙනස්.එතකොට ඒ වගේ මිතුරු ගැටුමේ දි අපි ප්‍රශ්න විසඳන්නේ හැම වෙලේම සාකච්චාවෙන් සම්මන්ත්‍රණයෙන්.අන්‍යොයෝන්‍ය අවබෝධයෙන්.එතකොට අපිට පුළුවන් මේක නිසි මාර්ගයට ගන්න.අමුණ එක වුණාට වෙනස් ක්‍රියාමා ්ග තියෙනවා.දැන් උදාහරණයක් ගත්තොත් ගෙදර ඉන්න ළමයෙක් ඉන්න කොට,ළමයට ඕනත් විභාගය පාස් වෙන්න.අම්මා තාත්තා දෙන්නටත් ඕනත් විභාගය පාස් වෙන්න.හැබැයි විභාගය පාස්වෙන්න දරුවා ගන්න ක්‍රියාමාර්ගයි අම්ම තාත්තා ගන්න ක්‍රියාමාර්ගයි අතර වෙනසක් තියෙනවා.සමහරවිට තාත්තා කියනවා ඔයා පාඩම් කරලා නෑ කියලා.(වචන පැහැදිලි නෑ)ඉතිරි කට්ටිය තමයි සතුරු ගැටුම්.සතුරු ගැටුම් කියන්නේ අරමුණු දෙකක් තියෙනවා,අරමුණු දෙක ඔස්සේම කණ්ඩායම් දෙකක් ඉන්නවා.ඒවාගෙත් ප්‍රශ්න විසඳගන්න සාකච්ඡා සම්මන්ත්‍රණයෙන්.අන්‍යොයෝන්‍යඅවබෝධය නෑ.උදාහරණයක් ගත්තොත් හොරෙක් ගෙට පැන්නහම හොරාට ඕන බඩු මුට්ටු ටික අරන් යන්න ඕන.ගෙදර මිනිස්සුන්ට ඕන ඒ ටික බේරගන්න.හැබැයි එතනදී සාකච්ඡා සම්මන්ත්‍රණ නෑ.මහා අවුලක් ක්‍රියාත්මක වෙමින් තියෙන්නේ.එතකොට මිතුරු ගැටුම් හා සතුරු ගැටුම් වර්ග දෙකයි.අපි අදහස් කරන්නේ මේ රටේ ම තියෙන්න ඕන මිතුරු ගැටුම්.තියෙන්න ඕන එකම එක අරමුණයි.එක අරමුණක් ඉෂ්ඨ කරගන්න විවිධාකාර ක්‍රියාමාර්ග ගන්න වෙයි.සාකච්ඡා තර්ක විතර්ක තියෙන්න පුළුවන්.හැබැයි අරමුණ එකයි.මං මේ වෙලාවේ කියන්න කැමතියි අපි මේ එකතු වෙලා ඉන්නේ රට දියුණු කිරීමේ රට ගොඩනැගීමේ එක අරමුණක් වෙනුවෙන්.එතතොට ඒකෙ කැල්ලක් තමයි මේ.මට තියන්න තියෙන වැදගත් දෙයක් තමයි,සමහර ගැටුම් තියෙනවා එක අරමුණක් නෙමේ,එක අරමුණක් වගේ පෙන්නන ගැටලු,එතන අරමුණු එකක් නෙමේ දෙකක්.ඒ ඒ හින්ද හොඳට හඳුන ගන්න ඕන සතුරු ගැටුමක් ද මිතුරු ගැටුමක්ද කියලා.නැත්නම් ලොකු විනාශයක් වෙන්නේ.අපි සභාව මිතුරු ගැටුමක් කරගමු.ඒනිසා අපේ සියලු ගැටුම් මිතුරු ගැටුම් බවට පත්විය යුතුයි.ඒ වගේම මිතුරු ගැටුමක් සේ පෙන්වන සතුරු ගැටුමත් හරියාකාරව හඳුණා ගන්නත් ඕන.අපි මේ සියලු ගැටුම් මිතුරු ගැටුම් බවට පරිවර්තනය කර ගමු කියලා ඉල්ලා සිටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**

ගරු සභාපතිතුමනි,අපි හැමෝටම කතා කරන්න තියෙන තැන තමයි මෙතන.ඇත්තටම අපි විපක්ෂෙ ඉද්දිත් අපට කතා කරන්න තිබ්බෙත් මෙතන තමයි.වෙන කොහෙවත් තැනක් තිබුණ්නෑ.කොහොම වුණත් දැන් අපි සිස්ටම් එක වෙනස් කරන්න තමයි ආවේ.සිස්ටම් එක වෙනස් කරන්න ආවට,අපේ ගරු රණවීර මන්ත්‍රීතුමා කිවුව වගේ මිතුරු ගැටුම හා සතුරු ගැටුම අපි හඳුනාගත යුතුයි.ඒ අනුව අපි ඉදිරියට කටයුතු කරමු.කොහොම උනත් අද අපේ පැත්තෙන් ගත්තොත් අපි හැමෝම සලකන්නේ සභිකයෝ හැටියට.ඔබතුමාගේ දකුණුපස මන්ත්‍රිවරු අඩු වුණා කියලවත් වම්පස මන්ත්‍රිවරු අඩු වුණා කියලවත්,අපි ඇත්තටම බෙදීමක් දෙමු.

**සභාපතිතුමා:-**

අනිවාර්යෙන්ම

**සභිකආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය :-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
යෝජනාව මොකද්ද සභාපතිතුමා?

**සභාපතිතුමා:-**
ඔබතුමාල කිවුව යෝජනාව තමයි.

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම යෝජනා දෙකක එවුවා, හිඳුරංගල.පාසලේ එකක් තිබ්බ යෝජනාවක්.ඒකට මට ලිවුමක් එවල තියෙව ප්‍රාදේශිය සභා විෂය පථයට අදාළ නෑ,ඒක අධ්‍යාපන අමාත්‍යාංශය හරහා වෙන්න ඕන කියලා.මේකත් ගැළපෙ න් නැත්නම් න්‍යාය පත්‍රෙයන් අයින් කර ගමු බෙදීමකට යන් නැතුව.

**සභාපතිතුමා:-xx**
බෑ මන්ත්‍රිතුමා.දැන් බෙදීමක් ඉල්ලා තියෙනවනේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ බෙදීම ඉල්ලන්නේ සුජීව මන්ත්‍රීතුමා කිවුව වගේ මිනිසුන්ට කරන සේවයට හානියක් කරන්න නෙවෙයි.මේ බෙදීම ඉල්ලන්නේ අපට මෙතන විතරයි අවස්ථාව තියෙන්නේ,අපේ ජනතාව වෙනුවෙන් කතා කරන්න.ඒ අවස්ථාව ලබා දෙන්න.අපි ඔබතුමා නයාය පත්‍රයට ඇතුළත් කරන්න කියන යෝජනා ටික ඒක ඇතුළත් කරන්න.ඒ වෙනුවෙන් අවස්ථාව දෙන්න කියලා තමයි මේ බෙදීමෙන් ඉල්ලන්නේ.ඒකෙන් අදහස් කරන්නේ,මේක වැරදියට සමාජගත වෙන්න අවශ්‍ය නෑ.අපි ඉල්ලන්නේ අපේ ජනතාව වෙනුවෙන් කතා කර ගන්න අවස්ථාවක් කරගන්න මේ ආයතනය හදල තියෙන්නේ.ගරු සභාපතිතුමනි අපේ මිනිස්සුන්ගේ ප්‍රශ්න මේ සභාවේ ඉදිරිපත් කරන්න අපට අවස්ථාවක් ඕන.

**සභාපතිතුමා:-**
බෙදිම නිශ්චය කරගමු.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**
ගරු සභාපතිතුමනි, දෙපාරක් නැගිට්ටට සමාවෙන්න.හිඳුරංගල මහපොල්වත්ත ප්‍රාථමික සෞඛ්‍ය ඒකකයේ ගොඩනැගිලි ඉදිකිරීම් හා ඒ සඳහා ආවරණයක් සැකසිම හා ප්ලාස්ටික් පුටු 25 ක් ලබා දීම සඳහා තමයි මේ බෙදීම.මේකෙ අරමුණ අපේ දිලීන් කරුණාපාල මන්ත්‍රිතුමා කිවුව වෙනම එකක්.අපිත් විපක්ෂයේ ඉඳල තියෙනවා.අපිත් බෙදිම් දාල තියෙනවා.සභාපතිවරුත් වෙනස් කරලත් තියෙනවා.සාමාන්‍යෙයන් බෙදීමක් දාන්නේ ඒක දිනන්න පුළුවන්නම් විතරයි.අපිට හොඳාකාරවම ජේනවා අපේ මන්ත්‍රීවරු අඩුයි.නමුත් අපි බෙදිමකට අවස්ථාව දෙමු.

**සභාපතිතුමා:-**
බෙදීමකට යන්.මං නිශ්චිතව කාරණාව කියන්නම්.යෝජනාව තියෙන්නේ සභික එච්.එල්.ජයසේකර මැතිතුමාගේ 6.7. යෝජනාව හිඳුරංගල මහ පොල්වත්ත ප්‍රාථමික සෞඛ්‍ය ඒකක ගොඩනැගිල්ලට ඉදිරියෙන් (20×10)රෝගීන්ට වාඩි වී සිටීම සඳහා ආවරණයක් සැකසිම හා ප්ලාස්ටික් පුටු 25 ක් ලබා දීමට යෝජනාවට පක්ෂව හා විපක්ෂව තමා මේ බෙදීම තියෙන්නේ.විරුද්ධව තමා මේ බෙදීම ඉල්ලන්නේ.මේකට පක්ෂව හා විරුද්ධව මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට අත උස්සල ඡන්දය ප්‍රකාශ කරන්න පුළුවන්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්නමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි යෝජනා කරන්නේ මේ යෝජනාව වැරදියි.හේතුව තමයි,අපි යොජනා කරන්නේ මේක අපේ විෂය පථයට අදාළ නෑ.නැත්තම් සභාපතිතුමා මේක වාර්තාවේ ලියලා වෙනම මතයක් සමාජ ගත කරන්න පුළුවන්.

**සභාපතිතුමා:-**
හරි හරි පැහැදිලියි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්නමැතිතුමා:-**
මේ බෙදීම නිශ්චය වෙන්නේ,අපි බෙදිම ඉල්ලන්නේ විෂයපථයට අදාළ නොවන කාරණා සභාවට දාන යෝජනා සම්බන්ධව,නැතුව මේ(ඝෝෂාව)

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ බෙදිමෙන් පසුව අපි ජයග්‍රහණය කළොත් අපි අපේක්ෂා කරනවා විෂයපථයට අදාළ නැති යෝජනා සභාවට,න්‍යාය පත්‍රයට දාන්න අවස්ථාව දෙන්න කියලා.නේද?

**සභාපතිතුමා:-**
එදා ඒකට උත්තර දුන්නා හරි.මන්ත්‍රි කෙනෙක් ඉල්ලා තියෙනවනේ යෝජනාවක්.ඒ යෝජනාවට විරුද්ධවනේ මේ බෙදීම දාල තියෙන්නේ.ඒකට වෙනම යෝජනාවක් දාන්න ඒ සම්බන්ධව.නිශ්චිත යෝජනාවක් සම්බන්ධව මේ බෙදීම ගෙනැත් තියෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

අපි ඔබතුමාට සංදේශයක් විදිහට ගිය වාරේ ඉදිරිපත් කළා.ඒ පිළිබඳ ඇක්ෂන් එකක් නැනේ.
(ඝෝෂාව)

**සභාපතිතුමා:-**
එදා ඒකට උත්තර දුන්නා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මට විනාඩියක් දෙන්න.මේක

**සභාපතිතුමා:-**
මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.නැත්නම් මේක මේ වැඩේ කරන්න බැනේ,මන්ත්‍රීතුමා.දැන් මේ නිශ්චිතව බෙදීමක් ඉල්ල තියෙනවනේ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
බෙදීමේදී අපි සහයෝගය දෙනවා,මෙතන පැහැදිලි කිරීමක් කරලයි දෙන්න ඕන.නැත්නම් මොකද කියලා දන්නැති නිසා පැහැදිලි කරන්නම්.සමගි බලවේගයේ කණ්ඩායම් නායකයා වශයෙන් මම සහයෝගය දෙන්නේ මේ සභාවේ අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ,ඔබතුමාලගේ බලය නැති කරන්නවත්,අපි බලය බිල්ලට ගන්නවත් නෙමෙයි.මේකේ නිලධාරින් විසින් ගන්නා ලද්දා වූ දැඩි තිරණ,මගෙ එක මේටකෙන් අයින් කරලා තිබුණා,මෙතුමාගේ යෝජනාව දාල මෙතුමාට ලිවුමක් එවල තියෙනවා.
**සභාපතිතුමා:-**
ඒකත් වැරදියිනේ,එතුමා වෙන යෝජනාවක් දාල තිබුණා.මේ පැත්තෙ එහෙම ගත්තෝ ප්‍රතිෂේප වෙච්චා ඊට වැඩියි.හරියට අධ්‍යනය කරොත් මේ ගැත්තෙ අයට ආපු ලිවුම් ටික කිවුවොත් එහෙම ඊට වැඩියි.අභියෝග කරනවා.ඊට වැඩියි.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
මේක ඔබතුමාට පැහැදිලි වෙයි.මොකද මං යෝජනා දෙකක් ඉදිරිපත් කළාම,මගේ පළවැනි එක පාසලේ ප්‍රශ්නය අයින් කරලා මට ලිවුමක් එවනවා.ඒකත් හරි. ඒක වැදගත්.මේක න්‍යාය පත්‍රයේ ඇතුළත් වෙලත් නැනේ.ඇතුළත් නොවී,ලියන නිලධාරීන් මතක තියාගන්නසහාව කරන නිලධාරීන්,අපිට මෙතන ලෙඩ අදින්න නෑ,ඔබතුමියන්ලා මෙතන වැදගත් විදිහට වැඩේ කරන්න.ඒක කෙරිලා නෑ මෙතන.මගේ එක අයින් කරලා තියෙනවා.කෝ මගේ එක.මේකෙ තියෙන එක කරුණාකරලා තේරුම් ගන්න ගරු සභාපතිතුමා.මේක හරි,මෙතුමාටත් ඒ වගේ ලිවුමක් එවලා තියෙනවා.ඒවලා වාර්තාවෙත් ආයෙ සටහන් කරනවා.වර්තාවේ සටහන් නොවුණා නම් මේ කෙ බෙදිමක් එන්නේ නැනේ.ඒ නිසා අපි මීට පස්සේ අපි මේකෙ අපිට ලිවුම් එවල (වචන පැහැදිලි නැ) මේක මෙච්චර දුර යන්නේ නෑ.මේක වාර්තාව සකස් කරන නිලධාරීන්ගේ වැරැද්දක් තියෙන්නේ,(ඝෝෂාව)අපේ සභාවේ අපේ විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුවත්,සභාපතිතුමාවත් ,උපසභාපතිතුමාවත්,මේ දකුණුපස සිටින කණ්ඩායමවත්,වම්පස සිටින කණ්ඩායමවත් විරසක කරන්න ලැස්ති වෙන්න එපා නිලධාරීන්.(ඝෝෂාව)මේ පනත මං හොඳට කියවලා තියෙන්නේ.ඒ නිසා අපිව අපහසුතාවට පත් කරන්න එපා.

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං එවල තියෙන යෝජනා දෙකෙන් එකක් තමයි ඇතුළත් වෙලා තියෙන්නේ.එකක් අයින් කරලා මේකෙ දාල නෑ.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,වරදියට තේරුම් අරන් තියෙන්නේ.මෙයාගේ යෝජනා දාපු එකක් ප්‍රතික්ෂේප කරලා ලිවුමක් එවලා තියෙනවා.ඒක මේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා නෑ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ගරු මන්ත්‍රීතුමන්ලා,මේකෙ 6.7 සභාපතිතුමා මහපොල්වත්ත ව්‍යාපෘතිය මේකටත් ඇතුළත් වෙලා තිබ්ලා.මේකට ඇතුළත් නොකර,මේකෙන් අයින් කරලා තිබුණ නම් මේක එන්නෙ නෑ.,(ඝෝෂාව)මේකෙ ගරු මන්ත්‍රීතුමා මේකෙ න්‍යාය පත්‍රයට ඇතුළත් වෙලා තියෙනවා ඒ යෝජනාව.ඒ යොජනාව ඇතුළත් නොවී තිබුණනම් (ඝෝෂාව)

**සභාපතිතුමා:-**
බෙදීමක් ඉල්ලපු නිසා බෙදීමකට යන්.අත් උත්සලා ඡන්දය දෙන්න.

**සභාපතිතුමා:-**
මං යෝජනාව කියන්නම්,**ජයසේකර මැතිතුමාගේ යෝජනාවක්.හිඳුරංගල මහ පොල්වත්ත ප්‍රාථමික සෞඛ්‍ය ඒකක ගොඩනැගිල්ලට ඉදිරියෙන් (20×10)රෝගීන්ට වාඩි වී සිටීම සඳහා ආවරණයක් සැකසීම හා ප්ලාස්ටික් පුටු 25 ක් ලබා දීම**. ඒ යෝජනාවට බෙදිමක් ඉල්ලලා තියෙනවා.අත් උත්සලා ඡන්දය දෙන්න. ඒ අනුව යෝජනාවට විපක්ෂව ඡන්ද 17 කුත්,පක්ෂව ඡන්ද 12ක් හා ඡන්දය ප්‍රකාශ නොකර ස්වාධිනව සිටීම් 01ද විය.ඒ අනුව 6.7 යෝජනාව වැඩි ඡන්ද 5කින් පරාජයට පත් විය.

**සභාපතිතුමා:-**
එම යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් කරනවා.

**ඒ අනුව සභික එච්.එල්.ජයසේකර මැතිතුමාගේ 6.7.හිඳුරංගල මහ පොල්වත්ත ප්‍රාථමික සෞඛ්‍ය ඒකක ගොඩනැගිල්ලට ඉදිරියෙන් (20×10)රෝගීන්ට වාඩි වී සිටීම සඳහා ආවරණයක් සැකසීම හා ප්ලාස්ටික් පුටු 25 ක් ලබා දීම යෝජනාව සඳහා ඡන්ද විමසීමක් කළ අතර එහිදී පක්ෂව ඡන්ද 12ක් ද විපක්ෂව ඡන්ද 17 ක් ද ඡන්දය දීමෙන් වැලකී සිටීම් 01ක්ද තිබුණු අතර, ඒ අනුව වැඩි ඡන්ද 05 කින් යෝජනාව පරාජයට පත් විය.**

**සභිකපී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ වගේ ගැටලු සභාවේ නිර්මාණය වෙන්නේ,මම යෝජනා කරනවා මේ මන්ත්‍රීවරු ගේන යොජනා මොකක් හරි ලිස්ට් එකක් කරා නම්,ඒවා බලලා මේ යෝජනා දාන්න පුළුවන්.අර මන්ත්‍රීතුමියත් දාල තියෙනවා මාත් දාල තියෙනවා,සුමිත් මන්ත්‍රිතුමත් දාල තියෙනවා එකම යෝජනාව.එකම දාල තියෙනවා.එතකොට මේ සභාවේ කාලයත් අපතේ යනවා.මේ ලියකිවිලි වලට යන කාලෙත් අපරාදේ.රෙජිස්ටර් එකක් දාන්න.මම යෝජනාවක් දානව නම් ඒ යෝජනා බලලා,ඒක දාල තියෙනව නම් දාන් නෑ.එතකොට ප්‍රායෝගිකව සට්ටනයක් ඇති වෙන්නෑ.අපි ගේන යෝජනා ටික රෙජිස්ටර් කරන්න.තව කෙනෙක් බලල ඒ යෝජනාව දාන් නෑ එතකොට.එතකොට ගැටලුවක් වෙන්නේ නෑ.

**සභිකජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම මේ කාරණේදී පක්ෂව හෝ විපක්ෂව ඡන්දය පාවිච්චි කළේ නෑ.මම පැහැදිලිව දකිනවා මේකෙ ප්‍රශ්නෙ තියෙන්නේ,මේක හරි විදිහට අවබොධ කර ගත්තෙ නැති විදිහක් මට දැනෙන්නේ.සමහරවිට එතුමගෙ යෝජනාව සම්බන්ධව මේ ගොල්ලො කතා කරපු කාරණේදී මතු වෙච්ච කාරණා වෙලාව ඉතුරු කරගන්න ඕන නිසා,ඔබතුමා හා මේ විපක්ෂයේ ඒ සම්බන්ධව වෙනම සාකච්ඡාවක් හරි අරගෙන සාකච්ඡා කරන්න. එතකොට මේ ප්‍රශ්නෙට හරි උත්තරය එයි.එහෙම නැතුව මේක උඩින් පල්ලෙන් අතගාල විසඳගන්න පුළුවන් ප්‍රශ්නයක් තමයි මෙතන කතා වුණේ කියලා තමයි මට පුද්ගලිකව හැඟීම.ඒනිසා මම දෙපැත්තෙන් එක පැත්තකටවත් නැතුව මම ස්වාධීන වුණා.ඒක තමා මගේ අදහස.ඒක ඔබතුමා මේක වෙනම STUDY කරන්න.එතකොට මේකෙ අරමුණ පැහැදිලි කරගන්න පුළුවන් වෙයි.අරමුණ මොකද්ද කියලා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, (පැහැදිලි නෑ සෝෂාව) අපි මේකට ඔබතුමා සඳහන් කල විදියට දකුණු පස හා වම්පස ඒ යෝජනාවට විරුද්ධව නෑ,සභා රීති හා පනත අනුව ක්‍රියාත්මක විය යුතු ආකාර අනුව විතරයි අපි අපේ විරෝධතා ප්‍රකාශ කරලා තියෙන්නේ මෙතන.ඒකත් එක්කම මම යෝජනා කරලා තියෙනවා අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදි කිරීම හා පවතින පුස්තකාලය ,පාඨකයින්ගේ යෝජනා අදහස් සැලකිල්ලට ගෙනපරිශීලනය කිරීමට වැඩපිළිවෙලක් සැකසීම.එතනදී මට ලිවුමක් එවලා තියෙනවා,එම ස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදි කළ නොහැක. මේක ක්‍රියාත්මක කරන්න බැනේ.ඉතුරු අනෙක් ටික ක්‍රියාත්මක කරන්න පුළුවන්නේ. මට ඒ සඳහා ප්‍රෙවිශයක් ඕන.මට මතකයි අපි පාඨක සමාජ ඇති කරලා විශාල කාර්ය භාර්යක් කළා.ඒකට අවශ්‍ය ප්‍රෙවිශය ලබා දෙන්න.

**සභාපතිතුමා:-**
ඊ ළඟට සභික සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණියගේ ගේ 6.8. යෝජනාව.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චිමැතිණියගේ යෝජනාව:-**
ගරු සභාපතිතුමනි,
**6.8.කොහිලකන්ද මාර්ගය පලීගල දක්වා සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.(ප්‍රතිලාභීන් 500)**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමාමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චිමැතිණියගේ යෝජනාව:-**
ගරු සභාපතිතුමනි, කොහිල කන්ද මාර්ගය කියන්නේ (වචන ඇහෙන් නැති නිසා පැහැදිලි නැ) මේක අබලන් තත්ත්වයේ පසු වෙනවා.එය බුළුගහපිටිය පලිගල මාර්ගය දක්වා,ඇහැලියගොඩ ප්‍රධාන මාර්ගයක් දක්වාත් දිවෙන මාර්ගයක්.එම නිසා ඒක සංවර්ධනය කරන්න කියලා මං යෝජනා කරනවා.

**සභිකපී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,චමිලා මන්ත්‍රීතුමිය විසින් ගෙනා යෝජනාව කාලොචිත ප්‍රශ්නයක්.මන්ත්‍රීතුමිය කියූ මාර්ගය ඇවිල්ලා ගොඩක් එහි දුප්පත් ජනතාවක් තමයි ජීවත් වෙන්නේ.හදිසියේ ලෙඩක් දුකක් හැදුණත් එන්න පාර අමාරුයි. සාමාන්‍යෙයන් ඕක නැදුරනින් ගියත් යන්න අපහසුයි.ගොඩක් අය දන්නවා.මම හිතනවා ඒ කටයුත්තතට මු ල් තැන දීලා ක්‍රියා කරයි කියලා,මගේ ලොකු බලාපොරෝතුවක් හා විශ්වාසයක් තියෙනවා.

ඒ අනුව සභික සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණියගේ 6.8. කොහිලකන්ද මාර්ගය පලීගල දක්වා සංවර්ධනය කිරීම (ප්‍රතිලාභීන් 500) යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
බොහොම ස්තුතියි.ඊ ළඟට සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණියගේ ගේ 6.9. යෝජනාව.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චිමැතිණියගේ යෝජනාව:-**
ගරු සභාපතිතුමනි,

**(6.9.දෙල්ගහකුඹුර අසල පි.ඩබ්ලිව්.විමලසිරි මහතාගේ නිවස අසල සිට ගම මැද වෙල පාර ගොඩේදෙනිය හරහා මීටිපොල මාර්ගයට ප්‍රවේශය දක්වා පැති බැමි 02 ,පෙට්ටි බෝක්කු 03,ඇතුළත්ව මාර්ගය සංවර්ධනය කිරීම.(ප්‍රතිලාභීන් 550)**

**සභික එච්.එස්.එල්.දීපාල්මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චිමැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මේ යෝජනාව කිරිපෝරුව වසම තුළ ගමේ ඇතුළට යන ප්‍රධාන මාර්ගයක්.මේක අබලන් තත්ත්වයෙන් පසු වෙනවා.ගම මැද පාර සමඟ මීටිපොල මාර්ගයට යන්නත් පුළුවන් මීන්නාන,ගැටහැත්ත,අවිස්සාවේල්ල පැත්තට යන්න පුළුවන්.ප්‍රධාන මාර්ගය ආපදා තත්ත්වයක් ඇති වුණෝත් දම්මුල්ල සිරිසමන්පුරට යන්නත් පුළුවන් මේ මාර්ගයෙන්.මේක සංවර්ධනය කිරීමට මං සභාවට යෝජනා කරනවා.

ඒ අනුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණියගේ ගේ 6.9. දෙල්ගහකුඹුර අසල පි.ඩබ්ලිව්.විමලසිරි මහතාගේ නිවස අසල සිට ගම මැද වෙල පාර ගොඩේදෙනිය හරහා මීටිපොල මාර්ගයට ප්‍රවේශය දක්වා පැති බැමි 02 ,පෙට්ටි බෝක්කු 03,ඇතුළත්ව මාර්ගය සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(ප්‍රතිලාභීන් 550)

**සභාපතිතුමා:-**
ඊ ළඟට සභික සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණියගේ ගේ 6.10. යෝජනාව.
**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,
**6.10.මීටිපොල පන්විල මාර්ගයේ ඩී.අජිත් වීරතුංග මහතාගේ වත්ත අසල සිට මාර්ගය සංවර්ධනය කිරීම මම යෝජනා කරමි.(ප්‍රතිලාභීන්-575කි)**

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මේ යෝජනාවට අපේ ග්‍රාමීය සංවර්ධන යෝජනා යටතේ ප්‍රමුඛතාව ලබාගෙන තියෙන යෝජනාවක්.ඉතින් පන්විල මාර්ගයේ ඉතා අබලන් තත්ත්වයෙන් පසු වෙන මාර්ගයක්.ඡායා රූප සහිතව ප්‍රදේවාසීන් තමයි ඉදිරිපත් කරලා මේ පාර ප්‍රතිසංස්කරණය කර ගැනිමට ඉල්ලීමක් කරලාතියෙනවා.ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා ප්‍රදේශවාසීන්ගේ අවශ්‍යතාව සපුරා දෙන්න. මොකද ඒ කෙ ආර්ථික වශයෙනුත් වාසි තියෙන තේ දළු ප්‍රවාහනය කරන මාර්ගයක්.මෙම මාර්ගය සංවර්ධනය කළ යුතු යැයි මම යෝජනා කරනවා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ චමිලා මන්ත්‍රීතුමිය කියපු පාර අත්‍යවශ්‍ය පාරක්.මොකද ඒක වැවිල ගැටහැත්ත ප්‍රධාන මාර්ගයට පිවිසුම් මාර්ගයක් ලෙස මීටිපොල ඉදලා යොමුවෙලා තියෙන පාරක්.ඒක මම දන්න විදිහට මීටිපොල පාරක්.ඕක ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවේ අපේ මේධාලංකාර හාමුදුරුවෝ ඉන්නකොට කොටස් කීපයක්ම සංවර්ධනය කරලා තිබුණා.හැබැයි ඒකේ එක කොටසක් නම් ඒ සංවර්ධනය කිරීමේ දී තිබ්බ්ච අඩුපාඩු නිසා,මං හිතන්නේ වැලිද කොහෙද දාලා තියෙන්නේ.ඒ පාර විනාශ වෙලා ගියා.අපරාදෙ සල්ලි.මොකද මේ වෙන කොටත් ඒක හරියට කළා නම් මේ පාර හදන්න තියෙන පාරක් නෙමේ.ඒ නිසා මම කියන්නේ නැවත මේවා ප්‍රතිසංස්කරණය කරන කොට මං හිතන්නේ දැන් නම් අපි නව රජය විසින් සම්පූර්ණම ඒ ගැන සොයලා බලලා කොන්ත්‍රාත්කරුවන්ට ඕන ඕන විදිහට වැඩ කරන්න දෙන්නේ නෑ දැන්.මොකද දැන් අපි කීපයක් ම මේ වෙනකොට කරලා තියෙනවා.ඕන කෙනෙකුට ගිහින් බලන්න පුළුවන්.ඉතා ඉහල ප්‍රමිතියෙන් යුතුව ඒ සංවර්ධන කටයුතු කරලා තියෙනවා.එම නිසා මෙම පාරේ සංවර්ධන කටයුතු කරද්දී පසුගිය කාලේ වගේ නැතුව ඒ සංවර්ධනවලට යොදන මුදල් අපතේ නොයන විදිහට,මොකද අපි හොඳා කාරව දන්න නිසා ඒ මුදල් අපතේ ගියා.කොටි ගනන් අපතේ ගියා.ඒ නිසා මේ පාර සංවර්ධනය කිරීමට සුදුසු පාරක් කියලා මමත් යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සෙනරත් මන්ත්‍රිතුමා ගෙන් චෝදනාවක් තියෙනවා,පසුගිය රජය සංවර්ධනය කරලා හරියට නෑ කියලා,එතකොට ඔබතුමා නිදාගෙනද දන්නෑ හිටියේ.ගමේ වැසියෙක් විදිහට පාරක් හදනකොට ඒක

කොහොමද හදන්නේ ප්‍රමිතියෙන් හදනවද නැද්ද කියලා අධුගානේ,එ වෙලාවේ චෝදනා කරන්න අවස්ථාව තියෙනවා.අපිත් එහෙම කළා.අපේ ව්‍යාපාතිවල අඩුපාඩු තියෙනව නම් අපි ඒ අදාළ ස්ථානවලට අඩුපාඩු දන්වලා ලිවුම් කැල්ලක් හරි යවලා තියෙනවා.මං දන්නෑ ඔබතුමා මෙතන ඇවිල්ල කතා කළාට වැඩක් නෑ.ඒකාලේ ඇක්ෂන් එකක් ගත්තද නැද්ද කියලා.දැන් මේ පරණ ආණ්ඩුවලට චෝදනා කර කරා කොන්ත්‍රාත් කරයෝ අල්ලගෙන අරක කරා හොඳ නෑ මේක කරා හොඳ නෑ කියන එක නෙමේවැදගත් වෙන්නේ.මේක හරියට කරන එක.තාමත් අර පරණ ක්‍රමයෙම යන්න උත්සහ කරනවා.ඇඟිල්ල දික් කරනවා.බොරු කියනවා.අනේ මං දන්නෑ.ඒක මේ සභාවට ගේන්න එපා කරුණා කරලා.පහුගිය ආණ්ඩුවලට චෝදනා කරන ඒවාවයි,වැරදි තියෙනවා.වැරදි නැත්තන් ආණ්ඩුවක් පෙරලෙන්නේ නෑනේ.අනිවාර්යෙන් වැරදි තියෙනවා.අඩුපාඩු තියෙනවා.ඒකයි ආණ්ඩු පෙරළුනේ.මේ අවුරුදු 5 දී මේ ආණ්ඩුවෙත් වැරදි තිබුණ් නැත්තන් තව අවුරුදු 5 ක් ඉදිවී.හැබැයි මේකෙ අඩුපාඩු තිබ්බොත් වැරදි තිබ්බොත් තව අවුරුදු 5 න් වෙන ආණ්ඩුවක් ගන්නවා.දැන් සිස්ටම් එක වෙනස් කරන්න.මෙහෙම ඇවිත් ආයේ ඒකම කියලා වැඩක් නෑ.තේරුමක් නෑ..අපි අලුත් විදිහට කරමු.මේ යෝජනාව හොඳයි.ඉතින් හරියට කරන්න අඩුපාඩු හදාගෙන.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම අපි මේ යෝජනාවට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා.අපේ දිලීන් මන්ත්‍රීතුමා කිවුව වගේ අපේ ගරු මන්ත්‍රීතුමා,අපට එල්ලාවල මේධාලංකාර හාමුදුරුවන්ලේ වැඩසටහන්වලට ඇවිල්ල,හොඳට වැඩ කරපු මිනිස්සු.අපි කාපට් කළා.එතකොට ඒකටත් පොඩි ගෞරවයක් දෙන්න ඕන.මොකද එල්ලාවල මේධාලංකාර හාමුදුරුවෝ නිසා තමයි ඔබතුමාගේ පාර කාපට් වුනේ.ඒ කාපට් එකේ ගැටලුඹවක් නැනේ ගරු මන්ත්‍රීතුමා.එතකොට මේ පොඩි අඩුපාඩුවක් අල්ලගෙන කතා කරන්න එපා.ඒකනේ අපි හිටියේ 152.ඔබතුමන්ලා හිටියේ 3 නේ. තුන 159 වුණා.152 ක 3 වුණා.ඉතින් අපේ අඩුපාඩු නිසානේ.අපි අඩුපාඩු පිළි ගන්නවා.හැබැයි මේ අඩුපාඩු අපි ක්‍රමක් ක්‍රමයෙන් මේ සභාවේ ඉදන් හදාගෙන යනවා.ඒ නිසා මේ පරණ කතා කිය කියා වුන් වෙන්න හදන්න එපා.ඔබතුමත් පුනරුදය කියන ගරු සභාපතිතුමාගේ සංකල්පය ක්‍රියාත්මක කරන්න.එච්චරයි.

**සභික පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ පාර යෝජනාව චමිලා මන්ත්‍රීතුමිය ගෙනා යෝජනා ව මමත් දාල තියෙනවා 6.63 විදිහට.මීටිපොල පන්විල පාර මරුකන්ද දක්වා සුදුසු පරිදි සංවර්ධනය කිරීම කියලා.ඒකම තමයි සභාපතිතුමනි.ඉතින් මම යෝජනා කරනවා ඒකෙ කොස්හේන,නාපාවල ඒ ගොල්ලන්ට ළඟම පාර ඇහැලියගොඩට එන්න තියෙන ළඟම පාර තමයි මේ මාර්ගය.ඇත්තතෙන්ම ගරු සභාපතිතුමනි මේකෙ පාසල් ළමුන් සාමාන්‍යයෙන් 100 ක් 150ක් 200ක් පමණ යනවා.ඇත්තෙන්ම සාමාන්‍යයෙන් මීටිපොල පන්සල හරියේ ගරු සභාපතිතුමනි ඇත්තටම(වචනය පැහැදිලි නැත)පොඩ්ඩක් එහාට වුණාහම වැහි කාලටය යන්න බෑ පාසල් ළමුන් එරෙනවා.ත්‍රීවිල් එකක්වත් යන්න බෑ.එකයි හෝ දෙකයි මං හිතන්නේ හයර් යන්නේ.අනිත් ඒවා එක වීල් එකක්වත් යන්නෑ.ඉතින් ගරු සභාපතිතුමනි මං යෝජනාවක් දාන්නෙත් මන්ත්‍රීතුමිය දාපු ප්‍රාදේශිය සභාවේ හෝ අපට විමධ්‍යගත මුදල් නැත්නම් එක්කෝ පළාත් සභාවට හෝ මධ්‍යම රජයට මේක යෝජනා කරලා ඉතා කඩිනමින් මේ මාර්ගය අලුත් වැඩියා කර දෙන මෙන් මමත් ඉල්ලා සිටිනවා.මොකද මේ යෝජනාවට නැවත වාරයක් මමත් කාලය ගන්න අවශ්‍ය නෑ.මොකද මෙතුමිය විසින් අරන් තියෙන නිසා.මම ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා මෙ ඉතා කඩිනමින් කරලා දෙන්න කියලා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒත් එක්කම ඒ මාර්ගය සංවර්ධනය කරන්න හැකියාවක් තියෙනව නම් නාය අවධානමට ලක් වෙනවා.කොස්හේන,මාපොට දම්මුල්ල මාර්ගයට අයත් අතුරු මාර්ගය.මං හිතන්නේ ප්‍රධාන මාර්ග නාය අවධානමට දැඩිව ලක්වෙන ප්‍රදේශයක්.මේක විකල්ප මාර්ගයක් ලෙස ප්‍රයෝජනයට ගන්න පුළුවන් සුවිශේෂී මාර්ගයක් බවට පරිවර්තනය කර ගන්න පුළුවන්නම් මේ මාර්ගය සංවර්ධනය කර ගන්න පුළුවන්.බොහොම ස්තුතියි.

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මීටිපොල පන්විල මරුකන්ද පාර එකපැත්තකින් අවිස්සාවේල්ලටත් සම්බන්ධ වෙනවා.අනිත් පැත්තෙන් ඉංගිරියට ,හොරණ මාර්ගයට සම්බන්ධ වෙනවා.ඇත්තටම පිවිසුම් මාර්ගයක් විදිහට තමා මේක තියෙන්නේ.අජිත් වීරතුංග මහතාගේ නිවස වත්ත අසල සිට නෙමේ තව ඊට මෙහා තව තියෙනවා.මඩවෙලා එරලා යන්න බැරි ටිකක්.අන්න ඒ ටිකත් එක්කල එකතු කරලා ගන්නව නම් හොඳයි කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව සභික සභික එස්.ඒ.ටී.එස්.චමිලා සුරිආරච්චි මැතිණියගේ ගේ 6.10 මීටිපොල පන්විල මාර්ගයේ ඩී. අජිත් වීරතුංග මහතාගේ වත්ත අසල සිට මාර්ගය සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (ප්‍රතිලාභීන්-575කි)

**සභාපතිතුමා:-**

ඔව් බොහොම ස්තුතියි. සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණියගේ ගේ 6.11. යෝජනාව.

**සභික ඩී.ගයනී බුද්ධිකාමැතිණිය:-**
ගරු සභාපතිතුමනි,
**6.11.බෝපැත්ත සුසාන භූමියේ ගොඩනැගිලි වහලය අලුත්වැඩියා කිරීමට යෝජනා කරනවා.**

**සභිකපී.එම්.චන්ද්‍රදාසමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,බොපැත්ත සුසාන භූමියේ ඉඩම් ප්‍රමාණය දැඩි කැලෑබද ප්‍රදේශයක් බවට පත්වෙලා තියෙනවා මේ වෙන කොට.මං හිතන්නේ මේක අපිටපමත් ද්‍රව්‍ය භාවිතා කරන ප්‍රදේශයක් බවට පත්වෙලා තියෙනවා. දැඩි ම අඳුරුම ප්‍රදේශයක්,රාත්‍රිකාලයේ කිස්ම විදුලි ආලොකයක් නැති අඳුරු ප්‍රදේශයක් බවට පත්වෙලා තියෙනවා මේ භූමි ප්‍රදේශය.ඉතින් ඒවගේම තමයි හදල තියෙන ආදාහනාගාරයඒ නිවසෙ වහලය කඩා වැටිලා.ගරා වැටිලා තියෙනවා.ඒක නිසා මං හිතන්නේ අත්‍යවශ්‍ය කාරනාවක් බවට පත්වෙලා තියෙනවා බොපැත්ත සුසාන භූමිය සහ ගෙය ආදාහනාගාරය අලුත්වැඩියා කරදීම.එහිදී අපට යෝජනාවක් ඇවිත් තියෙනවා බෝපැත්ත කොට්ඨාශයේ මිතුරු හවුල,ඒ වගේ සමිති සමාගම්වලින් යෝජනාවක් ඇවිත් තියෙනවා මේක පිළිසකරකරලා දීලා කැලෑ ප්‍රදේශ එළි කරලා දුන්නොත් මූල්‍ය ප්‍රතිපාදනයක් සමඟින්,ඉන් ඉදිරියට ඒ අය අනිවාර්යෙන් ම නඩත්තු කර ගැනිමේ සියලු කටයුතු ඉදිරියේදී ගම්මුන් කරගෙන යන බව.ප්‍රාදේශිය සභාවට කිසිම බර පැනක් දරන්න නැති තත්වයෙන්.ඒ නිසා මම ඉතාමත්ම ඒ ගමේ කොට්ඨාශයේ මන්ත්‍රී විදිහටත් ඉල්ලීමක් කරනවා ඒ සමිති සමාගම් කරපු ඉල්ලීම ඔවුන් නඩත්තු කරගෙන යනවා නම් ඉදිරියට මුලික අඩිතාලම ප්‍රාදේශි සභාව විදිහට දාල සකසලා දීම මං හිතන්නේ යෝග්‍යයි කියලා.

**සභිකපී.එම්.චන්ද්‍රදාසමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එතුමිය ගෙනා යෝජනාවට දිගුවක් විදිහට මම ඉදිරිපත් කරන්න කැමතියි.මොකද අපි දේශපාලන වශයෙන් බෙදිල හිටියත් අවසානයේ ඔය සුසාන භූමිය තුළ තමයි එකට නිදා ගන්න වෙන්නේ.ඒක බොපැත්ත පොදු සුසාන භූමිය.අපි ඔය සම්බන්ධව කතා කරා ප්‍රාදේශිය සභාවට බරක් වෙන්නේ නැතුව මේ කටයුත්ත සිදු කිරීමට කටයුතු අපි සාකච්ඡා කරමින් තියෙන්නේ.නමුත් ඒ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක් කාලෝචිතව සිදු විය යුතු දෙයක් බව මම ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම හිතන්නේ එතුමියගේ යෝජනාවට තාක්ෂණික නිලධාරී කෙනෙක් සම්බන්ධ කරලා දෙන්න (වචන පැහැදිලි)එම යෝජනාව කඩිනමින් කරලා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**සභිකආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණිය:-**
ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව ගොඩක් වටින යෝජනාවක්.මම හිතන්නේ එතනින් හැම වෙලේම ගමන් කරන්නේ මම.දැන් ඒ එතන කැලෑ බෝ වෙලා තියෙන හින්දා එතන කනත්තේ ඒ සුසාන භූමි ගොඩනැගිල්ලේ ඇත්තටම කුඩු ගහන අය තමයි ගොඩක්ම ඇදිලා එන්නේ.මං දන්නවා හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රීතුමා දිසානායක අපේ ඒ ප්‍රදේශයේ හොඳට සුද්ද පවිත්‍ර කරලා හැදුවා.නැවත ආපහු කැලේ බෝවෙලා තියෙනවා.ඒ යෝජනාවත් මම යෝජනා කරනවා ඒ හන්දියට අලුතින් ලයිට් එකක් දාන්න පුළුවන්නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණියගේ ගේ 6.11.බෝපැත්තසුසාන භූමියේ ගොඩනැගිලි වහලය අලුත්වැඩියා කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණියගේ ගේ 6.12. යෝජනාව.
**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,
**6.12.බෝපැත්ත ට්‍රාන්ස්ෆෝමරය අසල පොදු ළිඳ සංවර්ධනය කිරීමට මම යෝජනා කරනවා.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,බෝපැත්ත ට්‍රාන්ස්ෆෝමරය අසල පොදු ළිඳ කියන්නේ,අපේ බොපැත්ත කොට්ඨාශයවර්ෂාවක් නැති කාලයේදී මං හිතන්නේ පවුල් 400 ක් පමණ භාවිතා කරන ළිඳක්.අවුරුදු 65 ක් 70 ක් එහාට ගිය පොදු ළිඳක් ට්‍රාන්ස්ෆෝමරය අසල පොදු ළිඳ.මං හිතන්නේ අපට ජලය ලබා දෙන ජල සම්පාදනය ලබා දෙන්න තව ක්‍රමය හදා ගෙන යන අවස්ථාවක් මේ වකවානුව.මං හිතන්නේ මේ පොදු ළිඳ සංවර්ධනය කරලා දීලා,සියලු දෙනාටම භාවිතා කරන්න අවස්ථාවක් හදලා දෙන්න.මොකද සියලු දේවල් කඩා වැටිලා තියෙන තත්ත්වයක් නිසා.ඒ ළඳ භාවිතා කරන අය ඉන්නවා.ආර්ථික අපහසුතා තියෙන මිනිස්සු නඩත්තු කර ගන්න,තියෙන තත්ත්වය අනුව නඩත්තු කරගන්න අපහසුතාවක් තියෙනවා.ඉතින් මංහිතන්නේ වර්ෂාව අපට

නැති කාලයක් ඉදිරියට එන නිසා එය නඩත්තු කරලා සකසලා දෙනව නම් පවුල් ඒකක 400 ක් 450 ක් විතර භාවිතා කරන නිසා, මං හිතන්නේ සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණියගේ ගේ 6.12.බෝපැත්ත ට්‍රාන්ස්ෆෝමරය අසල පොදු ළිඳ සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණියගේ 6.13. යෝජනාව.
**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,
**6.13.කන්දෙවත්ත මාර්ගය සංවර්ධනය කිරිමට මම යෝජනා කරනවා. (දිද්ද).**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,කන්දෙවත්ත මාර්ගය කියන්නේ දිද්ද ප්‍රදේශයට අයත් මාර්ගයක්.මං හිතන්නේ ඒ මාර්ගය භාවිතා කරන අය මට අත්සන් ලේඛනයක් පවා ලබා දීලා තියෙනවා,මේ පාර සංවර්ධනය කරලා දෙන්න කියලා.ඒ නිසා මොකද තේවතු සඳහාත් යොදා ගන්න මාර්ගයක් වෙලා තිබෙනවා.තේ දළු නෙළීම සඳහා මං හිතන්නේ ආර්ථික වටිනාකමක් වගේම ජලය රැදී පවතිනකොට ඒ අවට නිවාසවල මිදූල ජලය ගලා යනවා,පාර හා කාණු පද්ධතිය සකසා නැති නිසා.කිසි දවසක නඩත්තු නොවිච්ච දෙයක් නිසා.මං හිතනවා ඒ සඳහා අවධානය යොමු කරලා දෙන ලෙස මම යෝජනා කරනවා ගරු සභාවට.

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ මාර්ග අපේ ගමට අල්ලපු ගමේ මාර්ගයක්.මේ මන්ත්‍රීතුමිය ප්‍රකාශ කර පරිදි වතු විහාල ප්‍රමාණයක් තියෙවා.ඒ පැත්තේ ළමයි වර්ෂා කාලයේදිත් ඉස්කෝලෙ යන්නේ බොහොම අපහසුවෙන්.එම නිසා මෙම මාර්ගය පිළිසකර කර දිම කඩිනමින් සංවර්ධනය කළ යුතු කාර්යක් විදිහට යෝජනා කරනවා.

ඒ අනුව සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණියගේ 6.13.කන්දෙවත්ත මාර්ගය සංවර්ධනය කිරිම (දිද්ද) යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකකේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමාගේ6.14. යෝජනාව.
**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.14.බ/කරඳන ගෙපල ගෙදර සිට කාණුග්ගල්ල පාම්වත්ත දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරිමට මම යෝජනා කරමි.**

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම මාර්ගය ග්‍රාමීය ජනතාව ප්‍රවාහන කටයුතුවලට භාවිතා කරනවට අමතරව මෙම මාර්ගය කුඹුරු යායක් වටා තියෙන පාරක්.එම නිසා මෙම මාර්ගය කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගන්නවා.ග්‍රාමීය සංවර්ධනය නගා සිටුවීමේ දී මූලිකවම කෘෂිකර්මයේදී මේ පාර ඉතාම වැදගත් වෙනවා.මොකද කුඹුරුවලට අත් ට්‍රැක්ටර් රැගෙන යාමටත්, ඒ වගේම තේ දළු ප්‍රවාහනය කිරීමටත් මේ මාර්ගය භාවිතා කරනවා.මේ මාර්ගයේ කොටස් කිපයක් හදලා තියෙනවා.තව කොටස් දෙකක් හදන්න තියෙනවා.ඉතින් මං යෝජනා කරනවා ඒ මාර්ගය කඩිනමින් සංවර්ධනය කරලා දෙන්න කියලා.

ඒ අනුව සභිකකේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමාගේ6.14.බ/කරඳන ගෙපල ගෙදර සිට කාණුග්ගල්ල පාම්වත්ත දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකකේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමාගේ6.15. යෝජනාව.

**සභිකකේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.15.අජිත් ඒකනායක මහතාගේ නිවස අසල සිට කේ.කේ.ලාල් රංජිත් මහතාගේ නිවස දක්වා ඇති අබලන් වී ඇති කොටස (ගම්මැද පාර)සංවර්ධනය කිරිමට මම යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මෙම මාර්ගය සිරිසමන්පුර ප්‍රාථමික විද්‍යාලයට සිසුදරු දැරියන් යාමට ඒමට යොදාගනු ලබන ප්‍රධාන මාර්ගය මේ මාර්ගයයි.මෙම මාර්ගයේ නොන්ක්‍රීට් නොදා මඩ ගොහොරු සහිත මාර්ග කොටසක් තියෙනවා. වැසි සහිත කාලවලදී පාසල් ළමුන්ට ගමන් කිරිම මහත් ගැටලුවකට පත් වෙනවා.ඊට අමතරව හිඳුරංගල සිරිසමන්පුර වික්‍රමකන්ද යන ගම්මානවල ජනතාව මෙම මාර්ගය ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නවා.ඉතින් මම යෝජනා කරනවා මෙම මාර්ගයට ප්‍රමුඛතාවක් ලබා දී කළ යුතුයි කියලා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම මාර්ගය එතුමා කියපු අදහස් ඒකමතිකව අනුමත කරන අතර ආර්ථික වශයෙන් විශාල ප්‍රතිලාභ ළඟා කර ගන්න පුළුවන් මාර්ගයක් බවට සංවර්ධනය කළොත්,හිඳුරංගල පැත්තටත් සිරිසමන්පුර පැත්තටත් සම්බන්ධ වෙනවා.ඒ එක්කම පාසල් ළමුන්ට පයින් ගමන් කරන්න බැරි ස්ථාන කීපටක්ම තියෙනවා ඒ මාර්ගය තුළ.වැසි කාලවලදී දැඩි දුෂ්කර තාවයන්ට ලක් වෙනවා.අනිත් එක ප්‍රදේශයේ පාසල් අතර ,දුෂ්කරතා තිබුණත් ඉහළ ප්‍රතිඵල පෙන්වන පාසලක්.එමනිසා එයට ප්‍රමුඛත්වය දීම කාලෝචිතයි කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමාගේ6.15. අජිත් ඒකනායක මහතාගේ නිවස අසල සිට කේ.කේ.ලාල් රංජිත් මහතාගේ නිවස දක්වා ඇති අබලන් වී ඇති කොටස (ගම්මැද පාර)සංවර්ධනය කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකකේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමාගේ6.16. යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.16.දකුණු කරඳන ට්‍රොස්ලි වත්ත මාර්ගය ප්‍රාථමික විදුහල ලඟ සිට ඉදිරියට සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම මාර්ගය අපේ ප්‍රදේශය බොහෝ විට ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශයක්.ආපදා කලාපයක් බවට පත් වෙච්ච ප්‍රදේශයක්.මෙම මාර්ගයේ මුල කොටස කොන්ක්‍රීට් කර සකස් කරලා තියෙනවා.තව ඉදිරියටත් කොටසක් තියෙනවා.මඩවගුරු සහිත තැන්.කරඳන කණිෂ්ඨ විදුහල අසල සිට ඉදිරියට. ගංවතුර කාල වලදී කරඳන පාලම අසල මාර්ගය යටවෙන අවස්ථාවලදී මෙම මාර්ගය විකල්ප මාර්ගයක් වශයෙන් පැලවත්ත හන්දියෙන් මඩල මාර්ගයට සම්බන්ධ කර ගැනීමට භාවිතා වෙනවා.ඉතින් ඒ කටයුතු නිසා ගම්වාසීන්ගේ යහපත පිණිසත් එම පාසලට ගමන් කිරිමටත් ,ඒ වගේම කරඳනට ආසන්නම මාර්ගයක්. මෙම කරුණු ගැන සලකා බලලා එම මාර්ගය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභිකකේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමාගේ6.16.දකුණු කරඳන ට්‍රොස්ලි වත්ත මාර්ගය ප්‍රාථමික විදුහල ලඟ සිට ඉදිරියට සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකඑස්.එම්.සුමිත්‍රා සේනානායක මැණිකේ මැතිණියගේ6.17. යෝජනාව.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සුමිත්‍රා මන්ත්‍රීතුමිය අද දින නිවාඩු අනුමත කරගෙන ඇති බැවින් එම යෝජනාව මා විසින් සභාවට ඉදිරිපත් කරනවා.
**6.17.මාහර ස්වර්ණ ජයන්ති විද්‍යාලයට යන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි..**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම ස්වර්ණ ජයන්ති විද්‍යාලයට යන පාර,ගෙවල් 9 ක් තියෙනවා.ඊට අමතරව තව කෘෂිකාර්මික ඉඩම් තියෙනවා.ඒ නිසා මේ මාර්ගය පිළිසකර කිරීම අපට ආර්ථික වශයෙන් ගොඩක් වැදගත් යෝජනාවක් කියලා මං යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒකට තව පොඩ්ඩක් එකතු කරන්න ඕන.අපට කලින් කර ගන්න බැරි වෙච්ච වැඩක්.මං හිතන්නේ ඒ මාර්ගය ආරම්භ වෙන තැන මං හිතන්නේ කුළුණු දෙකක් තියෙනවා.මං දන්නෑ පුරාවිද්‍යාත්මකද කියලා.මන්ත්‍රීතුමිය හිටියනම් අහගන්න තිබ්බා.එතන තියෙනවා කුළුණු දෙකක්.ඒක නිසා පොඩ්ඩක් මාර්ගය

පොඩ්ඩක් හරස් වෙලා තියෙන්නේ.අන්න ඒ ගැනත් පොඩ්ඩක් ඒ මාර්ගය ඉදිකරනකොට ඒකත් පොඩ්ඩක් අවධානය යොමු කරන්න.මං දන් නෑ ඒක මොකද්ද කියලා.

**සභාපතිතුමා:-**
පන්සල ළඟ තියෙන පාර නේද?

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඔව් ඔව්.ඔව් සභාපතිතුමා.සාකච්චා කරනකොට කිවුවා. ඒක පොඩ්ඩක් මාර්ගයට අවහිර වෙලා තියෙන්නේ.ඒක ඉවත් කරන්න සුදුසුයි නම් ඒක ඉවත් කරලාමාර්ගය සංවර්ධනය කරන්න සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව සභිකඑස්.එම්.සුමිත්‍රා සේනානායක මැණිකේ මැතිණියගේ6.17.මාහර ස්වර්ණ ජයන්ති විද්‍යාලයට යන මාර්ගය සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකඑච්.එල්.දීපාල් මැතිතුමාගේ 6.18. යෝජනාව.

**සභික එච්.එල්.දීපාල් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.18. ගේ පිටක්කන හේන් යාය ලොට් 100 පහළ කොටසට යන පාරේ ගේපිටක්කන හේන් යායෙන් එන ජලය බැස යෑම සඳහා සමඟි පෙර පාසල පිහිටි ප්‍රජා ශාලාව අසල සිට තුන් පැල කුඹුර දක්වා අඩි 10 දිග 1½ පළල බෝක්කු 10 ක් යොජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එල්.දීපාල් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මේ ගේපිටක්කන හේන් යායේ පවුල් 32 ක් තියෙනවා.මිනිස්සු 100 ක් පමණ ජීවත් වෙනවා.පොඩි වැස්සටත් .....කන්දෙ ඉඳන් වතුර පාර එනවා.පාර ගලොගෙන යනවා හැමදාම.ගරු සභාපතිතුමනි ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා එය කර දෙන ලෙස මං යෝජනා කරනවා.

ඒ අනුව සභික එච්.එල්.දීපාල් මැතිතුමාගේ 6.18. ගේ පිටක්කන හේන් යාය ලොට් 100 පහළ කොටසට යන පාරේ ගේපිටක්කන හේන් යායෙන් එන ජලය බැස යෑම සඳහා සණස සමඟි පෙර පාසල පිහිටි ප්‍රජා ශාලාව අසල සිට තුන් පැල කුඹුර දක්වා අඩි 10 දිග 1½ පළල බෝක්කු 10 ක් යොජනා කළ යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 6.19. යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,

**6.19.නැ/විලේගොඩ වසම බිසෝදෙළ K.D.සුනිල් මහතාගේ නිවස අසලින් පහළට යන මාර්ගය අසල කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම මම යොජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සභාපතිතුමත් මේස්ථානයට ගිහිල්ලා බලලා තිබ්බා අපේ අතුරලිය මන්ත්‍රීතුමත් එක්ක.ඉතින් මේ පාරෙන් එන වතුරපාර ,විශාල වතුර පාරක් එනවා.පොඩි බෝක්කුවකින් තමයි පහලට යන්නේ.ඒ බෝක්කුවෙන් යන කොට ඒ පාරේ වංගුවක් වගේ තියෙනවා.ඒ වංගුව හැරිලා කාණුවක් දාල තියෙන නිසා ඒ කාණුවෙන් වතුර ගලාගෙන යනවා පහල තියෙන,මං හිතන්නේ ගෙවල් 5 ක් හෝ 6 ක් තියෙනවා.ඒ ගෙවල් 6 ම යටවෙනවා.මේ වතුර පාර නිසා.මං හිතන්නේ අපට දැනට කොන්ක්‍රීට් කාණුවක් දාල ඒ වතුර පාර සකස් කර ගන්න පුළුවන් නම්,පහල තියෙනවා කොන්ක්‍රීට් කාණුවක් ඒ වතුර පහර යොමු කරපුවහම අර පහළ තියෙන ගෙවල් 6 ම යට වීමේ අවධානම නැති වෙනවා.ඉතින් මේක ඉක්මනට කරන්න පුළුවන්නම් හොඳ යෝජනාවක් කියලා මං යෝජනා කරනවා.සභාවේ අවධානයට මං ඒ යෝජනාව ඉදිරිපත් කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මගේ ඉල්ලීමට ඔබතුමා ස්ථානීය පරීක්ෂණයට බලන්න ගියා.මං ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.ඇත්තටම ඒ මාර්ගය ගෙවල් 8 කට සෘජුව බලපානවා.ඒ කාණු පද්ධතිය(කියන එක පැහැදිලි නෑ) ටාගට් කරලා තියෙනවා.කාණු පද්ධතිය එක්ක ගං වතුර අවධානමට(කියන එක පැහැදිලි නෑ) මේකෙදි ඇතැම් නිවාසවල ටොයිලට්වලට ලොකු බලපෑමක් වෙලා තියෙනවා.ඒත් එක්කම ගෙවල්වල බිත්තිවලට බලපෑමක් වෙලා තියෙනවා.ඒ වතුර ඇවිල්ල,ඒ වර්ෂාවත් එක්ක ගලා යන වතුර පාර නිසා.මේකට කඩිනම් විසඳුමක් ලබා දෙන්න පුළුවන් නම් මං හිතන්නේ ප්‍රමුඛතාව දීල කරන්න පුළුවන් නම් ඒක කාලෝචිතයි.

ඒ අනුව සභිකඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 6.19 නැ/විලේගොඩ වසම බිසෝදෙළ K.D.සුනිල් මහතාගේ නිවස අසලින් පහළට යන මාර්ගය අසල කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 6.20. යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,

**6.20.විලේගොඩ වසමේ බුද්ධි මහතාගේ නිවස අසල සිට වෙල්යාය දක්වා ඇති කාණු පද්ධතිය පිලිසකර කිරීමයෝජනාකරමි.(රාජා මහතාගේ නිවස අසල සිට)**

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං හිතන්නේ මේ යෝජනාව අපේ අතුරලිය මන්ත්‍රීතුමා කලින් යෝජනා කරපු විජේනායක මාර්ගය දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාවේ කොටසක් තමයි.ඒ කියන්නේ පනාවල පාරෙන් එන පාරෙන් හැරිලා විජේනායක විදයාලය දක්වා යන්න තියෙන මාර්ගය. මේ මාර්ගයට එතුමා කිව්වා වගේ අර සුද්ද පවිත්‍ර කරලා ගන්න කොට විශාල වශයෙන් ජලය රැදී පවතින ස්ථාන දෙක තුනක් තියෙනවා.ඉතින් එම ස්ථාන වලට එම බුද්ධි මහතාගේ නිවස අසල සිට කාණුවක් තියෙනවා වෙල දක්වා.ඒ කාණුව ගොඩ වෙලා තියෙන්නේ.ඒ කානුවට කොන්ක්‍රීට් කණුවක් යොදල ඒ කාණුව හැරුවොත්,මේ පාරෙන් පාසල් ළමයි 500 ක් 1000 ක් පමණ යනවා.පනාවල පාරෙන් එන ළමයි මේ පාරෙන් තමයි යන්නේ.දවසට වාහන 100 ක් 200ක් පමණ වාහන මේ පාරෙන් යනවා.ඉතින් මේ කාණුව හැදුවොත් අර පාරේ තියෙන වතුර කාණුව හරහා වෙල් යායායට යොමු කරන්න පුළුවන්.එතකොට ඒ පාර සංවර්ධනය වෙලා අතුරලිය මන්ත්‍රීතුමා කිව්ව අර යෝජනාවට අනුව දෙපැත්ත සුද්ද කරගෙන යන්න පුළුවන්.ඉතින් එතකොට ඒ මාර්ගය සංවර්ධනය කිරීම තුළින් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් සිදු වෙනවා.ඒ නිසා මම ඒ යෝජනාව යෝජනා කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං පොඩි දිගුවක් කරන්නම්.ඒකෙ පීල්ල පැත්තට යන්න තියෙන පාලමේ මං හිතන්නේ පසුගිය රජයේ වැරදි සංවර්ධන යෝජනාවක් නිසා මේ සිද්ධිය වෙන්න පුළුවන්.ඒකෙ කාණු පද්ධතිය වැහෙන තමයි කොන්ක්‍රීට් කරලා තියෙන්නේ.ආන් එතන ඉමේකෙ සමන්සිරි මන්ත්‍රිතුමා යෝජනා කරන විදිහට එතන පාර කඩලා අපට අර වැල් පාලමක් වතුර බහින්න අර කන්දෙන් එන වතුර බහින්න,පුළුවන් විදිහට තාක්ෂණික ක්‍රමයක් උපයෝගී කරගෙන මේ කාණු පද්ධතිය නිවරදිව හදන්න පුළුවන්නම් ඒකට යම් පිළියමක් යෙදෙනවා.ඒත් එක්කම මේ පාරේ සංවර්ධනය කරන්න,සමන්සිරි මන්ත්‍රිතුමා කියපු ස්ථානය ,වර්ෂාවට පැයක් විතර කාලසීමවවක් තුළ ජලය රැදිලා පවතිනවා.විශාල ලෙස මෙය පාසල් යන ළමුන්ට බලපානවා.ඒත් එක්කම ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාවටඇතුළු ඇඩි බලපෑම් ඇති කරන ප්‍රදේශයක්,ස්ථානයක්.ඒ සඳහා සංවර්ධනය කිරීම සුදුසු යැයි, මේ සභාවට ප්‍රමුඛතාව ලබා දෙන්න කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 6.20. විලේගොඩ වසමේ බුද්ධි මහතාගේ නිවස අසල සිට වෙල්යාය දක්වා ඇති කාණු පද්ධතිය පිලිසකර කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය. (රාජා මහතාගේ නිවස අසල සිට)

**සභාපතිතුමා:-**
මී ලඟට සභාපතිතුමා හැටියට මගේ යෝජනාවක් 6.21. යෝජනාව.

**සභාපතිතුමා:-**
**6.21.අඟුරුවාමුල්ල අඹන්ඔළුව දක්වා යන ගම් සහා මාර්ගය සංවර්ධනය කිරීමට මම යෝජනා කරනවා.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
මේක කවුරුත් දන්න පාරක්.ඉතාමත් කෙටි පාරක්.බයිපාස් එකක් හරි කරන්න පුළුවන් පාරක්.ඉතින් ඒ ගමේ ගොඩක් අය අත්සන් ලේඛන පවා මට ලබා දුන්නා.ඉතින් මං මේක කාලෝචිතයි කියලා යෝජනාවක් හැටියටඉදිරිපත් කරනවා.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඕක මෝරගල කොට්ඨාශයේ තියෙන පාරක්.ඕක අපි අවසථා කීපයකදීම එම මාර්ගය සංවර්ධනය කළා.එයාලගෙ ශ්‍රමදායකත්වයෙන් අපිට පුළුවන් වුණා,මේ මිනිස්සු එක්ක එකතු වෙලා ඒක හදා ගත්තා.මට පොඩ්ඩක් පැහැදිලි නෑ කොයි හරියද කියලා.සම්පූර්ණයෙන්ම ද?

**සභාපතිතුමා:-**

මන්ත්‍රිතුමා එතන ඒ පාර නෙමේ.

**සභික සුජීව විජේසූරිය ,මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,කොත්විල පාරෙන් ලිහිල්ලා ළිඳ ගාවින් යන පාරද සභාපතිතුමා ඔය කියන්නේ?

**සභාපතිතුමා:-**
නැ නැ.අගුරුවාමුල්ලෙන් යන පාර.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
නැ නැ.ප්‍රධාන ප්‍රශ්නෙ තියෙන්නේ සභාපතිතුමා,මාත් එක්ක ඒ මිනිස්සු තරහා වෙන එකක් නැ.මිනිස්සු එහා මෙහා යන්න එපැයි. මිනිස්සුන්ගේ වැටවල් ටික තියෙන්නේ පාරේ.ඒ සඳහා අපේ සහයෝගය ,සභාවේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න පුළුවන්.මං කියන්නේ එයාලත් එක්ක සාකච්ඡා කරලා,කට්ටියත් එක්ක සාකච්ඡා කරලා අඩියක් විතර පස්සට ගත්ත නම් ,ඒකෙ පළවෙනි කාරණාව තමයි තාප්ප ටික තියෙන්නෙත් පාරේ තියෙන්නේ.ජනතාව එක්ක සාකච්ඡා කරලා ක්‍රීය කර ගන්න සංවර්ධනය කරගන්න පුළුවන් නම් ඉතාම වටිනවා කියලා කියනවා.

**සභාපතිතුමා:-**
සුජීව මන්ත්‍රීතුමා කිවුව වගේ ඡන්දෙ දවස්වල ඔය පාරේ යන්න බෑ.වාහනේ යන්න බෑ.වාහනේ ගන්න බැ.

ඒ අනුව සභාපතිතුමාගේ 6.21.අගුරුවාමුල්ල අඹන්ඔළුව දක්වා යන ගම් සහා මාර්ගය සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
සභාපති හැටියට මගේ තව යෝජනාවක් තියෙනවා,6.22

**සභාපතිතුමා:-**
**6.22.අල්ලක්ෂා ජාතික පාසල පනාවල මාර්ගය ඇතුළතින් යන මාර්ගය ඉතිරි කොටස සංවර්ධන කිරීමට මම යෝජනා කරනවා..**

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
ඇත්තටම මේක කවුරුත් අපේ මන්ත්‍රීවරු දන්න තැනක්.ඉතාමත්ම ළඟ.අල්-අක්ෂා ඉස්කෝලෙට ළඟ තියෙන පාරක්.ඒක ටික දුරයි හදන්න තියෙන්නේ.මේකට වැඩි මුදලක් යන්නෙ නැ.

ඒ අනුව සභාපතිතුමාගේ6.22.අල්ලක්ෂා ජාතික පාසල පනාවල මාර්ගය ඇතුළතින් යන මාර්ගය ඉතිරි කොටස සංවර්ධන කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
එහෙනම් බොහොම ස්තුතියි.අපි ඉස්සරහට යමු.මීලඟට සභිකඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 6.23. යෝජනාව.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.23.රණවිරු සම්පත් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට මම යෝජනා කරමි.**

**සභිකපී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම පාර බුළුගහපිටියට සම්බන්ධ වන පාරක්.මොකද රණවිරු සම්පත් මාවත කියන්නේ මෝරගල කොට්ඨාශයට අයිති බුළුගහපිටියට සම්බන්ධවන පාරක්.එම නිසා එම පාරේ පාසල් ළමයින්ද,පාන්දර ගාමට් යන වාහන හරි අපහසුවකින් තමයි යන්නේ.එම නිසා මම යෝජනා කරනවා එම පාර ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,නැවත වතාවක් මුලින් අපි කලින් කතා කරපු ප්‍රශ්නෙට අනුව මේ පාර පළාත් සභා පාරක්.එතකොට මම දාපු මෝරගල හන්දියේ සිට පැල්පිටිය හරහා සදර්ලන්ඩ්වත්ත දක්වා මාර්ගයත් පළාත් සභා මාර්ගයක්. මේ යෝජනාවේ තියෙන රණවිරු සම්පත් මාර්ගයත් පළාත් සභා මාර්ගයක්.මගේ යෝජනාව කැපුවා.මෙතුමාගේ යෝජනාව ඇතුළත් කරලා.මම කියන්නේ සභාපතිතුමනි වැරදියට තේරුම් ගන්න එපා සභාපතිතුමනි,මම කියන්නේ මන්ත්‍රීවරුන්ට අවම වශයෙන් අවම යෝජනා තුනක් දාන්න දෙන්න.මේ පලාත් සභා මාර්ගයක්,මිස්බහ් මන්ත්‍රීතුමාගේ යෝජනාව.එතකොට ඒ අවස්ථාව දෙන්න අපිට.මං දැන් මීට වඩා කතා කරන්න යන්නෙ නෑ.නැවතත් ඉල්ලන්නේ අපේ යෝජනා ටික අවමය තුනක්වත් දෙන්න යෝජනා ටික න්‍යාය පත්‍රයට දාන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම මිස්බහ් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.මොකද රණවිරු සම්පත් මාවතේ මෙතුමාට අයිති මීටර් 100 ක් විතර අනෙක් මීටර් 750 ම මගේ.බොහොම ස්තුතියි ඔබතුමාට.

ඒ අනුව සභිකඒ.එස්.එම්.මිස්බාහ්මැතිතුමාගේ 6.23.රණවිරු සම්පත් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 6.24. යෝජනාව.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.24.මෝරගල හන්දියේ ත්‍රිරෝද රථ ගාල යට ඇළ මාර්ගයේ අවහිරතා ඉවත් කිරීමට මම යෝජනා කරමි.**

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙතන ඇළ මාර්ගයක් තියෙනවා, පාර්ක් එක ුසල.ඒකෙ වැසි කාලෙට වැලි ඇවිල්ලා හිරවෙලා ,පාරටත් වතුර දාන වෙලාවල් තියෙනවා.එම නිසා එම ඇළ මාර්ගය පිරිසිදු කරන්න ගමේ මිනිස්සුත් යෝජනා කරනවා.ත්‍රිවිල් පාර්ක් එකේ කට්ටියත් අපට යෝජනා කරනවා,කියන්න කියන්න සභාවට කියලා.එම නිසා එම යෝජනාව වැඩිය පැහැදිලි කරන්න දෙයක් නෑ.හන්දියේ වගේ තියෙන්නේ.ඒ නිසා එම ඇළ මාර්ගය පිරිසිදු කරලා අපට දෙන්න කියලා සභාවට යෝජනා කරනවා.

ඒ අනුවසභිකඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 6.24.මෝරගල හන්දියේ ත්‍රිරෝද රථ ගාල යට ඇළ මාර්ගයේ අවහිරතා ඉවත් කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභාපතිතුමාගේයෝජනාවක්,6.25
**සභාපතිතුමා:-**
**6.25.වත්කම් සමීක්ෂණ සඳහා ඒ ඒ කොට්ඨාශ මන්ත්‍රිතුමා ද ඇතුළත්ව තවත් මන්ත්‍රිතුමන්ලා /තුමියන්ලා ද සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකුවත් ඇතුළත් වන සේ වත්කම් සමීක්ෂණය සඳහා කමිටුවක් පත් කර ගැනීමට මම යෝජනා කරමි.**

**සභික වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම කොහොමද ඒ සඳහා නිලධාරීන් හා මන්ත්‍රීන් සංඛ්‍යාව කොහොමද අපි

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,වත්කම් සමීක්ෂණය සඳහා ගත්තොත් එහෙම වසම් තියෙනවා 44 ක්,කොට්ඨාශ ගත්තොත් එහෙම කොට්ඨාශ 18ක්.කොට්ඨාශ 18 මන්ත්‍රිවරු,කොට්ඨාශ මන්ත්‍රිවරයාද ඇතුළත්ව කොට්ඨාශ 18 ම මන්ත්‍රිවරු 19 දෙනාද ඇතුළත්ව කොට්ඨාශ මන්ත්‍රිවරයාද තවත් මන්ත්‍රිවරු කිපදෙනෙක් යෝජනා කරගෙන,අපි එහෙම වත්කම් සමීක්ෂණය සඳහා කමිටුවක් පත් කරමු.

**සභාපතිතුමා:-**
ඇත්තටම සියලුම මන්ත්‍රිවරුන්ගෙන් මන්ත්‍රිවරියන්ගෙන් ඒ සඳහා සහයෝගය බලාපොරොත්තු වෙනවා.මොකද විශේෂයෙන්ම අපේ වසම 44 ම තියෙන වත්කම් වංවල දේපල,නිශ්චල දේපල සමහර ඒවා අපි හරියට දන් නෑ. ඔයගොල්ලො දන්නවා සමහර ඉඩම් වෙන්දේසි කරන කොට වෙන්දේසිවලින් අපට සභාවට හම්බෙන බිම් ප්‍රමාණයන් තියෙනවා.සමහර අපට ඒවා විකුණලා තියෙන තැන් තියෙනවා.මේක අපි සියලු දෙනාටම,මොකද අපි සංවර්ධන යෝජනා ගේනවා,ඉතාමත් සත්භාවයෙන් හැම දෙනාම.ඒත් හැම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අපට වත්කම් ඕන.මුදලක් ඕන සංවර්ධනය සඳහා.ඉතින් අපිට හරියට,අපි නොදන්නඅපේ වත්කම් ප්‍රාදේශීය සභාව සතු වත්කම් විශාල ප්‍රමාණයක් තියෙනවා.සමහර ඒවා අපි අඳුරගෙන යනවා.සමහර නිලධාරීන්වත් යොදා ගන්න වෙලා තියෙනවා.ඒනිසා සියලුම මෙතන කොට්ඨාශ සියලුම මන්ත්‍රිවරුන්ගෙන් ඉතාමත්ම කරුණාවෙන් ඉල්ලා සිටිනවා,මේකට අපි ඔක්කොම සම්බන්ධ වෙලා තමන්ගේ වසම තම තමන්ම අධ්‍යනයක් කරලා ඒ සඳහා අපට උපරිම සහයෝගය ලබා දෙන්න කියලා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒකට අපි කොයි ආකාරයෙන්ද කොට්ඨාශ මට්ටමින් අපි දැන්

**සභාපතිතුමා:-**
සියලුම මන්ත්‍රිවරු.36 දෙනාම

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ආ සියලුම

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
වත්කම් සමීක්ෂණය සඳහා සියලුම මන්ත්‍රිවරුන් 36 දෙනාම යොමු කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
36 දෙනාම ආ හරි
ගරු සභාපතිතුමනි,ගරු සභාපතිවරයා විසින් ගෙනෙන ලද 6.25 යෝජනාවේ,ඒ සඳහා අපේ සියලුම මන්ත්‍රීවරු,සභාවේ සිටින 36 දෙනාම ඒකට ඇතුළත් විය යුතු ලෙස මම යෝජනා කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
මං හිතන විදිහට,කොට්ඨාශ 18 ට18 ක් ඉන්නවා.සමහර ඒවාට,බුළුගහපිටිය ගත්තොත් එහෙම මන්ත්‍රීවරු වැඩි පිරිසක් ඉන්නවා,එයාලටත් අවස්ථාව දෙමු,එයාල කැමති නම්,අපි හිතමුකෝ දැන් බටහිර කලටුවාවේ ඉන්නනේ සුසන්ත ජයසෝම මනත්‍රීතුමා විතරනේ.අපි කැමතියි.එතකොට අනිත් අයට පුලුවන් එතුමාට සහයෝගය දෙන්න.

**සභාපතිතුමා:-**
අනිවාර්යෙන්ම.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
නම ඒ සඳහා දැන් යෝජනා කරන්න ඕනද?නැත්තන් පස්සේ (සෝෂාව)

**සභික වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
36 දෙනාම ඉන්නවනේ.දැන් කාලේ යන නිසා,අපි කමිටුව අරගෙන කමිටුවේදී වැඩ පිළිවෙල සාකච්ඡා කර ගමු.

**සභාපතිතුමා:-**
ඔව්,සමහර ඒවා තියෙනවා,සුජීව මන්ත්‍රීතුමා දන්නැති ඒවා,දිලීන් මන්ත්‍රීතුමා දන්න පුළුවන්,ඒ ප්‍රාදේශයේ

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,(සෝෂාව පැහැදිලි නැ වචන)සිද්ධියක් වුණා.බෝපැත්තේ.සෙනසුරාදා තිබ්ලා තියෙනවා රැස්වීමක් සමෘර්ධියෙන්.ඒ සමෘර්ධිරැස්වීමේ මුදල් ආධාර දුන්නා.මුදල් වහයෙන් යම් යම් වෘත්තීන් කරන අයට . ඒ ප්‍රදේශයේ ග්‍රාමසේවක නිලදධාරීතුමිය එන්නේ 12.03 ට එන්නේ.අන්න ඒවා ගැන කටයුතු කරනකොට (සෝෂාව)

ඒ අනුව සභාපතිතුමාගේ 6.25 වත්කම් සමීක්ෂණ සඳහා ඒ ඒ කොට්ඨාශ මන්ත්‍රීතුමා ද ඇතුළත්ව තවත් මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා ද සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකුවත් ඇතුළත් වන සේ වත්කම් සමීක්ෂණය සඳහා කමිටුවක් පත් කර ගැනීම යෝජනාව සඳහා,සභාවේ සභිකයන් 36 දෙනාම ඇතුළත් විය යුතු බවට සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා යෝජනා කළ අතර,සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා ස්ථිර කිරිමෙන් පසු එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභාපතිතුමාගේයෝජනාවක්,6.26

**සභාපතිතුමා:-**
**6.26.අතුරු ව්‍යාවස්ථා සම්පාදනය සඳහා සභාවේ ලේකම්, ප්‍රධාන කලමණාකරණ සේවා නිලධාරී,කාර්මිකනිලධාරී,විෂයභාරනිලධාරී,ඇතුළු සභාවේ මන්ත්‍රීතුමන්ලා /තුමියන්ලාගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීමට මම යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම කමිටුව පත්වීමේ දී පත්වන මන්ත්‍රීවරු හා වරියන් පත්වෙන ආකාරය කොහොමද කියලා තමයි මං අහන්නේ.ඉස්සෙල්ලා එක වගේ සියලුම මන්ත්‍රීවරු ඉදිරිපත් වෙනවද?ඒ කටයුත්ත සිද්ධ වෙන ආකාරය පිලිබඳ දැන ගන්න කැමතියි.

**සභාපතිතුමා:-**
අපි,මම යෝජනා කරනවා,හරි උපසභාපතිතුමා කියන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම අතුරු ව්‍යාවස්ථා සම්පාදනය කියන්නේ සභාවක සභාවට බලපාන සභාවේ සේවාවන්ට සභාව යටතේ අධීක්ෂණය වන ව්‍යාපාර සම්බන්ධයෙන් වන නව නීති සම්පාදනයයි.එතකොට ඒක ඇත්තටම දැන් මේ සඳහා උනන්දුවක් දක්වන හැකියාවක් තියෙන විවිධ අදහස් තියෙන අලුත් අදහස් තියෙන අපේ මන්ත්‍රීවරුත් ඇතුළත්ව 11 විතර මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක්.මගේ පැත්තෙන් ගරු සභාපතිතුමත්,උපසභාපති වන මමත්,අපේ රණවීර හේවගේ මැතිතුමත්,නදුන් විජේසිංහ ගරු මන්ත්‍රීතුමත්,සමන්සිරි ගරු මන්ත්‍රීතුමත්,අමිල් විජේසිංහ මන්ත්‍රීතුමත්.යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ඔබතුමා කියන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගයේෂාන් මන්ත්‍රීතුමාත්,දිලීන් කරුණාපාල මන්ත්‍රීතුමා,අජන්ත විජේසිංහ මන්ත්‍රීතුමා,සුජීව විජේසූරිය මන්ත්‍රීතුමා,රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා මං යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
අපි එහෙමයි

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව සභාපතිතුමාගේ 6.26 අතුරු ව්‍යාවස්ථා සම්පාදනය සඳහා සභාවේ ලේකම්, ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී,කාර්මික නිලධාරී,විෂයභාර නිලධාරී,ඇතුළු සභාවේ මන්ත්‍රීතුමන්ලා /තුමියන්ලාගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීමට යෝජනාව සඳහා උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා සභික නම් 11 ක් යෝජනා කළ අතර,සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා ස්ථිර කිරිමෙන් පසු එම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

- **අතුරු ව්‍යාවස්ථා සම්පාදන කමිටුවේ සාමාජික මන්ත්‍රීවරු.**
- බන්දුලසේන දුණුවිලමැතිතුමා.
- .එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා
- අයි.එච්.රණවීර මැතිතුමා.
- කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා.
- ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.
- ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.
- ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා.
- දිලීන් කරුණාපාල මැතිතුමා.
- ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා.
- ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.
- ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ 6.27. යෝජනාව.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.27.ඇරැපොල පාසල පිටුපස කැඳ කඩේ අසල දිල්හානි මහත්මියගේ නිවස අසල සිට සුමිත් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම මාර්ගය ඇරැපොල ඉස්කෝලේ පිටුපස මාර්ගයක්.මෙම මාර්ගයේ පවුල් 60 ක් වගේ ප්‍රමාණයක් ඉන්නවා.වයස්ගත කට්ටිය ඉන්නවා,බෙහෙත් ගේන්න යන්නවත් (ඇහෙන් නැ,පැහැදිලි නැ)ඉල්ලීමක් කරලා තියෙනවා.මේ සඳහාඅවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ 6.27.ඇරැපොල පාසල පිටුපස කැඳ කඩේ අසල දිල්හානි මහත්මියගේ නිවස අසල සිට සුමිත් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ 6.28. යෝජනාව.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,

**6.28.හිඳුරංගල මහවත්ත පාරේ සුනිල් මහතාගේ නිවස අසල පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දොල පාරක් තියෙනවා ඒ ( පැහැදිලි නැ වචන)පාරෙන් බැස්සත් මෙම මාර්ගයේ යාමට අපහසුයි.මේකෙ පවුල් 12 ක් 15 ක් වගේ ඉන්නවා.මීටර්100 ක් 150 ක්වගේ තියෙන්නේ.මේ සඳහාඅවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ 6.28.හිඳුරංගල මහවත්ත පාරේ සුනිල් මහතාගේ නිවස අසල පාර සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ 6.29. යෝජනාව.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,

**6.29.හිඳුරංගල තැන්න මුකලාන ගුණදාස මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේකේ පවුල් 150 ක් වගේ ඉන්නවා.දළු ලොරි ඉස්කෝලේ ළමයි,ඉස්කෝලෙ ළමයින්ට උදේට ඉස්කෝලෙට යන්න අමාරු තත්ත්වයක් තියෙන්නේ මඩ නිසා.ඒ නිසා ඒ මාර්ගය සංවර්ධනය කරලා දෙන්න කියලා මං ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ 6.29.හිඳුරංගල තැන්න මුකලාන ගුණදාස මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමයෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකසුජීව විජේසූරිය මැතිතුමාගේ 6.30. යෝජනාව

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.30.නගරයේ ස්ථාන කිහිපයක වතුර ටැංකි තාවකාලිකව ස්ථානගත කිරීමට යෝජනා කරමි.**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මං ගෙනාවෙ ඉදිරියේදී නියඟ කාලයක් අපේ ප්‍රදේශයට බලපානවා.ඒ බලපානකොට අපිට මේකට වියදමත් යන් නැතුව අපිට මේක කරන්න පුළුවන් ගරු සභාපතිතුමනි.අපිට සම්බන්ධ හාඩ්වෙයාර් ඇහැලියගොඩ නගරයේ තියෙනවා. අපි කථා කරල ලීටර් 1500ක 2000ක වගේ ගැලුමක් අපි ඉල්ලගන්නවා හාඩ්වෙයාර් එකකින්.ඊට පස්සේ පොලීසිය අසල ඊගාවට බෝගහ යට අසල, ඊලඟට අපේ සභාව අසල අවශ්‍යනම් මෙතන ඉස්කෝලයක් තියන නිසා නැත්නම් අපේ පුස්තකාලය අසල ඊට පස්සේ උඩහට ගියහම මැණික්පොල ඒ අවට ඊට පස්සෙ මාර ගහ යට ඒ ස්ථාන ටිකේ අපිට ස්ථානගත කරල අපි මාසයක් දෙකක් ඒක පාවිච්චි කරල අපට පුළුවන් නැවත ඒක භාර දෙන්න පුළුවන්.අපිට ඒකට වියදමක් යන්නේ නැහැ සභාපතිතුමා, අපිට වතුර ටික water board එකට කථා කරලා ගන්න පුළුවන්.අපිට ඒ වතුර ටැංකි ටික කථා කරලා ගන්න පුළුවන්.ඒ ඔබතුමා අපිට අවසරය ලබා දුන්නොත් අපිට මැදිහත් වෙලා කරන්න පුළුවන් ගරු සභාපතිතුමනි,අපිට ඒ නිසා ඔය සමාජයේ කථාවෙන කථාවක් මං හිතන්නේ ඔබතුමාටත් සමහරවිට කියල ඇති.ඒ නිසා ඒ නියඟයට විසඳුමක් විදියට අපි ඒක තාවකාලිකව සවි කරන්න මං ඔබතුමාට අදහසක් ගේන්න යෝජනා කළේ. ඒ නිසා ඒ සඳහා වැඩපිළිවෙලක් අපිට සකස් කරල දෙන්න.අපිට මැදිහත් වෙන්න පුලුවන් ඔබතුමාගේ අනුශාසනා සහ උපදෙස් පරිදි.
ඒ අනුව සභික සුජීව විජේසූරිය මන්ත්‍රීතුමාගේ 6.30 නගරයේ ස්ථාන කිහිපයක වතුර ටැංකි තාවකාලිකව ස්ථානගත කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මීලඟට සභික සුජීව විජේසූරිය මන්ත්‍රීතුමාගේ 6.31යෝජනාව

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.31.බුළුගහපිටිය පොදු සුසාන භූමියේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම,කම්බි ගසා වැටකින් ආවරණය කිරීම ශ්‍රමදානය කිරීම මම ඔබතුමාට යෝජනා කරමි..**
**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, බුළුගළපිටිය සුසාන භූමිය ඔබතුමා ස්ථාන පරීක්ෂාවක් කළා.ඒ ගොඩනැගිල්ලට කඩා වැටිච්ච ගසක් ඉවත් කරන්නට. මං හිතන්නෙ ඔබතුමා ගියා.මට ආරංචියි.ඒ වගේම ඔබතුමාට ගෞරවනීය ප්‍රණාමය පුද කරන්න අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම ඔබතුමා ස්ථානීය පරීක්ෂණයක් කරද්දී දකින්න ඇති.ඒ ප්‍රධාන පාර අපේ සුසාන භූමිය මැදින් යන්නෙ.ඔබතුමා ඒ ස්ථානයට ගියානේ.ඔබතුමා එතනට ගියානේ.එතකොට අපි ඒ පාර අයිනෙන් දෙන්න ඕනි ගරු සභාපතිතුමා, නැත්නම් ඒ ගොඩනැගිල්ලේ විෂමාචාර රාත්‍රි සියල්ලක්ම සිද්ධවෙන තැනක්.ඒ නිසා ඔබතුමා ඉස්සෙල්ලාම අද යෝජනා කරන්නෙ අපිට අපි දිනයක් දාගෙන අපි සියලු දෙනාම අපි ඔබතුමාගෙ වම් පස සහ දකුණු පස සියලු දෙනාම එකතු වෙලා කාර්ය මණ්ඩලය අපි මීට කලින් කලා, අපි කාර්ය මණ්ඩලය එකතු වෙලා ශ්‍රමදානයක් දාගමු එක දවසක. ශ්‍රමදානයක් දාගෙන සම්පූර්ණම බිම ශුද්ධ පවිත්‍ර කරනව අපි සියලු දෙනාම එකතු වෙලා. අපි සහෝදරයො එකතු වෙලා සාමාජිකයො සියලු දෙනාම එකතු වෙලා ඒ වැඩේ කරනව දිනයක් දාගෙන.ඊට පස්සෙ ඔය කම්බි ගන්ඩ එහෙම ලොකු වියදමක් යනවනේ. ඒක සුද්ද කරල අපි ගොඩනැගිල්ලට මූලිකත්වය දෙනව.දෙවනුව ඉන් අනතුරුව ඔබතුමාල මැදිහත්වෙලා අපිට කම්බි ටිකක් අරගෙන දෙන්න.,ආවරණය කර ගන්න.අර පාර තමයි මට ප්‍රධාන කාරණය තියෙන්නෙ. පාර අයිනෙන් දාන්න ඕනි සභාපතිතුමා. ඒකට ඔබතුමා නැවතත් අපි එම ස්ථානයට ගිහිලිල අපේ කටයුත්තට දෙන්න. අපි දිනයක් කථා කරල ගමේ කට්ටියත් එක්කත් කථා කරලා දිනයක් දෙන්නම්. එදාට කට්ටිය අපි සියලු දෙනාම එකතු වෙලා. කාර්ය මණ්ඩලය අපි සභික සියලු දෙනාම එකතු වෙලා ශ්‍රමදානයක් දාල අපි ඒ වැඩ ටික කරමු. බොහොම ස්තූතියි.

**සභාපතිතුමා:-**
මං හිතනවා ඉතාම කාලෝචිත යෝජනාවක්.ඉතිං මම මන්ත්‍රිතුමාගෙන්ම ඉල්ලා සිටිනව ඒ සඳහා දිනයක් අපිට පසුව ඒගොල්ලොත් එක්ක කථා කරල දිනය අපිට ලබා දෙන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
හොඳයි බොහොම ස්තූතියි.ගරු සභාපතිතුමනි, මම ඒක ඉක්මනටම ලබා දෙන්නම්. බොහොම ස්තූතියි.

ඒ අනුව බුළුගහපිටිය පොදු සුසාන භූමියේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම,කම්බි වැටකින් ආවරණය කිරීම,ශ්‍රමදානය කිරීමයෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මීලඟට සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණියගේ 6.32යෝජනාව

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,
**6.32.ඇහැලියගොඩ වත්ත අංක 02 කොටසේ ක්‍රිස්තියානි දේවස්ථානය සිට ආනන්දන් මහතාගේ නිවස දක්වා මීටර් 200 ක් පමණ දුරට අඩි 8 ක් පමණ පළලට පාර සංවර්ධනය කිරීම මම යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා. ගරු සභාපතිතුමනි, එතුමිය විසින් ගෙන එන ලද යෝජනාව , මේ විශාල වශයෙන් ඒක කාලෝචිත යෝජනාවක් කියල.

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,දේවස්ථානයේ සිට ආනන්දන් මහතාගේ නිවස දක්වා දිවෙන පාර අවුරුදු 35කටත් වැඩි කාලයක් වෙනවා,කිසිම සංවර්ධනයක් නොකරපු පාරක්.ඒ කොටසෙ පවුල් 35ක් පමණ ජීවත් වෙනව.ඒජනතාව තාමත් යන්න එන්න පාරක් නැතුව තාමත් දුක් වෙනව. දැනට වාහනවත් යන්න බෑ.එච්චර දුරට මේ පාර කැඩිල තියෙන්නේ. ඒ වගේම වයසක රෝගියා රෝහලට ගෙනියන්න බෑ.වැස්ස වෙලාවට පාසල් ළමයින්ට පාසලට යන්න විදියක් නෑ. එම පාර ලිස්සනව. ඒ වගේම එම ජනතාව ඒ පාර වැඩිපුරම පාවිච්චි කරන කාරණාව ප්‍රධාන පාරට මීටර් 500 දුරක් තියෙන හින්ද.ඒ නිසා හැකි ඉක්මනින් ඒ පාර කොන්ක්‍රිට් පාරක් ලෙසට හදල දෙන්න කියල යෝජනා කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ගරුසභාපතිතුමනි, කෙසේ වෙතත් එතුමියගේ ඒ යෝජනාව.... මේ කෙටිම මාර්ගය. ගමන් බිමන් යන්න පුළුවන් ඒ වගේම දේවස්ථානයේ උත්සව සමයේ කෙටිම....මාර්ගයට බහින්න පුලුවන් පාරක්. ඒ නිසා ඔබතුමාගේ ගෞරවනීය අවධානය යොමු කරනවා මේ සඳහා කටයුතු කරන ලෙස.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එතන ඔබතුමත් නියෝජනය කරන කොට්ඨාසය. මේකෙදී ආර්ථික වශයෙන් ගොඩක් පසුගාමී කණ්ඩායමක් තමයි මේ ප්‍රදේශය නියෝජනය කරන්නේ.ඒත් එක්කම සංස්කෘතික වශයෙනුත් ඒ

ප්‍රදේශය අපට වැදගත් වෙනව.මොකද මේ සරෝජිනී මන්ත්‍රීතුමිය අපිට වැදගත් වෙනව. මොකද අපට මෙතුමිය සංස්කෘතික වශයෙනුත් ලොකු වටිනාකමක් තියෙනව. ඒඔබතුමා නියෝජනය කරන කොට්ඨාසය නිසා ඒකට ප්‍රමුඛතාවය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඇහැලියගොඩ වත්ත අංක 02 කොටසේ ක්‍රිස්තියානි දේවස්ථානය සිට ආනන්දන් මහතාගේ නිවස දක්වා මීටර් 200 ක් පමණ දුරට අඩි 8 ක් පමණ පළලට පාර සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මීලඟට සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමාගේ 6.33 යෝජනාව

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.33.අස්ගගුල උතුර ග්‍රාම නිලධාරී වසමට සේවා පියසක් ලබා ගැනිමට මම යෝජනා කරමි.**

**සභික ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක නගර කොට්ඨාසයේ ඔබතුමාගේ බල ප්‍රදේශයේ,මුන්සීර් මන්ත්‍රීතුමත් ඉන්න මේක එතකොට ගරු සභාපතිතුමා ඔබතුමා නිරීක්ෂණය කරල බලන්න.මේ වසමේ කිසිම තැනක මේ නිලධාරීන් ඉන්නෙ තැන් තැන්වල. අර ග්‍රාම නිලධාරීතුමිය ඉන්න කුටිය ගත්තොත් එහෙම සත්තු ඉදන් සර්පයින් ඉදන් ඉන්න තැනක්. ඉතිං මෙතන විශාල අඩුපාඩුවක්. අස්ගගුල දකුණටත් තියෙනවා ප්‍රජා ශාලාවක්.අස්ගගුල උතුර මේ ප්‍රජා ශාලාව සඳහා ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමට හැකියාව තිබේනම්, තියෙන්නේ අපේ ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමියේ පන්සල අයිනෙ පර්චස් 3ක් හෝ 4ක් අපට ලබා ගන්න පුළුවන්. ඒ හරියෙ මිනිදන් කරල නැති ප්‍රදේශයක් තියෙනවා. මේ සඳහා ඔබතුමා කෙසේ හෝ මට ආරාධනා ඕනිත් නෑ.විවෘත කරන්න ආරාධනා අවශ්‍යත් නෑ. ඔබතුමාගේ ගෞරවනීය පැසසුමට ලක්වෙමින් ඔබතුමාට ඒ මිනිස්සු ගොඩක් ආදරේ කරනවා. කථා කරනවා. ඔබතුමා පිළිබඳව මේක සභාවට දැම්මොත් කෙරෙනව. මං කිව්වා නෑ සභාපතිතුමා අනිවාර්යෙන් ඉතාම සුහදසීලිව මේක (පැහැදිලි නෑ වචන).ඔබතුමා මේක කරලා විවෘත කරන්න. මං ඒක යෝජනාව දාන්නම්.ඒක නිසා බය වෙන්න දෙයක් නෑ.ඒනිසා ඔබතුමාගේ දැඩි ගෞරවයෙන් මං ඉල්ලනවා මේ සඳහා ඔබතුමාගේ වැඩි අවධානයකට ලක් කරලා, මේක සභාවේන් කරන්න බෑ. ඒක අපිට මධ්‍යම ආණ්ඩුවේ මුදල් වලින් හෝ මේක කරන්න වෙනවා.සම්බන්ධීකරණයට යොමු කරලා ඔබතුමා මේ සඳහා කටයුතු කරන්න.ඒ අවස්ථාව මේ මිනිස්සුනගේ ගෞරවය ඔබතුමා ලබා ගන්න. ඔබතුමා ගන්න ඒක ප්‍රශ්නයක් නෑ. ඒ යෝජනාව අරගෙන ආවා.ඒ නිසා ඒක ඉක්මනින්ම කරලා ඔබතුමා විසින් ඒ අස්ගගුල උතුර කොට්ඨාශයේ යම්කිසිසේවාවක් කළා නම් එන්න ඒ සේවාව සදා කල් රැදිල තියෙනවා.ඔය පාරවල් කළාට ඒවා රැදිල තියෙන්නේ නෑ.මං මේ ගැන ඔබතුමාගේ දැඩි අවධානයට ලක් කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බොහොම සතුටු වෙනවා.රංජිත් මන්ත්‍රීතුමා, නීති රීති පනත ගැන කතා කළහොත් ඒකත් අපේ විෂය පථයට බැහැරයි.ගරු සභාපතිතුමනි,අන්න ඒක ප්‍රශ්නයත් නෑ.සභාපතිතුමන්ලා කරන්න ඕන වැඩ.අපි ඒක දැනුවත් කිරීමක් විදිහට තමයි කළේ.

ඒ අනුව අස්ගගුල උතුර ග්‍රාම නිලධාරී වසමට සේවා පියසක් ලබා ගැනිම යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවට යොමු කිරීමට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මීළඟට 6.34සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ යෝජනාව.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.34.දිවුරුම්පිටිය රාජ්‍ය සේවක ගම්මානයේ මාර්ගයේ කෙළවර විමල් නානයක්කාර මහතාගේ නිවස අසල නාන ළිඳ සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි. (පවුල් 10 කට අධික ප්‍රමාණයක් මෙම ළිඳ භාවිත කරයි)**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ ළිඳවිශාල සංඛ්‍යාවක් පාවිච්චි කරන අතර ඒ ළිඳ පායන කාලේ පවා වතුර තියෙන ළිඳක්.එතකොට මේ පායන කාලේ වතුර හිඟ වෙනකොට ,ඒ ළිඳේ වතුර තියෙනවා.ඉතින් අපට නාන වතුර ප්‍රමාණය (වචන පැහැදිලි නෑ)මිනිසුන්ට භාවිතා කරන්න පුළුවන්කම තියෙනවා.ඒ නිසා මේ ළිඳ සංවර්ධනය කරන මෙන් ඉල්ලා සිටිනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එතුමාගේ යෝජනාව සම්බන්ධව එතුමා කිවුවා නාන ලිං සංවර්ධනය කළ යුතුයි කියලා.මං හිතන්නේ දිවුරුම්පිටියේ තව එකක් තියෙනවාඑතුමාගේ අවධානය යොමු වෙන්න ඕන.ඉතින් ඒක ප්‍රාදේශීය

සභාවෙන් සංවර්ධනය කරපු එකක්.එකෙ මේ දවස්වල ජල ප්‍රශ්නයක් තියෙනවා.ඒ ප්‍රදේශ වාසින් විසින් ඒ ළිද සුද්ද කරලා දෙන්න කියලා.මට ඒක ඒ ස්ථානයේ නම මතක නෑ.රේල් පාරත් එක්ක තියෙන නාන ළිඳ.පොදු නාන ළිඳක්.සභාවට එවල තියෙනවා මේක සුද්ද කරලා දෙන්න කියලා.අන්න ඒ ළිඳ ගැනත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව දිවුරුම්පිටිය රාජ්‍ය සේවක ගම්මානයේ මාර්ගයේ කෙළවර විමල් නානායක්කාර මහතාගේ නිවස අසල නාන ළිඳ සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (පවුල් 10 කට අධික ප්‍රමාණයක් මෙම ළිඳ භාවිත කරයි)

**සභාපතිතුමා:-**
මීළඟට 6.35සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ යෝජනාව.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි
**6.35.දිවුරුම්පිටිය සෙත්සිරි හාර්ඩ්වෙයාර් අසල සභාවට අයත් ඉඩමේ ගැමුණු මාවතට මායිම් දක්වා පස් කන්ඩිය කපා පැති බැම්මක් බැදීමට මම යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දිවුරුම්පිටිය සෙත්සිරි හාර්ඩ්වෙයාර් එක ආසන්නයේ තියෙනවා සභාවට අයත් ඉඩමක්.එතන තියෙනවා කලින් යම්කිසි අවස්ථාවක පස් ටිකක් ගෙනත් ගොඩ කරලා තියෙනවා.ඒ පස් ටික පාර දක්වාම බෑවුමක් විදිහට තියෙන්නේ.ඒ එක්කම සායනයක් තියෙනවා.ඒ සායනයට විශාල සංඛ්‍යාවක් එනවා.වාහන තදබද වෙනවා.එතන පාර පටුයි.ඒ පස් ටික ඉවත් කරෝත් සැකසීම පහසුයි.ඒ පස් ටික ඉවත් කරලා ,පැති බැම්මක් බඳ සකසා දෙන්න කියලා යෝජනා කරනවා.

ඒ අනුව දිවුරුම්පිටිය සෙත්සිරි හාර්ඩ්වෙයාර් අසල සභාවට අයත් ඉඩමේ ගැමුණු මාවතට මායිම් දක්වා පස් කන්ඩිය කපා පැති බැම්මක් බැදීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මීළඟට සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකරමැතිතුමාගේ 6.36යෝජනාව.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.36.දංකුඹුර පරගහවත්ත සිට මීගස්වල පන්සල දක්වා මාර්ගය පැති බැම් සහිතව ඉතිරි කොටස සංවර්ධනය කිරීම මම යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම පාර මේ වෙනකොට මං හිතන්නේ ¼ ක් පමණ ගරු මන්ත්‍රී සුජීව මහතා පැතිබැම්ම දෙපැත්තක් දාල සංවර්ධනය කරලා තියෙනවා.අඩි 27 ක් වගේ ප්‍රමාණයක.නමුත් මේ පාර කලින් කොන්ක්‍රීට් දාල තියෙන්නේ අඩි 6 ක් 8 ක් වගේ ප්‍රමානයකට දාල තියෙන්නේ.ත්‍රීවිල් එකයි බයිසිකලයයි මාරු වෙන්නත් බෑ.නමුත් සුජීව මන්ත්‍රීතුමා කිව්වා කරපුව කියන්න එපා කියලා.නමුත් කොන්ක්‍රීට් එකේ තරම කිව්වොත් හැමතැනම කැඩිලා ගිහිල්ලා තියෙන්නේ.ඒක කියන්නත් ඕන.ඉතින් ඒක පාරෙ යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ.මට හිතෙන්නනේ මිනිස්සු අපේ ජනතාව 800 ක් 1000 ක් පමණ ඒ පාරේ ගමන් කරනවා.බුළුගහපිටිය,දංකුඹුර,නැදුරන,පානදූර දක්වා මේ පාරෙන් ගමන් කරන්න පුළුවන්.හොඳ පාරක්.කෙටි මාර්ගයක් මේක.මේක සංවර්ධනය කර ගත්තොත් මේක කෙටි මාර්ගයක්,විකල්ප මාර්ගයක්.ඒ මාර්ගයෙන් පන්සලට හැමදාම,දහම්පාසල් දරුවෝද වැඩිහිටියොද මං හිතන්නේ හැම වෙලාවේම හැම මොහොතෙම යනවා.යන්න බෑ.හරිම දුෂ්කර පාරක් වෙලා.මං ඉතා ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ පිළිබඳව අවධානය යොමු කරලා සංවර්ධනය කරලා දෙන්න කියලා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ ගරු සුමිත් මන්ත්‍රීතුමා ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායකතුමා.ඇහැලියගොඩ ආසනයේ. බොහොම හොද යෝජනාවක් තමයි ගෙනාවේ.මං හිතන්නේ මීට කලින් මහින්ද චින්තනය තුළ බොහොම කැප කිරීම් කරලා හදපු පාරක්.කාපට් කරලා හදපු පාරක්.ඔබතුමා මං හිතන්නේ පාර නිරීක්ෂණය කරලා ඇති. ඇහැලියගොඩ බල ප්‍රදේශය තුළ වසම් 44 අඩි 24 ග්‍රාමීය මාර්ගයක් දැක්කොත් මං හිතන්නේ ඔබතුමන්ලා සාක්ෂි දරයි.දැකපු කට්ටිය පාර ගියානම් අඩි 24 ට පාර පළල් කරලා තියෙනවා.ගරු සභාපතිතුමාපැති බැම්මක් සහිතව. ඒකට ඒ මහින්ද චින්තනය තුළ ලැබුණු දායකත්වය අගය කරන්න ඕන.අතිගරු හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමා සිහිපත් කරන්න ඕනි.මේ සභාවේදී.ඒ වගේම ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාලගේ මැදිහත්වීමෙන් තමා අපි ඒ කටයුත්ත කළේ.ගරු වාසුදේව නානායක්කාර අමාත්‍යතුමා

ගරු පවිත්‍රා වන්නිආරච්චි අමාත්‍යතුමිය සිහිපත් කරන්න ඕනී. ඒනිසා ඔබතුමා ඒ සුමිත් මන්ත්‍රීතුමාගේ යෝජනාවට මං හිතන්නේ විශාල කැප කිරීමක් කරයි. අපේ නදුන් මන්ත්‍රීතුමාත් ඒකට උනන්දුවක් දක්වනවා.නදුන් මන්ත්‍රීතුමා මෙතන නොසිටියත් අපි එතුමා සිහිපත් කරන්ඩ ඕනි.එතුමාට ගෞරව කරන්ඩ ඕනි.ප්‍රණාමය පුද කරන්ඩ ඕනි.එතුමත් මේ සම්බන්ධව ඔබතුමාව දැනුම්වත් කරල ඇති. ඒ නිසා ඉතාමත්ම කඩිනමින් එතුමාගේ යෝජනාව මහ පොළොවේ යථාර්ථයක් කිරීමට ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා.බොහොම ස්තූතියි.

ඒ අනුව සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකරමැතිතුමාගේ 6.36දංකුඹුර පරගස්වත්ත සිට මීගස්වල පන්සල දක්වා මාර්ගය පැති බැමි සහිතව ඉතිරි කොටස සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
මීළඟට සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකරමැතිතුමාගේ 6.37 යෝජනාව.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.37.කෝට්ටගොඩ පාර පැතිබැම්ම සහිත පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා. :-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කෝට්ටෙගොඩ පාරත් මං හිතන්නේ ආණ්ඩු කිහිපයක්ම පැවතුණා.නමුත් ඒක ඒ පාරේ යම් ප්‍රමාණයක් කොන්ක්‍රීට් අතුරල තියෙනව,ඒ පාරෙ එතකොට ඊට මෙහා අතුරල තියෙන කොන්ක්‍රීට් නැවත කැඩිල ගිහිල්ල.ලොකු මඩ වලවල් සහිත පාරක් ඒක.ඒකෙ පැති බැම්මක් අනිවාර්යයෙන්ම හැදිය යුතුමයි. ඒත් එක්කම මේ පාරේ එහා කෙලවරට යනකං එදා ඉදන්ම ජනතාව ඉල්ලන්නේ ,කිසිම රජයක් මැදිහත්වෙලා නෑ මේ පාර හදල දිලා නෑ.කවදාවත් කිසිම කෙනෙක් මැදිහත්වෙලා නෑ. මං විශේෂයෙන් ඔබතුමාගෙ අවධානය යොමු කරල එම කටයුත්තත් කරල දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනව.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මමත් දාල තියෙනවා. ම හිතන්නේ 6.62 වෙනි එක. ඉතිං මමත් හිතනවා ඒ පාර ඇත්තටම කාලෝචිත සංවර්ධනය කරන්න පුළුවන් කාලෝචිත මාර්ගයක් කියලා. අවුරුදු ගණනාවකින් මං හිතන්නේ කිසිම සංවර්ධනයක් වෙලා නෑ. මං හිතන්නේ ලොකු මුදලක් වියදම් වෙන් නැති වෙයි. අඩුම තරමින් කැඩිල තියෙන්නේ එක හදල දෙන්න. ඔබතුමා අවධානය යොමු කරලා ආයෙ නැවත වාරයක් සාකච්ඡාවට ගන්න ඕනි නෑ කියල හිතෙනවා. මේ ඉතා කඩිනමින් සංවර්ධනය කරල දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකරමැතිතුමාගේ 6.37 කෝට්ටගොඩ පාර පැති බැම්ම සහිත පාර සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික ඒ.ඩී සුමිත් ප්‍රියංකර මැතිතුමාගේ 6.38.යෝජනාව
**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.38. දංකුඹුර හල්ගහ ඇල නාන තොටුපල පැතිබැමි සහිතව අලුත්වැඩියා කිරීමට මම යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම නාන තොටුපල මීට දැන් අවුරුදු විස්සකට විතර කලින් මේ ක හදල දුන්නේ, එවකට ජී.එම්.කරුණාපාල අපේ හිටපු ඇමතිතුමා මන්ත්‍රීතුමා. ඇත්ත වශයෙන් ම අපේ ගමේ අපි දරිද්‍රතාවයෙන් පෙලෙන අපි තාමත් ගම්වල කට්ටිය.අපි සාමන්‍යයෙන් ඇළට නොගියත් වැඩිපු ප්‍රමාණයක් ඇලෙන් තමයි රෙදි සේදීම නැම හැම කටයුත්තක්ම කර ගන්නේ.ඒ අවස්ථාවේ දැන් ඇළේ මේ වන විට ඇළේ බහින පඩි පෙලවල් ටික කැඩිලා ගල් මතු වෙලා.සාමාන්‍යයෙන් සුමානෙකට පාරක් හෝ මාසෙකට පාරක් හෝ කවුරු හරි වයසක කෙනෙක් වැටෙනවා.අතන බිඳුණ , මෙතන තුවාල වුණා කියලා අපට ඇහෙනවා.ඒ නිසා ඒක ඔබතුමා ගියොත් එහෙම ඔබතුමා හෙට කරන්න කියලා යෝජනාවක් දායිද දන්නේ නෑ.ඇත්තටම එතන නාන තැන ගමම නාන්නේ එතන.ඔබතුමා ගියොත් සමහර වෙලාවක පොඩි සංචාරයක් වශයෙන් මේක බලන්න.මේ සඳහා ඔබතුමාගේ කරුණික අවධානය යොමු කරලා මේක හෙට හදමු ද කියන මතයක් ඔබතුමාට ඒවි දැන්කොත් එහෙම.මං කරුණාකරලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.ඒ කටයුත්ත මගේ අනිත් කටයුතු දෙකට පොඩ්ඩක් ප්‍රමාද වුණත් කමක් නෑ.මේ කටයුත්ත ඉක්මනට කරල දෙන්න.මේකෙ පැති බැම්මි කියන්නේ පැති දෙකටම නෙමේ.අර බහින තැන දෙපැත්තේ ආරක්ෂාව සඳහා පැති බැම්මක් දාල අර පඩි පෙලවල් ටික නැවත ප්‍රතිසංස්කරණය කරලා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම මේ පැය භාගයක් හරි වෙන් කැරලා ඉදිරියේ දී ආසන්න දිනයක දී ඔබතුමා කැබ් රථයෙන් ස්ථාන පරික්ෂණයක් කරන්න.සුමිත් මන්ත්‍රීතුමා කිවුවේ අත්‍යවශ්‍ය කටයුත්තක්.ඇත්තටම අපේ

ප්‍රදේශයේ මිනිස්සුතාමත් ඒ ඇල තමයි පාවිච්චි කරන්නේ.ස්නානය කටයුතු සඳහා සියල්ලක්ම.ඒ නිසා ඔබතුමා මේ ස්ථානයට ඉක්මනට ගිහිල්ලා ඔබතුමාගේ මැදිහත් වීමෙන් මං හිතන්නේ ලොකු මුදලක් නම් යන්නෙ නෑ.පොඩි මුදලක් යයි.ඒ නිසා ඔබතුමා ඒකට මුලිකත්වය දීමට කටයුතු කරන්න.අපේ මගේ යෝජනාවත් පස්සට තියලා හරි කමක් නෑ ඒ වැඩේ කරලා දෙන්න.හොඳම කාලෝචිත යෝජනාවක් ඇත්තටම.බොහොම ස්තූතියි.

ඒ අනුව සභික ඒ.ඩී සුමිත් ප්‍රියංකර මැතිතුමාගේ 6.38. දංකුඹුර හල්ගහ ඇල නාන තොටුපල පැති බැම් සහිතව අලුත්වැඩියා කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.39.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.39.දෙහිගස් ඇල්ල මාර්ගය සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.බටහිර කලටුවාව(සංචාරක හා නිවාසවලට ඇති පාර)**

**සභික එච්.එල්.දීපාල් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දැන් මෙතන දිග්ගස් ඇල්ල කියන මෙතන ඉදන් ගූගල් මැප් එකෙන් බැලුවත් කි.මී.29.2 ක් තියෙනවා.අපේ මේ හේවායින්න බටහිර කලටුවාව කියන්නෙත් හරිම දුෂ්කර ග්‍රාම සේවා වසම්වල,අති දුෂ්කරම ගම්මාන දෙකක්.එතකොට මම හිතාගෙන හිටියේ තව යෝජනාවක් කරනවා මෙතනම මේ සම්බන්ධව.මොකද සමහර වසම්වල මන්ත්‍රිවරු දෙන්නෙක් තුන් දෙනෙක් ඉන්නවා.එතකොට මන්ත්‍රිවරු තුන් දෙනාගෙන් යොජනාවල් එනකොට මොකද මේ ඒරියා එක ලොකු ඒරියා එකක් දෙහිගස් ඇල්ල මාර්ගය කියන එක කිලෝමිටරයක් වගේ දුරක්තියෙනවා.ඒකෙ ගෙවල් 27 ක් තියෙනවා.ඒගොල්ලොඒ හරියේ ඒ වුණාට.භූමි ප්‍රමාණය ලොකු ප්‍රමාණයක් තියෙනවා.තේ වතු තියෙන්නේ.තේ දළු කඩනවා.ඉස්සෙල්ල ගිහින් තියෙනවා බටහිර කලටුවාවේ ඉස්කෝලෙ ළගට කි.මී. 1 වගේ දුර තමා පාර තියෙන්නේ.එතනින් එහාට පාර නෑ.අඩි පාර තියෙන්නේ.එතකොට දැන් සමහරක් වෙලාවට මෙතන කතා කරනවා පාර අඩි 8 යි.අඩි 24 ක් දක්වා තියෙනවා කියලා.හැබැයි කණගාටුවක් තියෙනවා ගෙවල්වල කි.මී.දෙක තුන හාල් මිටිය කරේ තියාගෙන යන මිනිස්සු ඉන්නවා.හරි ඒතකොට මේක කෙළවරක් හින්දා ඇත්තටම කිසිම සංවර්ධනයකට අඩුම තරමේ TO මහත්තයෙක්වත් ඒ ගමට යන්නෙ නෑ.මොකද යන්න එන්න යන කාලය යන නිසා. මොකද මේ ඇහැලියගොඩ ඉදල කි.මී.29 ක් තියෙනවා පාරේ. එතකොට එතනින් එහාට මැල්බෝන් වත්ත කියන එකට කවුරුවත් යන් නෑ.එතන නිවාස වගයක් තියෙනවා.එක වතාවක් යන්න තිබුණා.එතකොට ඒ වුණාට ඒකෙ සංවර්ධනයක් මොකක්වත් වෙලා නෑනේ.අවුරුදු 30 කින්වත් විදුලි බල්බයක්වත් දාල නෑ.ලබුගම ජලාශයේ ඉදන් උඩපැත්තෙ එතන ගෙවල් 78 ක් වගේ තියෙනවාවතු නිවාස. එතකොටඒ නිවාස ගරා වැටිල යන්න පුළුවන්,මිනිස්සු එතනින් පිට වෙන්න පුළුවන්.මිනිසුන් එතන ගම්වලින් පිට වෙලා ගිහිල්ලා තියෙනවා.එතකොට නිර්ණායකයක් විදිහට ගත්තොත් ඇහැලියගොඩ ආසනයේ විදිහට ගත්තොත් අපි මේ දරිද්‍රතාවලින් බලද්දී ආසනයක් විදිහට යටට යනව නම් එවයේ තියෙනදුෂ්කරතා හින්ද තමා ගොඩක් අපේ ආසනයක් විදිහට උනත් පහතට වැටිලා තියෙන්නේ.අපේ ගම්මාන ටික දියුණු කරන්න.මං යෝජනාවක් කරනවා අඩුමතරමේ මේ සභිකයෝ සියලු දෙනාටම යෝජනාවල් තියෙනවා.යෝජනාවල් තුනකින් දාල මට මේක ගොඩ ගන්න බෑ.අඩුම තරමේ මට යෝජනාවල් 7 ක් 8ක් වත් දාන්න අවශ්‍යතාවය ඕනේ වෙනවා.මොකද නැත්නම් අවුරුදු 30 ක් 40 ක් ගියත් මේ පාරවල් ටික හදා ගන්න බැරුව යනවා.යෝජනා එක් දාලා මම යෝජනා ගේන්නේ පාරවල් විතරයි.තව නාන තැන් තියෙනවා,සෞඛ්‍ය ගැටලු තියෙනවා.ඉතාම විශාල ගැටලු ටිකක් තියෙනවා.ඉතින් මං මේතනදී කියනවා දෙහිගස් ඇල්ල කියන්නේ එතන ගොඩක් කොළඹ දිස්ත්‍රික්කයෙන් එනවා.දෙහිගස් ඇල්ල එතන නාන ස්ථානයක් .එතකොට කොළඹ දිස්ත්‍රික්කයේ.ඒ කලාපය සංචාරක කලාපයක් කියලා නම් කරලා තියෙනවා.එතකොට ඇහැලියගොඩ ප්‍රදේශයට.....ඉතුරු යෝජනා ටික.මේක කාලෝචිතයි කියන්නේ මේක මෙතනින් මේ සභාවේ මුදල් වලින් කර ගන්න බැරි වෙයි.මේක ඉතා ඉක්මනින් කරන්න ඕන කාරණාවක්.කාලයක් තිස්සේ බලා ඉන්න් කාරණාවක් මේක.සම්බන්ධීකරණයට ඉතා ඉක්මනින් යොමු කරලා පියවරක් ගමු කියන අදහස යෝජනාව මං සභාවට ඉදිරිපත් කර සිටිනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ ජයසෝම මන්ත්‍රිතුමා කිව්ව වගේ ඇත්තටම මමත් ඔය පැත්තට ගිහිල්ල තියෙනවා.ඇත්තටම 100% ක් ම ඇත්ත සභාපතිතුමා වීදි පහන් දාගන්න අවස්ථාවක් නෑ.මං හිතන්නේ ඒ ප්‍රදේශයේ මහජන නියෝජිතයන් හිටියත්.මෙල්බොන් වත්ත කියන්නේ ඒ ප්‍රදේශය පාදුක්ක මායිම කෙළවර කවුරුවත් යන්නෙ නෑ.ඡන්දයක් ගන්නවත් යන්නෙ නෑ.ඒ නිසා අපේ ජයසෝම මන්ත්‍රිතුමාගේ යෝජනාවට සවන් දෙන්නකියලා ඔබතුමා ඒකටත් මුලිකත්වය දෙයි කියලා පොඩි දෙයක් කරමු අපි සම්බන්ධීකරණයට හරි දාල කතා කරල සභාපතිතුමා.
**සභාපතිතුමා:-**
ඔව් ඇත්තටම අපේ නිලධාරීන් කියන කතාවක් තමයි අපේ සභාවේ න්‍යාය පත්‍රය බෙදන්නවත් වාහනය යන්න බෑ කියලා.

ඒ අනුව සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.39.දෙහිගස් ඇල්ල මාර්ගය සංවර්ධනය කිරීමයෝජනාව ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(බටහිර කලටුවාවසංචාරක හා නිවාසවලට ඇති පාර)

**සභාපතිතුමා:-**
නැවතත් සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.40.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.40.මීසිබල් කැලේ නැරඹීම.බටහිර කලටුවාව හේවායින්න රක්ෂිතය නැරඹුම් ස්ථානයක් බවට පත් කිරීම.ඒ හරහා සභාවට ආදායම් ඉපයීම.යෝජනා කරමි.**

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි මේ සියලු දෙනාගේ යෝජනා තියෙන්නේ සංවර්ධන කටුයුතු මේ සියලු දේවල්වලට. ඇත්තටම සංවර්ධන කටයුතු කිරීමට මුදල් අවශ්‍යතාවයක් තියෙනවා.එතකොට මේ ප්‍රදේශයේ විදිහට මුදල් උපයන ස්ථාන ඒ කියන්නේ,ස්ථාන ගොඩක් අඩුයි.මං හිතන්නේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් ඒවගේ යෝජනා දාන්නවත් සමහරවිට යෝජනා දාන්න තරමටවත් ක්‍රමවේදයක් නෑ,ආදායමක් ලබා ගැනීමටත් ක්‍රම වේදයක් නැති නිසා මේක මට දැන් අපේ මන්ත්‍රී කණ්ඩායමේ මේකට දැම්ම.මං පොඩි වීඩියෝ එකක් කළා පසුගිය දවසක ගිහිල්ලා.ගරු සභාපතිතුමයි මායි ගියා ඒකේ කිලෝමීටරයක් පමණ දුරට.මේක සභාපතිතුමනි එක පැත්තක රක්ෂිතයක්.ඒ රක්ෂිතය පාර පුද්ගලික පාරක්.පුද්ගලික පාරක් තියෙන්නේ.මේකට වැඩිපිරිසකට ඇතුළට යන්න කාරණාවක් නෑ මේක ඇතුළට යන්න.අපි යෝජනාවක් කරනවා,වාහන ඇතුළට යන්නේ නැතුව එතන තියෙන නැරඹුම් මධ්‍යස්ථානයක්.ඒක ඇතුලේ.මේ රක්ෂිතය ඇතුලේ.අපිමේක මෙතනින් එහාට මේ යෝජනා ස්ථිර කරලා පරිසර කමිටු වලට දාන්න ඕනේ.වෙනම කමිටුවක් හදා ගන්න ඕන මේක බලන්න.ඒක ඇතලේ මම පොටෝස් වගයක් දැම්මා.ඒකෙ ඇතුළේ තියෙනවා හෝටල් වගයක්.එතන තියෙනවා ජල පෝෂක ප්‍රදේශයක් කිසිම ගැටලුවක් නෑ.කඳු බෑවුම් මෙහා පැත්තඒක අපිට නිරීක්ෂණය කරන්න් තියෙනවා.නිධන් ගල කියලා ලොකු ප්‍රමාණයක්.ඒක කාලෝචිතයි. ඒක සංචාරක කලාපයක් තියෙනවා උදේ වරුවක් විතර ඇවිදින්න තියෙනවා,සීතාවක උද්‍යානය .තුම් මෝදර එතන ඉදල කි.මී.4 ක් විතර වෙන්නේ.ඊළඟට කුමාරි ඇල්ල හරහා එන ඇළ මාර්ගය ඒ ඇළ මාර්ගය අපේ ඔය රක්ෂිතයේ ආසන්නම එකක්.මිනිස්සු නානවා එතකොට දවසකට අපිට කට්ටියක් ආවට පස්සේ ඉතුරු පැය තුන හතරක කාලයක් ඒ ගොල්ලන්ට දවස ගත කරන්න පුළුවන්.කාලයක් හදන්නපුළුවන්.අපේ ටිකට් එක හදා ගන්න. මේ එතකොට ඒක රක්ෂිතය පිරිස ගැවසෙනව නම් ඔය රක්ෂිතයේ ජාවාරම් ටිකත් ඔක්කොම නවතියි කියලා මං තරයේ විශ්වාස කරනවා.ඒ නිසා අපි මේකේඑන සම්බන්ධිකරණ කමිටුවටත් දාන්න වෙනවා.මොකද මේක සංවේදී කලාපයක් පරිසර පද්ධතියක්.මේක අක්කර 28000 ක් තියෙන භූමියක්.අක්කර 14000 ක්ම අපේ ඇහැලියගොඩ බල ප්‍රදේශයට අයිතියි. මොකද ඇහැලියලොඩ හදවත තමයි ඔය අක්කර 14000.ඔය ස්ථාන ගැන ඔයාල හොයල බලන්න ඒ මුළු රක්ෂිතය හැම පැත්තම නීතිමය පැත්ත උනත් ලොකු ගැටලු ටිකක් එන්නේ නෑ.මොකද පුද්ගලික පාරක්.ඕක ගොඩක් දුර තියෙනවා.මොකද නැරඹුම් මධයස්ථානයක් සුද්දා හදපු ගල් බංගලාවක් තියෙනවා.එතන ඉදලා මුළු කොළඹ පැත්ත සැහෙන ඒරියා එකක් තියෙනවා.මං වීඩියෝ එකක් දාල තියෙනවා.මම පොටෝ ටිකක් දාල තියෙනවා බලන්න පුළුවන්.අපි මේක සම්බන්ධිකරණ කමිටුවට සභාපතිතුමා අරන් යන්න.අපි එතනින් තීරණයක් ගමු.තීරණය අරගෙන මොකද එතනින් එහාට ඒ සම්බන්ධ තීරණය අරගෙන අපි මේ සංවේදී කලාපයක් ඒක නිසා දැඩි අවධානය කරන්න ඕන.අපි ආදායම් උපය ගත්තට විතරක් මදි.ඇහැලියගොඩ තියෙන හදවතක් වෙන් පුළුවන් මේක.මොකද අපි ඉදිරි පරම්පරාවට ඉතිරි කරන්න ඕන.මේක ඒ හින්ද අපි සම්බන්ධිකරණයට දාල ඒ ඉතුරු වැඩ ටික කර ගන්න ඒ අංශවල සහයෝගය ලබා ගමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තතටම් ඒක එකතු කරනව නම්.සම්බන්ධිකරණයට දාන්න.මොකද ඊලඟ බජෙට් ප්‍රොපෝසල් එක හදවන්න.බජට් එකේ දී තමයි ඔය යෝජනාව වැදගත් වෙන්නේ.ඒක හදලා. අනිත් එක මං දැන ගන්න කැමතියි ලබුගම කලටුවාව ජලාසේ රක්ෂිතයද?

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
රක්ෂිතයට තමා.රක්ෂිතයේ මෙතන අක්කර 1000 ක් විතර ප්‍රමාණයක් තියෙනවා.පෞද්ලික වතු. හිමිකාරිත්වය 50-150 එහෙම තියෙන්නේ.ඒවායේ හොටෙල් තියෙනවා දැනටමත්.රම්බාස් කියන හොටලය බලන්න පුළුවන් ගූගල් වලින්.ඒක රක්ෂිතයේ තියෙන්නේ.ඒකේ ඒ පැත්ත ගොඩක් රක්ෂිත වෙලා තියෙන්නේ.ඒකෙ තියෙනවා ලොකු වගාවල් තියෙනවා අක්කර 30-40 අගාවුඩ් වගාවල් තියෙනවා.තේ වගාවල් තියෙනවා කුරුඳු වගාවල් තියෙනවා.ඒක ලොකුවතු විදිහට තියෙන්නේ.ඉතින් අපිට ගැටළුවක් වෙන්නේ නැත්තේ ඒ රක්ෂිතය තමා.රක්ෂිතයේ එක පැත්තක් බෑවුමක් තියෙනවා.ජල පෝෂිත ප්‍රදේශයෙන් ගලා එන වතුර කිසිවකවක් මේ ජලාශයට යන් නෑ.එතන ලොකු හානියක් වෙන් නෑ.කාලයක් පාවිච්චි නොකරපු හින්ද මහා මාර්ග නැති හින්ද පෞද්ගලික වතු කැලෑ වැදිල රක්ෂිත වෙලා.දැන් අපිට ඒවා, ඒ ගොල්ලෝ පොඩි පොඩි වතු නෙමේ හින්ද අක්කර 150-200 වතු ඒගොල්ලෝ කැමති ඒවා ඒ විදිහටම තියාගෙන සංචාරක හෝටල් වලට පත් කර ගන්න.එතකොට අපි යෝජනා කරන්නේ කිසිම වාහනයකට ඇතුළට යන්න බෑ.හැබැයි හොටෙල්වලට යන වාහනවලට අපිට අවසර දෙන්න වෙනවා.එතකොට අපි මේකේ නැරඹුම් මධයස්ථාන විදිහට පාර කපලා හදලඔක්කොම කරලා තියෙන්නේ.අපිට මේකෙ තියෙන්නේ ආදායමක් ගන්න ටිකට් එකක් කඩා ගන්න විතරයි තියෙන්නේ.අපිට මේකෙ ලොකු වියදමක් කරන්න වෙන් නෑ සභාපතිතුමා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මං හිතනවා මේ යෝජනාව විෂය පථයට ආවේ අපේ බල ප්‍රදේශයේ තියෙන හින්දා. මේ යෝජනාවේ සංවර්ධන කටයුතු කරන්න ඕන විෂය පථයෙන් පිට.ඒ වගේම මේ යෝජනාවට අදාළ ව්‍යාපාති තියෙනවා,මේ වගේ පරිසර අමාත්‍යාංශයට අදාළ ව්‍යාපෘතිය හරහා මෙය සංවර්ධනය කරන්න කටයුතු කරන්න ගන්න ඕන.සංචාරක අමාත්‍යාංශය හරහා මේ ව්‍යාපෘතිය සංවර්ධනය කරන්න ගන්න ඕන.වනජීවී හා වන සම්පත් අමාත්‍යාංශ  හරහා මේකට සම්පත් ලබා ගන්න පුළුවන්.ඒ නිසා මේ යෝජනාව කාලොචිතයි.ඒක ප්‍රාදේශිය සභාවට ආදායම් උත්පාදන කරන යෝජනාවක්.ඒකත්ඒක එතුමාගේ මේ යෝජනා හරහා මෙතුමා අපේක්ෂා කරනවා.මං මාවත් සකස් කර ගන්න ලොකු පාදකයක් කර ගන්න පුළුවන් එකක්.මේකට ප්‍රමුඛතාවය දීලා, සම්බන්ධිකරණයට එහා ගිය අනෙකුත් අමාත්‍යාංශ එක්ක සාකච්ඡාවට භාජනය කරලා  මේ කටයුත්තට ප්‍රෙවිශයක් ගන්න.එතකොට මේ ප්‍රදේශය සංවර්ධනය වෙනවා.ප්‍රාදේශිය සභාවට ආදායමක් උත්පාදනය කරන්න මාර්ගයක් බවට පරිවර්තනය කර ගන්න පුළුවන් වෙනවා.මේක හොඳ යෝජනාවක් මේක හරහා ප්‍රදේශය සංවර්ධනය කර ගන්න මූලික සේවාවක් වෙනවා.ඒ නිසා මේක හරහා මේ ප්‍රදේශයට සංවර්ධනය කරන්න පුළුවන්.මේ අදහස මං සභාගත කරනවා.

**සභික සුජීව විජේසූරිය  මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ ජයසොම මන්ත්‍රීතුමා බොහොම කාලීනයෝජනා කිහිපයක්ම  ඉදිපත් කළා. එම ඔබතුමා අදහස් විදිහට ඉදිරිපත් කරනවා.අපි මෙතුමාට අපේ සභාවේ නිලධාරියෙකු හෝ වෙනත් නිලධාරියෙකු සම්බන්ධ කරගෙන ප්‍රොජෙක්ට් ප්‍රොපෝසල් එකක් හදන්න කියමු.ඒකට ඔබතුමාගේ නායකත්වය දීලා සහයොගය දෙන්න.ඒ ප්‍රොජෙක්ට් ප්‍රොපෝසල් එක අපි සභාවෙන් අනුමත කරගෙන අපි ඉදිරියේ අතුරලිය මන්ත්‍රීතුමා කිවුව වගේ සංචාරක අමාත්‍යාංශය වෙන්න පුළුවන්,වන ජීවී අමාත්‍යාංශය වෙන්න පුළුවන් ඒ වගේ අපි ජාතින වැඩපිළිවෙලක් තියෙනවනේ.එතකොට ඔබතුමාට පුළුවන්නේ අපේ සම්බන්ධිකරණ කමිටු සභාපතිතුමිය ඉන්නවා එතකොට අපේ සංස්කෘතික ඇමතිතුමාත් ඉන්නවා.සංස්කෘතියටත් ඒක බලපානවා.එතුමා අපේ  රටේ සංස්කෘතිය පිළිබඳ විශේෂ සාකච්චාවක ඉන්න අවධියක් මේ රටේ.දැන් සීගිරිය සම්බන්ධව දැක්ක අපි එතුමාලගේ කැප කිරීම.ඒ වගේ. මං හිතන්නේ අපි ප්‍රොජෙක්ට් ප්‍රොපෝසල් එකක් හදන්න.ඔබතුමා ඒකට නායකත්වය දීලා ඒකට නිලධාරී මණ්ඩලය අවශ්‍ය පහසුකම් ටික සම්පාදනය කරලා දෙන්න.

**සභික ටී.ඩී.වජිර  සුසන්ත ජයසෝමමැතිතුමා:-**
දැනටමත් ඒක හදලා තියෙන්නේ.

**සභික සුජීව විජේසූරිය  මැතිතුමා:-**
අන්න රයිට් හොඳ අදහසක් අන්න ඒක ක්‍රියාත්මක කරමු.ඒක මං හිතන්නේආදායම් උත්පාදනය කරන්නහොඳම අවස්ථාවක් වෙයි.ඒක

**සභික ටී.ඩී.වජිර  සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ඔබතුමාට ඒක බලන්න පුළුවන් වෙයි.

**සභික සුජීව විජේසූරිය  මැතිතුමා:-**
හොඳයි පස්සෙ බලමු සභාව ඉවර වෙලා.

**සභාපතිතුමා:-**
බොහොම ස්තුතියි.අපට ලොකු යෝජනාවක් ගෙනාවේ.විශේෂයෙන්ම ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව කිවුවහම අපට ඓතිහාසික ස්ථාන හරි අඩුයි.අපිට තියෙන ඒවා තියෙනවා.අපි ඒවා ප්‍රයෝජනයට ගන්නෙ නැති එක තියෙන්නේ.ඇත්තටම අපි මේක මෙතනට හරි දැම්මේ පොඩි හරි උත්තේජනයක් ඇති කරන්න තමයි.ඇත්තටම මේක විශේෂයෙන්ම දිලීන් මන්ත්‍රීතුමා කිවුව වගේ 2026 බජෙක්ට් එකට විශේෂයෙන් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරිමට අවශ්‍ය තොරතුරු සොයා යනකොට තමයි අපට ඕක හමු වුණේ.අපි මේක ඉදිරිපත් කරන්න සංවර්ධන කමිටුවට යෝජනාවලට අපිට උත්තේජනයක් ඇතිවෙන්න තමයි අපි මේක මෙතනට ඉදිරිපත් කලේ.

ඒ අනුව සභික ටී.ඩී.වජිර  සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.40.මීසිබල් කැලේ නැරඹීම.බටහිර කලටුවාව හේවායින්න රක්ෂිතය නැරඹුම් ස්ථානයක් බවට පත් කිරීම.ඒ හරහා සභාවට ආදායම් ඉපයීම යෝජනාව ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
නැවතත් සභික ටී.ඩී.වජිර  සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.41.

**සභික ටී.ඩී.වජිර  සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.41.හිඟුරහේන වූලරත්න මහතාගේ නිවස ළඟ සිට හිඟුරහේන පාසල දක්වා පාර සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.හේවායින්න බටහිර කලටුවාව.**

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර  සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක ටිකක් ලොකු කන්දක්.ඒක නිසා මේක උඩ ගම්මානෙ ගෙවල් 67 ක් තියෙනවා.ත්‍රිරෝද රථ 12 ක් තියෙනවා.මේ ත්‍රිරෝද රථ 12 ම පල්ලෙහා ගෙවල්වල දාල තමා මේ මිනිස්සු උඩහට යන්නේ.හැබැයි ඒ පාර කපලා තියෙනවා.දැන් වාහන යන්න සුදුසු තත්ත්වයක නෙමේ තියෙන්නේ.ඒක කිලෝමීටරයක වගේ

පාරක්.අඩි8 ක පාරක් තමා අපිට යන්න වෙන්නේ.ටිකක් කඳු සහිත ප්‍රදේශයක් මොකද මෙතන ගෙවල් 67 ක් තියෙනවා.සාමාන්‍යයෙන් ඉස්කොලෙ යන ළමයි ඉන්නවා.කි.මී 2ක 3ක් පයින් එනවා.කන්දක් පල්ලමට තමයි එන්නේ.මොකද වෙන මාර්ගයකුත් තියෙනවා.ඒක සංවර්ධනය කරන්න අපට කිසිසේත්ම හැකියාවක් ක් නෑ.මොකද ඒක වතු සමාගම් හරහා තියෙන කි.මී.3 ක විතර පාරක්.ඒක මං ඊයෙ නිරික්ෂණයට ගියා බලන්න.මේ යෝජනාව නිසාම ඒක සංවර්ධනය කරන්න නම් අපට මිලියන ගානක් වියදම් කරන්නවෙනවා.එතකොට මේ ගොල්ලන්ට කෙටි පාරක් විදිහට ලොකු වාහනයක් යන්න බැරි වුණත් ත්‍රිරෝද රථයක් වගේ ධාවනය කරන්න පුළුවන් අඩි 8 ක පාරක් සංවර්ධනය කරන්න යෝජනා කරන්නේ.මේකෙ පිරිස 300 ක් විතර ඉන්න ගම්මානයක්.ගෙවල් 67 ක් තියෙනවා.ඉතින් මේකෙ ඉදිකිරීමක්වත් කරන්න ගල් ටිකක්වත් අරන් යන්න බැරි නිසා තමයි සල්ලි තියෙන මිනිසුන්ටවත් වැඩක් කර ගන්න බැරි තත්ත්වයක් තියෙන්නේ.ඒකත් මං හිතන්නේ මං සභාවෙන් කරන්න යෝජනා කළාටප්‍රතිපාදන මදිනම් අපි එතනින් එහාට යන ක්‍රමවේදයක් ,සභාපතිතුමනි මෙය ඉතා ඉක්මනින් කර ගන්න ඕන කාරණා නිසා මම මුලින්ම කතා කරපු මට තියෙනවා මට තියෙනවා මට යෝජනා මේ ගොල්ලෝ කියනව නම් මට වැඩිපුර දාන්න සභාවට ඉල්ලීමක් කරනවා.එහෙම නැත්නම් අපේ මේ වම්පැත්තෙ ඉන්න මන්ත්‍රීතුමලත් ඉන්නවනේ.සියලුම අය ඒගොල්ලොලාවත් ඒගොල්ලන්ගේ යෝජනා අරන් ඔයාල යෝජනා ටිකක් ගේන්න.මොකද ඔයගොල්ලෝ මේ ටවුමේ ප්‍රදේශයේ,මේ භූමිය විතරක් සංවර්ධනය වෙලා මදි කියන මතේ ඉන්න මට මේ ඔබතුමාලා ඔක්කොමගේ ම නියෝජිතයෝ ඒ පැත්තෙ ඉන්නවා අපේ සභිකයන්ගේ.ඡන්දෙට ඉතින් ඉදිරිපත් වුණාණේ.එතකොට ඒඒ ගොල්ලනුත් යොජනා අරගෙන මොකක් හරි කරලා ඒ ගොල්ලන්ටත්,ඔබතුමන්ලා ඒ ගොල්ලන්ට පොඩ්ඩක් කියලා යෝජනා කීපයක් ගේන්න කියනව නම් ඉතාමත් සුදුසුයි කියලා යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං හිතන්නේ වෙන කෙනෙක් යෝජනා කරන්න ඕන් නෑ.ජයසෝම මන්ත්‍රීතුමාම යෝජනා කරන්න.ඔබතුමා මං හිතන්නේ මං පුද්ගලිකවම දන්නවා ඔය කියන කාරණය. මං දන්නවාමොකද බටහිර කලටුවාව හේවායින්න ප්‍රදේශය ඇත්තටම හිටපු මන්ත්‍රීවරු වැඩ කරලා නෑ කියන්න බෑ.එයා කරේ නෑ මෙයා කරේ නෑ කියන්න බැතහැබැයි එතුමාලා යම් මට්ටමකට කරගෙන ආවා.ඔබතුමා ඊට මැදිහත් වෙලා ඔය උනන්දුව සහ වැඩ පිළිවෙලත් එක්ක මෙතුමාට තව අවස්ථාවක් දෙන්න.මම නම් ඒකට පුද්ගලිකව එකගයි.

ඒ අනුව සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.41.හිඟුරහේන වූලරත්න මහතාගේ නිවස ළඟ සිට හිඟුරහේන පාසල දක්වා පාර සංවර්ධනය කිරීම (හේවායින්න බටහිර කලටුවාව) යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලගට සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බංඩාර මැතිතුමාගේ 6.42. යෝජනාව

**සභික අයි.එච්.රණවීරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඩබ්.එම්.අමිල් නිමේෂ බංඩාර මැතිතුමාඅද දින නිවාඩු අනුමත කරගෙන ඇති බැවින් එම යෝජනාව මා විසින් සභාවට ඉදිරිපත් කරනවා.

**6.42.ගැටහැත්ත පොල භූමියට ATM/CDM යන්ත්‍රයක් ලබාගැනීමටකටයුතුකිරීමට මම යෝජනා කරමි.**

**සභික එච්.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික අයි.එච්.රණවීරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ග්‍රාමීය නගරයක් සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා.ගැටහැත්ත වටේ කට්ටිය ගෙන්න ගන්න ඕන.එතකොට හේවායින්න පාර,එතන මුරුතැන්ගල පැත්තේ පාරෙන් ගෙන ගන්න ඕන.ඒක සංවර්ධනය කරද්දි ඉතා වැදගත් දෙයක් තමයි.මේක හොඳ අදහසක්. එහෙම නැත්තම් අවිස්සාවේල්ලට යන්න ඕන.එතන තියෙනව නම් මිනිස්සුන්ට එතනින් සල්ලි අරගෙන කඩවල් වලට වියදම් කරලා හැදෙනවා ආර්ථිකයක්එතකොට. එනිසා යම්(පැහැදිලි නැ) කියන එක අපේ වැඩපිළිවෙලේ කොටසක් කියන එක

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමන්,අපි මේ යෝජනාවට අනුමැතිය දුන්නත් කිසිම ගැටලුවක් නෑ.කොහෙමද කරන්නේ.එතකොට අපි බලන්න මේ ATM යන්ත්‍රය හා CDMයන්ත්‍ර මේ අපේ මේ මං කියන්න හැදුවේ බෙදීමක් කතා කරන්න නෙමේ.මේ මං කියන්නේ අපේ පනත හෝ රීතිවල තියෙනවද?එතකොට අපි මේ දිය යුතුයි.ඉතින් ඒක නිසා මේක සභා භූමියේ සංවර්ධන කටයුත්තක්.අපි එකඟයි.වියයුතුයි. මේ අදහසක් විදිහට කියන්නේ අපි මේ පනත අල්ලගෙන ඉන් නැතුව මේක ප්‍රායෝගිකව අපි ඉඩ දෙමු.මෙහෙම දීලා ඔබතුමා ඉස්සරහට අරන් යන්න.යෝජනා අවත් ප්‍රශන තමයි.එක්කෙනෙක්ගෙන් තුන ගානේ ආවත් මේක ප්‍රශ්න.අපි දන්නවා. අපි යෝජනා කරමු.හැබැයි ඉතින් ATM යන්ත්‍රයක් අපිට ගැටහැත්තට එපැයි.අවශ්‍යයි.එතකොට එතකොට අපිට අරෙකෙ නෑ මේකෙ නෑ. අපි අපට තියෙන්නේ මොකක්ද සභාපතිතුමාට තියන්නේලංකා බැංකුව හෝ මහජන බැංකුව නැත්නම් NSB එකට හෝ ප්‍රොපෝසල් එක දාන්න.නැත්නම් අපි ඔයාලට අවස්ථාව දෙනවා අපේ භූමිය අපි දෙනවා,අපේ පහසුකම් ටික අපි දෙනවා. අපේ විදුලිය,අපි විදුලිය දෙද්දි ඒ කට්ටියගෙන් අය කර ගන්න ඕන.ඔච්චරයි.ඒවා සරල කාරණා .ඔබතුමා ඒකට මැදිහත් වෙලා ඒ වැඩේ කරන්න.ඒක හොඳයි.

ඒ අනුව සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බංඩාර මැතිතුමාගේ 6.42.ගැටහැත්ත පොල භූමියට ATM/CDM යන්ත්‍රයක් ලබාගැනීමටකටයුතුකිරීමයෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මම ඉල්ලා සිටිනවා අපේ උපසභාපතිතුමාට මුලාසනයට එන්න කියලා යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**
මී ලගට සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ 6.43. යෝජනාව

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**
මන්ත්‍රීතුමනි සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර විජේසිංහ මැතිතුමාඅද දින නිවාඩු අනුමත කරගෙන ඇති බැවින් එම යෝජනාව මා විසින් සභාවට ඉදිරිපත් කරනවා.

**6.43. පලිගල කළුවල කුඩා දිය පහර අසලට වැසිකිලියක් හා ඇඳුම් මාරු කරන ස්ථානයක් ඉදි කිරීමට මම යෝජනා කරමි.**

**සභික ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**
ඇත්තතටම මං තමයි මේ යෝජනාව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වුණේ.පලිගල කළුවල කියන්නනේ මේ ප්‍රදේශයට තියෙන,පායන කාලෙටත් වතුර තියෙන,නාන්න පුළුවන් තැනක්.එතකොට එතන්ට ලොකු පිරිසක් එනවා.ඇහැලියගොඩ,රත්නපුර.ඒ හැම තැනකින්ම.එතකොට අපිට එතන සංවර්ධනය කරන්න පුළුවන්නම් අපට ආදායම් උත්පාදන මාර්ගයක් හැටියට අපිට ඒය,සභාවට ආදායමක් ගන්න පුලුවන් නිසා තමයි අපේ නදුන් මන්ත්‍රීතුමා ඒක යෝජනා කරන්නේ.අපි ඒ වැඩේ කරමු නේද?

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු වැඩ බලන සභාපතිතුමනි,ගරු උපසභාපතිතුමනි,අපි ඇත්තටම සතුටු වෙනවා ඔබතුමා බලාපොරොත්තු වුණාටත් වඩා කෙටි කාලයකදී සභාපති පුටුව හිමි වීම පිළිබඳව.ඒ වගේම එම යෝජනාව බුළුගහපිටිය වසමේ කොටසක්.ගරු උපසභාපතිතුමනි, එම කොටස බුළුගහපිටිය වසමේම කොටසක්.ඒ හින්ද අපි සතුටු වෙනවා.අපේ පලිගල නදුන් මන්ත්‍රීතුමා යෝජනාව සභාවට ගෙනාව,අපි අනුමත කළා.ඉතාමත් ඉක්මනින් ඒ කටයුතු සිද්ධ කරන්න.ඔබතුමා සභාවට ගෙනාපු පළවෙනි යෝජනාව සභාපති වෙලා.ඉතාමත්ම ඉක්මනින්ම ඒකට ප්‍රතිපාදන වෙන් කරලා දෙන්න කියලා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,ඒ වෙලාවේ මේ යොජනාව මං සභාවේ ඉන්න කොට ගෙනාවා.දේශීය සංචාරය සඳහා කටයුතු කරන්න සුදුසුයි කියලා.මේ යෝජනාව අපේ පලිගල නදුන් මන්ත්‍රීතුමාගේ යොජනාව කාලෝචිතයි.සභාවට ආදායම් උත්පාදනය කරන මාර්ගයක් වගේ ම,ඊලහට ඔය ස්ථානය කියන්නේ මත්ද්‍රව්‍ය භාවිතා කරන විශාල වැරදි ක්‍රියාවන්ට යොමුවන ස්ථානයක්.ඒ ස්ථානය අපි මේ විදිහට අරගෙන මේ කටයුත්ත කළොත් සභාවට ආදායමක් සේම ප්‍රදේශයේ ඉන්න තරුණ තරුණියන්ගේ ඒ නොමග යන එක නැති වෙනවා.ඒ වටා ඉන්න මිනිසුන්ගේ ආර්ථිකය ශක්තිමත් වන තැනක් බවට පත්වෙනවා.ඒ නිසා ඔබතුමාගේ යෝජනාව ස්ථිර කරමින් අදහස් දක්වමි.ඒ සඳහා කටයුතු කරන්න.මොකද අපේ මන්ත්‍රීවරු ගණනාවක් ගෙනා යෝජනා අතර ඉතා වැඩි සංඛ්‍යාවක් කරගෙන යන්ඩ බෑ.නමුත් සභාවේ සංවර්ධනය උදෙසා ගේන යෝජනාවට මුල් තැන දීලා කටයුතු කළොත් බොහෝ වැදගත් කියන එකත් මේ වෙලාවේ මතක් කරනවා.අපි විපක්ෂයේ විදිහට නෙමේ, සභාවේ සංවර්ධනය කියන එක අපෙත් සංවර්ධනය කියනවා.බොහොම ස්තූතියි.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,නදුන් මන්ත්‍රීතුමා ඒ,අපි දෙන්නා එකට කටයුතු කරන පලිගල කොට්ඨාහයේ.මං හිතන්නේ,ඔබතුමත් එක පැහැදිලි කලා.පායන කාලෙට පලිගල කොට්ඨාශයේ විතරක් නෙමෙයි,ඇහැලියගොඩ කොට්ඨාශයෙනුත් බහුතරයක් යනව ඒකෙ නාන්න.එතන විශේෂ ස්ථානයක්. පිට පළාත්වලින් පවා කට්ටිය එතනට පැමිණිලා,බෝපැත්ත දිය ඇල්ලට හා සමානව එතනට ඇවිල්ල යනවා.විනෝදය සඳහා එනවා.නදුන් මන්ත්‍රීතුමා කියලා තියෙන්නේ වැසිකිළි පහසුකමක් හා ඇඳුම් මාරු කරන තැනක්.මං හිතන්නේ එතනිනුත් එහාට ගිහිල්ලා මොකක් හරි සංවර්ධන කටයුත්තක් කරලා සංචාරකයින් පවා එන විදිහේ කටයුත්තක් කරන්න අපිට හැකියාවක් තියෙනව නම්,ඒ ස්ථානයට ගිහිල්ලා ස්ථානීය පරීක්ෂනයක් කරලා එතන්ට යමක් කරන්න පුලුවන් නම් සභාවට හොඳ ආදායමක් ගන්න පුළුවන් ස්ථානයක් බවට පත් වෙනවා.මං හිතන්නේ ඒ ගැන සැලකිලිමත් වෙලාපොඩ්ඩක් මීට පුළුල්ව කටයුතු කළොත් තව හොඳයි කියලා මං හිතනවා.

.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**
බොහොම ස්තූතියි මන්ත්‍රීතුමා
ඒ අනුව සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ 6.43.පලිගල කළුවල කුඩා දිය පහර අසලට වැසිකිලියක් හා ඇඳුම් මාරු කරන ස්ථානයක් ඉදි කිරීමට යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**
මී ලගට සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ 6.44. යෝජනාව

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**

ගරු මන්ත්‍රීතුමනි සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර විජේසිංහ මැතිතුමාඅද දින දිවාඩු අනුමත කරගෙන ඇති බැවින් එතුමාගේ දෙවන යෝජනාව ද මා විසින් සභාවට ඉදිරිපත් කරනවා.

**6.44. ඇහැලියගොඩ පොල භූමියෙහි ඇති ශාලා දෙකෙන් එකක් ආදායම් උත්පාදන කාර්යක් සඳහා යොදා ගැනීමට මම යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රීතුමා:-**
ඒකත් මමයි යෝජනා කරන්න හිටියේ.ඇත්ත වශයෙන් ම ගත්තොත් එතන පොල භූමියේ ශාලා දෙකක් තියෙනවා.මීට කලිනුත් සභා වලදී ඇත්තටම අපි කතා කළාඅපි හිටපු මන්ත්‍රීවරු දන්නවා.එක ශාලාවක් එක ශාලාවක් කියන්නේ පොල භූමියට යොදා ගන්නා අපි එක ශාලාවක් මොකක් හරි ආදායම් උත්පාදනය කරන්න ගමු කියන අදහස කාළෙක ඉඳන් තියෙනවා.ක්‍රියාත්මක කරන්න බැරි වුණා.මං හිතන්නේ දැන් ඇත්තටම මේ යෝජනා වෙනකොට ඒ ගොල්ලන්ට අසාධාරනයක් කරන්න නෙමෙයි.මමත් ගත්තොත්,මගේ .තාත්තත් ඇත්තටම පොළේ වෙළෙන්දෙක්.ඇත්තටම පොල එතන තියෙද්දිත් අපේ තාත්තා පොළේ එළවළු දැම්මා.අනිවාර්යෙන්ම අපි ඒගොල්ලන්ගේ ව්‍යාපාර අපි ආරක්ෂා කරන්න ඕන.ඒත් එක්කම අපි එතනින් සභාවට අදායමක් ගන්න ඕනි. එතකොට අපි ගත්තොත් එහෙම ශාලා දෙකෙන් එකක් කියන එක මගේ අදහස අපි කතා කර ගන්න පුලුවන්.කොයි එකද කියලා.පොලට ලොකු ප්‍රමුඛත්වයක් දෙන නිසා අපට ඉස්සරහ ශාලාව පොලට අරන් අපිට පිටිපස ශාලාව අපිට ආදායම් උත්පාදනය සඳහා යොදා ගන්න පුළුවන්.අපි සාකච්චා කරමු.දැන් යෝජනා කිහිපයකුත් ඇවිත් තියෙනවා ව්‍යාපෘති යෝජනා ටිකක්,ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සඳහා රැස්වීම් ශාලාවක් සඳහා එතකොට ඊටපස්සේ වෙඩින් හෝල් වගේ.අඩු ආදායම්ලාභීන්ට.ඒ වගේ යෝජනා කිහිපයක් ඇවිල්ලා තියෙනවා.අපි මෙතනදි කතා කරලා අපිට මෙතනදී පුළුවන් වෙයි අපිට හොදම දේ මොකද්ද කියලා.ඇත්තටම ඔය ශාලා දෙකේම ඉන්නෙ වෙළෙන්දො 35 දෙනෙක් වගේ .සෑහෙන ලොකු ඉඩක් තියෙනවා. ඒකේකඩකාමර මං හිතන්නේ තියෙනවා 100 කට වඩා තියෙනවා.ශාලා දෙකේම 100 කට වැඩියි.අපට පුළුවන්නම් මේ වෙළෙන්දො ටික වෙළඳමහතුන් ටික එක ශාලාවකට අරගෙන,අපට එක ශාලාවක් ආදායම් උත්පාදන මාර්ගයකට ගන්න පුළුවන්.මොකද අපිට සභාවක වැඩ කරන්න මුදලුත් එපැයි නේද?ඒ නිසා ඔබතුමන්ලගේ අදහස් ඉදිරිපත් කරන්න.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,ඒ අදහසට ඔබතුමා යෝජනා කිහිපයක් කියනවා.මං හිතනවා අපේ තිබ්ච්ච ග්‍රවුන්ඩ් එකක් තමා පොල භූමිය කළේ.ඒක වැරැද්දක් නෙමෙයි මම කියන්නේ.මේ වෙලාවේ අදහසක් කියන්නේ.ලංකාවේ වැඩි ප්‍රමානයක් ගෘහස්ථ ක්‍රිඩාවට පුරුදු වෙලා තියෙනවා.ඔබතුමා දැක්කද දන්නැ,දංදෙනිය පාරේ ගෘහස්ථ ක්‍රිඩාපිට්ටනියක් තිබ්බා.මං හිතන්නේ පැය 24 ම වගේ මේක පැය දෙකෙන් දෙකට මුදල් බැදලා කට්ටිය සෙල්ලම් කළා.මං හිතන්නේ මං ඒක සභාවේ යොජනාවක් හැටිටම ගේනවා එම ශාලා දෙකෙන් එකක් ගාහස්ථ ක්‍රිඩාංගනයක් විදිහට හැදුවොත් හොදයි කියලා මං හිතන්නේ.සභාවට නොහිතන ආදායමක් අපට ලබා ගන්න පුළුවන්.මොකද සෙනසුරාදා ඉරිදා විශේෂයෙන් උදේ 8 ට පටන් ගත්තොත් රාත්‍රි 12 දක්වා අපි දැක්කා දංදෙනිය පාරේ තිබ්ච්ච ගාහස්ථ ක්‍රිඩාංගනය. මේක මං හිතන්නේ පැය දෙකට රුපියල් ගානක් අය කළා.පැය දෙකෙන් දෙකට දෙකෙන් දෙකට රෑ 12 වෙනකම් වගේ.හොද ආදායමක් අපට ගන්න පුළුවන්.විශේෂයෙන්ම සෙනසුරාදා ඉරිදා.ඊට අමතරව සතියේ දවස්වලත් අපට ඒ දේ කරන්න පුළුවන්.නමුත් ඒ දවස්වලත් සතියේ දවස්වලත් ඒක ලබා ගන්න ඕන තරම් කට්ටිය ඉන්නවා.මංහිතන්නේ යොජකාවක් විදිහට ගෙනා ,පොල භූමියේ එක ශාලාවක් ගෘහස්ථ ක්‍රිඩාංගනයක් සෑදීමට සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,මං හිතන්නේ අපේ උපසභාපතිතුමාගේ සංකල්පයක් වෙන්න ඇති.ඔබතුමාගේ පියා වගේ ම මගේ පියාත් ඇහැලියගොඩ සතිපොලේ තමයි වෙළඳාම් කලේ.ඒ භූමිය තමයි පරණ පොල.ඒ අත්දැකීම් මටත් තියෙනවා.ඔබතුමා ඒ ව්‍යාපාරිකයන්ට හානියක් නොවන විදිහට ඒ ගොඩනැගිල්ල සංවර්ධන කටයුත්තකට යොදලා ඒ සඳහා ගෙනාපු යෝජනාව ,මං හිතන්නේ ඔබතුමාගේ යෝජනාවක් නදුන් මන්ත්‍රීතුමාට කතා කරලා කියන්න ඇති.අපි ඒක ස්ථිර කළා.ඒ ගොඩනැගිලි දෙකෙන් එකක් අපි සංවර්ධන කටයුත්තක් යෙදවනවා කියලා අපට හානියක් වෙනනේ නෑ.මං හිතන්නේ පොලේ වෙලෙන්දන්ටත් හානියක් වෙන්නේනෑ.එතකොට පොලේ ආකර්ශනීය භාවය වැඩිවෙයි.සුමිත් මන්ත්‍රීතුමා කිවුව වගේ අපි දැක්ක මගෙ කොට්ඨාශයේ දංදෙනිය ගමේ සුමිත් මන්ත්‍රීතුමා කිවුව වගේ ගොඩනැගිල්ලක් ස්ථාපනය වෙලා තිබුණා.හැබැයි යම් යම් කාරණා මත එවා දේශ සහගතවද දේශසහගත නොවන ආකාරයෙන්ද යන්න විග්‍රහ කරන්න අවශ්‍ය නෑ.නමුත් ඒ අපේ ප්‍රදේශයට ඒ හොඳඅපේ දරුවන්ගේ අපේ ඒ ආකල්ප වර්ධනය කරන්න,ක්‍රිඩා කෞෂල්‍ය ගොඩනගන්න,ඔවුන්ගේ මනසට ඉතා හොද අවස්ථාවක්.ඒ නිසා අපේ ඔබතුමාගේ යොජනාව අපි ස්ථිර කළා.අපේ සුමිත් මන්ත්‍රීතුමා කිවුව වගේ ඒක බොහොම කාලෝචිත අවශ්‍යතාවයක්.ඔබතුමාට යෝජනා ඇවිල්ලා තියෙනවා කිවුවා,එතුමත් ඒක යෝජනාවක විදිහට ගෙනාවා,එතකොට අපි ඒක ගෘහස්ථ ක්‍රිඩාංගනයක් හදලා ඒසඳහා අවශ්‍ය වැඩ පිළිවෙලක් හදලා කාටවත් බාධාවක් නොවන විදිහට.මං හිතන්නේ ඉතා කඩිනමින්ම කළ යුතු කාරණාවක් තමයි ඔබතුමන්ලා යෝජනා කරලා තියෙන්නේ.ඒ නිසා සුමිත් මන්ත්‍රීතුමා කිවුව වගේ ම මාත් ඒකට එකඟයි.මංහිතන්නේ සභාවේ සියලු දෙනාමඑකඟ වෙයි.විරුද්ධ වෙන එකක් නෑ.මොකද ඇහැලියගොඩින් ගත්තහම රත්නපුර පැත්තට යනකන්, මේ පැත්තෙන් මං දන්න විදිහට නිට්ටම්බුවේ තියෙන්නේ.මං දවස ගානේ මං යන එන රූට් එකක්.නිට්ටම්බුවේ තියෙන්නේ.මේ ප්‍රදේශයේ කොහෙවත් නෑ.ගෘහස්ථ ක්‍රිඩාංගනයක්.එතකොට ඔබතුමාගෙන් කවුරුහරි අවසරය ඉල්ලා තිබෙනවා නම් ඒ අවසරය ලබා

දෙන්න.ඒ මුදල් අවශ්‍ය විදිහට අය කරගෙන.මං ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.මං හිතන්නේ අපි සියලු දෙනාම එකඟ වෙයි.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,මේ යෝජනාවටමමත් එකඟතාවය ප්‍රකාශ කරමි.මං මංගල සැසිවාරයේදී මේ පොලභූමිය ගැන අදහස් දක්වනකොට මේක දැක්කේ සුදු අලියෙක් විදිහට.මං කියන්නේ මෙතනින් පටන් ගන්න කියලා.මේ සුදු අලියා අද ස්වභාවික කළු අලියෙක් බවට පත් කරන්න පුළුවන්.ඒකට මම පළමුව සතුටු වෙනවා.මොකද මං කිවුවා මේකට අවශ්‍ය මූලික පදනම හදල තියෙන්නේ පොල භූමියේ.ඒනිසා අනාගතයේ පොල සංවර්ධනය කිරීමට හානියක් නොවන ආකාරයට ප්‍රාදේශිය සභාවට ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස මේක භාවිතා කිරීම මේක ඉතා වැදගත් කාරණයක්.ඒ සඳහා උපසභාපති වැඩ බලන සභාපතිතුමා ඇතුළු ඒ මන්ත්‍රිවරු ගෙනාපු ඒ අදහස් අනුමත කරමින් මේක සංවර්ධනය කිරීම සඳහා භාවිතා කිරීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,මේක මේ වැරදි විදිහට ගන්න එපා.ළමයින්ට ක්‍රීඩා කරන්න තැනක් නැති කරනන්න හදනවා කියන අදහසකට.හැබැයි රුපියල් කොටි ගණන් වියදම් කරපු ගොඩනැගිල්ලක් තියෙන්නේ.රුපියල් කොටිගාණක් වටින ආර්ථික වටිනාකමක් තියෙන නගර මධ්‍යයේ තියෙන ඉඩමක්.එතකොට අපි කල්පනා කරන්න ඕනේ,.......එක කොච්චරක්ද එකකොට රුපියල් 2000 යි2500 යි.ගෘහස්ථ ක්‍රීඩාංගනය දවසට පැය ගානේ හරි පැය දෙක ගානේ හරි ගන්න ගාස්තුව,එතකොට දවසේ 6 ට ක්‍රීඩා කරන්න ගත්ත කියලා හිතුවොත්,රෑ 12 වෙන කම් පැය 6 යි.පැය 2ට රු.2000.00 ගානේ වුණොත් රුපියල් 6000 ක්.සෙනසුරාදා ඉරිදා අපි හිතුවොත් උදේ 8ට ළමයි ගෙදරින් එළියට ඇවිල්ල රෑ 12 වෙනකම් සෙල්ලම් කරනවා කියලා පැය 12, 4යි 16යි. එතකොට බලන්න ඒ මුදල එතකොට මම යෝජනා කරනවා, ළමයින්ට ක්‍රීඩා කරන්ඩ ස්ථානයක් ඕනි, මේ ලඟම තියන ස්ථානය තමා මේ. අපි දෙහිඕවිට බුලත්කොහුපිටිය පාරෙ යනකොට මට ඒ නම මතක නෑ. කන්නන්ගර තමා මේ ළඟම අපිට තියෙන ක්‍රීඩාගණය. ඒ කන්නන්ගර ක්‍රීඩාංගනය තමා සබරගමුව පළාතේ තියන වැඩියෙන්ම සෙල්ලම් කරන ක්‍රීඩාංගනය. මොකද ඒක ස්පෝර්ට් ක්ලබ් එකකට අයිති ගෘහස්ථ ක්‍රීඩාංගනයක්. ළමයි විශාල ප්‍රමාණයක් ඔවුන් දිනපතා ක්‍රීඩා කරනවා. ඒකෙ ආදායමවත් මං හිතන් නෑ අපිට ලැබුණොත් ඇති වෙයි කියලා.මං සභාවට යෝජනා කරනවා,ඔබතුමාගේ ගරු අවධානයට,අභිමතය ප්‍රකාශ කරන පාර්ශව එක්ක කතා කරලා ,අවශ්‍යතාවය කියලා.ශබ්ධ දූෂණය යන කාරණාව (සෝෂාව)මුදල නැවත පියවා ගන්න හැකියාවක් බලලා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා බොහොම ස්තුතියි.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රිතුමා:-**
ඇත්තටම මන්ත්‍රිතුමා අපි මේක අපි කරන්නේ ඊගාව අවුරුද්දට හරි,තක්සේරුවක් අරගෙන ඒක ටෙන්ඩර් කරන එක.ටෙන්ඩර් කරලා ව්‍යාපෘතියක් කරන්න,ව්‍යාපෘති යෝජනා කිපයක් ඉදිරිපත් කරලත් තියෙනවා.ඒ අයට මේක ටෙන්ඩර් පටිපාටියක් හරහා මේක බදු අරගෙන

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**

අපි එහෙනම් ටෙන්ඩර් පටිපාටියකට යං කැමති ඕනිම පාර්ශවයකට ඉදිරිපත් වෙන්න කියලා. තමන් කැමති ව්‍යාපාරයක් සඳහා එතකොට ඉල්ලීමක් සිදු කරයි. එතකොට අපිට කටයුතු කරන්ඩ පුළුවන්.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රිතුමා:-**
අපි තක්සේරුවක් අරගෙන මුදල් කාරක සභාවට දාල ඊට පස්සෙ තමයි ඒ ක්‍රියාවලියට යන්නෙ.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔතන වැඩේට පොඩ්ඩක් අපි 5දෙනෙකු වගේ කමිටුවක් වගේවත් හදාගන්න පුළුවන්නම් ඒ කියන්නේ කට්ටිය පොඩි සාකච්ඡාවක් කරල දැන් ඔතන තවත් තියෙනවා පොළ භූමියේ වෙළෙන්දෝ ටික මේකට ගන්ඩ ඕනි.මේ පැත්තකට ගද්දී, එතන කාරණය තියෙන්නේ දැන් අපි වුණත් පොළට යද්දී දැන් පොළෙ බඩු ගන්ඩ නෑ වගේ අදහසක් තියෙන හින්ද මං හිතනවා. වෙළෙන්දො ටික විසිරිලා ඉන්න ටික ටිකක් අර එක තැනකට ගත්තොත් එහෙම පෙනුමක් තියෙයි. ඒත් එක්කම පාර දෙපැත්තේ වෙළදාම් කරන එකත් මේ ඒතන්ට,අවස්ථාව දීල මොකද පාර දෙපැත්තෙන් වෙළඳාම කරන කීප දෙනෙක් ඉන්නවානේ. ඒකත් පොලටම අරගෙන,නගරයේ සැලසුමට හරි අශෝභනයිනේ. ඒ කියන්නේ සැලසුමක් නෑ වගේ වැඩක් තියෙන්නේ. මං දන්නෑ.ඒ ගොල්ලන්ගේ විරෝධතා කොහොම එයිද කියලා. සභාවේ අපි, ඒ කියන්නේ කට්ටිය බලල ඒකට මොකක්හරි ක්‍රියාමාර්ගයක් ගන්ඩ ඕනේ. ඒ පාර දෙපැත්ත, ඒ කියන්නේ ආකර්ශණය වෙන්ඩ.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රිතුමා:-**
ඇත්තටම මන්ත්‍රිතුමා ඊගාව යෝජනාවෙන් 6.45 යෝජනාව තියෙන්නෙත් ඒක. ඉතිං අපි මේ යෝජනාව අපි ගත්තොත් එහෙම අර විදියට ටෙන්ඩර් කරල ඊට පස්සේ ව්‍යාපෘති යෝජනා අරගෙන අපි ඒ විදියට අපි කරන මේක අපි දැම්මේ. ගොඩක් ස්තුතියි.

ඒ අනුව සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ 6.44. ඇහැලියගොඩ පොල භූමියෙහි ඇති ශාලා දෙකෙන් එකක් ආදායම් උත්පාදන කාර්යක් සඳහා යොදා ගැනීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මන්ත්‍රිතුමා:-**
මී ලගට උපසභාපති වන මගේ යෝජනාවක් 6.45.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**

**6.45.** **ඇහැලියගොඩ පොල භූමියට පිවිසෙන පිවිසුම් මාර්ගයේ පොල හන්දියේ පොල භූමියේ පවත්වාගෙන යන සේවාවන් පිළිබඳව හොඳින් ප්‍රචාරය වීම සඳහා මාර්ගය දෙපසට හොඳින් දර්ශනය වන ලෙසත් රාත්‍රියට දර්ශනය වන ලෙසත් ආකර්ශනීය ප්‍රචාරණ පුවරුවක් ස්ථාපනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඇත්තටම ගත්තොත් එහෙම මේකෙ අරමුණ තමයි වජිර මන්ත්‍රීතුමා කලින් කිව්ව වගේ අපි අර පොළ භූමියේ කරගෙන යන සේවාවන් සම්බන්ධයෙන්, පොළට මිනිස්සු යන්නේ නැහැ. ආකර්ශනීය වෙන්නෙ නෑ. එතකොට අපි ගත්තොත් එහෙම එතන ඇත්තටම දැන් පොදු වැසිකිළියක් තියෙනව.සභාව විසින් පොදු වැසිකිළිය මං හිතන් නෑ බස් නැවතුම්පලට යන අය ඇරුනහම ඇහැලියගොඩ පොදු වැසිකිළියක් තියෙනවද කියල ගොඩක් අය දන්නේනැති වෙන්නත් පුළුවන්. සමහර වෙලාවට ඊට පස්සේ එතන තව රථ ගාලක් තියෙනවා. ඊට පස්සේ තව අපේ එකක් තමයි අපිට එනව ගොඩක් එනවා එළිමහන් ප්‍රදර්ශන භූමිය ඉල්ලලා විශේෂයෙන්ම ගොඩක් සංගම් වලින් අපිට ඉල්ලීම් එනව නිරනිතරයෙන් ඒ කියන්නෙ ඒ ගොල්ලන්ගෙ ප්‍රදර්ශන භූමි පවත්වන්න. ඒ විතරක් නෙමෙයි තව තියෙනවා අපි ගත්තොත් එහෙම පෙර පාසල්වලින් එළිමහ විවිධ-ප්‍රසංග ඒවට ඉල්ලීම් කරනවා පොළ භූමිය. ඒ වගේ සේවාවන් ගැන ගොඩක් අය දැනුවත් නෑ. මං හිතනවා ,මේ විතරක් නෙමෙයි අපේ සති පොළ භූමිය,ලේකම්තුමත් සාකච්ඡා කරල කිව්වෙ ඒක අපිට ඩිජිටල් පුවරුවක් විදියට දාන්න පුළුවන්නම් ඒක ඇත්තටම හොඳයි කියලා.ඒකෙන් එහෙම තමා මේක අපි සභාවට ඉදිරිපත් කලේ. මේකෙ අරමුණම තමයි ඇත්තටම පොළ භූමියට ජනතාව ආකර්ශනය වන එක වැඩිකර ගන්න.ඊට පස්සෙ මෙතන මේ කරන අපි කලින් යෝජනාවක තිබ්බ්ව වැඩේ. ඉතිං මේක මොනවගේ දේකටද අපි දෙන්නෙ කියන එක සඳහන් කරල නිරන්තරයෙන් මිනිස්සු ගැවසෙන ආර්ථිකය Rotate වෙන තැනක් විදියට අපිට ඒ භූමිය පාවිච්චි කරන්ඩ පුළුවන්. එතකොට ඒකෙ සභාවට ලොකු ආදායමක් ගන්ඩ පුළුවන්.ඒ නිසා තමයි මේ යෝජනාව දැම්මෙ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ යෝජනාව ඉතාමත් හොඳයි. ගරු සභාපතිතුමනි, දැන් මේවන විට පොළ භූමිය දැන් අපි කොච්චර වර්ණවත් කරන්න හැදුවත් යම් යම් හේතුන් නිසා පොළ භූමිය දැන් නිකන්ම අර සොහොන් පිට්ටනියක් බවට පත් වෙලා. මම හිතනවා අපි මෙතුමත් ඒ අදහස ගෙන ආව. පොළ භූමිය පොළක් හැටියට පොලේනෙ තියෙන්න ඕනි.ඔතන විශේෂයෙන් අපි වෙළඳාම්නෙ. අද වෙළෙන්දො සියලු දෙනාම පාරට ඇවිල්ල. හැම කඩේකම සිල්ලරත් එක්කම එළවළු විකුණන මට්ටමට පත් වෙලා. මං හිතන්නේ කඩ කිහිපයයි තියෙන්නේ ලේකම්තුමා දන්නවා ඇති. මේකෙදි ලයිසන් එළවළු විකුණන්න ලයිසන් තියෙන්න ඕනි. ලයිසන් තියන කඩ තියෙන්නේ කිහිපයයි.අයථා විදියට තමයි අනික් අය කරන්නේ. හැම වෙළෙන්දෙක්ම අයථා විදියට තමයි කටයුත්ත කරන්නේ. නීතියෙන් තහනම්.මේක මෙතුමාගෙන් දැනගන්ඩ පුළුවන්. මං හිතන්නේ කඩ 4ක් හෝ 5ක් හරි තමයි එළවළු විකුණන්න නීතියේ තියෙන්නේ බලාගෙන උඩ ඉඳල පල්ලෙහාට එනකොට සැම කඩයකම එළවළු තියෙනවා. දැන් ඒ නිසා පොළේ තියන වැදගත්කම පොළ භූමිය කියන එක අපිට වැදගත්කමක් නෑ.ඔක්කොම එක තැනකින් ගන්නවා පොළට යන්නෙ නෑ.ඔබතුමා අපි සභාවක් හැටියට අපිට හැකිනම් නැවතත් එම සියළු වෙළෙන්දොත් එක්කල සාකච්ඡා කරල කාටවත් අසාධාරණයක් නොවන පරිදි පොළ භූමියට සියලු වෙළෙන්දො එළවළු විකුණන ටික අපි එතනට ගන්නම්.මාළු වෙළෙන්දොත් එතනට ගන්න,සියළු වෙළෙන්දො එතෙන්ට අරගෙන මේ කටයුතුත කරන්ඩ ගියොත් එතන පොළ භූමියක් කියන විදිය අපේ බලාපොරොත්තු ඉෂ්ඨ කර ගන්ඩ පුළුවන්.ඒකත් එක්කම ටොයිලට් පාවිච්චි කරන්ඩ පුළුවන් කට්ටියට ටොයිලට් එකට කෙනෙක් දාල අපට යම් කිසි ආදායමක් උත්පාදන කරන්න පුළුවන්.එතකොට බයිසිකල් හරි මොනව හරි පාකින් එකක් අපිට එතනට හදන්ඩ පුළුවන්.මොකද වැඩි ජනතාවක් එතෙන්ට යන්ඩ යන්ඩ තමයි අවශ්‍යතාවය පේන්නෙ. මොකද පාකින් එකක් හැදුවට අපි යන්නෙ නැත්නම් කවුරුත් දන්නෙ නෑ. දැන් මේ ඇහැලියගොඩ තව පාකින් එකක් තියෙනවා.නැදුරන හංදියේ මෙතන බයික්වලටයි පාර්ක, ඒ දෙක අපි අඳුරනවා. නොදන්න කෙනෙක් නෑ. නමුත් පොළ භූමියේ අපට අවශ්‍යතාවය තිබ්බත් ඉඩ ප්‍රමාණය තිබ්බත් අපි කවුරුවත් දන්නෙ නෑ හේතුව. අපේ අර ඒ පැත්තට යන ප්‍රවණතාවය අඩුයි සියලු දෙනාගේම. අපි ඒ එතෙන්ට යන එතෙන්ට යොමුවන ආකාරයන් නීතියෙන් හෝ කට්ටියත් එක්ක සුහඳව කථා කරල හරි ඒක කරන්ඩ පුළුවන් වුණොත් ඉදිරියේදී මං හිතන්නේ අපේ කටයුත්ත සාර්ථකව කර ගන්ඩ පුළුවන් වෙයි කියලා. මං යෝජනා කලේ,පුළුවන්නම් අපි ගිහිල්ල සියලු වෙළෙන්දො එක්ක සාකච්ඡා කරල අපි නැවතත් පොළ භූමියට කට්ටිය ගෙනියමු. සාකච්ඡාවක් කරමු ලෙස මම යෝජනා කරනවා.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඔබතුමා ගෙනාපු යෝජනාව ඇහැලියගොඩ පොළ භූමියේ පිවිසුම් මාර්ගය දෙපස ආකර්ශනීය,මේ LED බෝඩ් එකක් සවි කිරීම තමයි මේ යෝජනා වුණේ.ඒක පොඩ්ඩක් ගැටළු තියෙනවා. 2019 නොවැම්බර් 05 වෙනි දින නිකුත් කල ගැසට් එකක් තියෙනවා. ඒකෙන් තමා ඔය බිම් පෝස්ටර් හා.... දෙකම පාලනය වෙන්නේ. ඒකට අනුව අපිට අඩි 30ක් පොළොව මට්ටමේ සිට අඩි 30ක් උඩින් තමා ඒ බෝඩ් එක හයි කරන්නේ. දැන් හයි කලාට පස්සේ හයි කරනකොට මාර්ගයේ ටිකක් මාර්ගයට අවහිර වෙන්ඩ බෑ.හුලන් අවහිර වෙන්ඩ බෑ. ඒ වැඩේ තමයි ප්‍රධානම දේ. බිල්ඩින්වල මූණතින් 25% ක් කවර් වෙන්ඩ බෑ. එතකොට මං හිතන්නේ ස්ථානයේ පොඩි ගැටලුවක් අපිට නිර්මාණය වෙනව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපි ඒ ගැටලු සාකච්ඡා කරල ඒ කියන දේ පමණක්
**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**

පොළේ තියන දේ පමණක් මේව කරන්න LED බෝඩ් එකක් ගහනව කියන එකෙන් එක්කො නගරයේ තියෙන දේවල් මොනවද කියන එක හරි නැත්නම් නගරයේ ඉන්න ව්‍යාපාරිකයින් මොකද අපේ ප්‍රදේශයේ මැණික් වෙළඳාමත් එක්ක සම්බන්ධ වෙච්ච විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් ප්‍රචාරය ඉතා කැමති පිරිසක් ඉන්නවා. මොකද ඇත්තටම ඒ දේ අවශ්‍යයි. උපසභාපතිතුමා ඔබතුමාගේ අදහස පොළේ තිබෙන දේවල් පොළේ තියෙනවා. ඉතිං එළවළු විකිණීම තියෙනවා. එතකොට ඒ ටික තමා දැනට තියෙන්නේ. මාළු වෙළඳ සලකුත් නෑ දැනට මං හිතන්නේ. අපි පොළෙ තියෙනව තව වාහන බස් නැවතුම්පල ඔය දෙක තමා තියෙන්නේ. ඊට අමතරව පොළට එන කඩවලට එන වාහන තමයි තියෙන්නේ.ප්‍රචාරය කිරීමට බෝඩ් එකක් ගහනවා කියන්නේ

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒකට ඌණ පූර්ණයක්විදියට තමයි ඩිජිටල් LED පුවරුවක් කියන එක ආවෙ.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**
මොකක්ද ඌන පූර්ණය කියන එක.ඌන පූර්ණයේ මූලික අරමුණ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
දැන් මේ කියන්නේ ආකර්ශනිය ප්‍රචාරක පුවරුවක්.ඒකෙ LED කියල නෑ. එතකොට LED පුවරුවක් දැම්මොත් අර LED පුවරුවක් දැම්මොත් අපිට ආදායම උත්පාදනය කරන්ඩ.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**
එතකොට මං හිතන්නේ ගරු උපසභාපතිතුමා මං දන්නෑ ඔබතුමා ඒ වගේ යෝජනා කලේ ඇයි කියලා.මොකක්ද ඒකෙන් ඔබතුමා බලාපොරොත්තු වෙන්නේ කියලා. ඒ යෝජනාව ස්ථිත් වුණා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒ කියන්නේ සාමාන්‍යයන් අර කටවුට් එකක් නෙමෙයි. දැන් අපි ගත්තොත් එහෙම නිමානි හෝටලය තියෙනවා.මීන්නානෙ රේල් පාර ගාව තියෙන්නේ.එතනත් ඇත්තටම ඒ ආයතනය ඇතුලෙ තියෙන සේවාවන් සම්බන්ධයෙන්. මේක ඇත්තටම අරමුණ තමයි පොළ භූමියේ මෙන්න මේ සේවාවන් තියෙනවා කියන එක ගැන අදහසක් දැන් ඊට අමතරව අපිට ආපු දේ තමයි අර යෝජනාව මොකක්ද ආදායම් උත්පාදනය.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමා මං මේ ඔබතුමා අපහසුතාවයට පත් කරනවා නෙමෙයි. මොකද මේ යෝජනාවට තමයි අපි අදහස් දක්වන්න පටන් ගත්තෙ. මොකද අපි ඒක එතන සකස් කරන්ඩ පුළුවන්ද කියන 2019 නිකුත් වෙලා තියෙන ගැසට් එකත් එක්ක එතකොට ඔබතුමා ඒ යෝජනාව කරනකොට ඉතිං මං දන් නෑ කියන්ඩ ගොඩක්.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපිට මෙහෙම කරන්නත් පුළුවන්,සභාවේ සේවාවන් ප්‍රචාරය කරන්නත් පුළුවන්.නැත්තන් අපට අනුග්‍රාහක බවතෙන් යොදා ගන්න පුළුවන්

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි, ඒක පොළ භූමියට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම තවත් යෝජනාවක් තියෙනවා. මොකද පොළක් කියන එක සක්‍රිය පොලක් ඔතන ඉතිහාසයේ තිබුණෙ. ක්‍රම ක්‍රමයෙන් දිය වෙලා ගිහිල්ලා වෙළන්දෝ කිහිප දෙනෙකු නඩත්තු වෙන පොලක්.ඒ දවස්වල සක්‍රිය මට්ටමේ තිබුණ.දැන් සතියම තියෙනවා. ඒත් සක්‍රිය මට්ටමපේන්න නෑ.ඒකට හේතුව තමා පරිසරය පොළ භූමියට අවශ්‍ය පරිසරය එතන නිර්මාණය වෙලා නෑ. ඒකට හේතුව සුමිත් මන්ත්‍රීතුමා කිවුව වගේ දැන් එළවළු විකුණනවා හැම තැනම. මාළු විකුණනව හැම තැනම. ඉතිං ඔය නිසා පොල භූමියට අවශ්‍ය පරිසරය ඔතන නිර්මාණය වෙලා නෑ.දැන් අපි මූලික වශයෙන් අපේ අදහස ක්‍රියාත්මක කරන්න යවනම් පොළ භූමියට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන ක්‍රමවේදය තුළින් තමයි පොළ සංවර්ධනය කරන්ඩ පුළුවන්.පොලත් සංවර්ධනය වෙනවා. එතකොට අපි අපේක්ෂා කරන ආදායම් උත්පාදන ව්‍යාපෘති ටිකටත් ලොකු ප්‍රවේශයක් ලැබෙනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒ කියන්නේ පොළ භූමියට මිනිස්සු ගෙන්න ගන්න එක,පොළ භූමියට වෙළෙන්දො ගෙන්න ගන්න එක ,අපි වැඩ දෙකම කරමු.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**

ගරු උපසභාපතිතුමනි, මස් මාංස වෙළඳාම කියන එක ලොරිවල එහෙම තියාගෙන ඉන්න එක ඇත්තටම අපිට සභාවට ආදායමක් ආදායමක් එන්නෙත් නෑ. පරිසරයටත් අවුල්. දැන් මේ ප්‍රධාන පාරක් බ්ලොක් වෙනව. අන්න ඒ වගේ දේවල් අපි අවම කරන්ඩ වෙනව ඉතා ඉක්මනින්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඇත්තටම අතුරු ව්‍යවස්ථා සම්පාදනයට කමිටුවක් පත් කරගමු.දැනට තියෙන අතුරු ව්‍යවස්ථාවෙන් ඒක කරගෙන යැමේ අපහසුතා තියෙනවා.පොඩි පොඩි අඩු පාඩුකම් තියෙනවා. ඒ නිසා තමයි අතුරු ව්‍යවස්ථා සම්බන්ධ කමිටුව පත්කර ගත්තෙ ඒක හින්ද තමයි දැනට තියෙන සේවාවන්, උදාහරණයක් වශයෙන් ගත්තොත් අතුරු ව්‍යවස්ථා හදන්න වෙයි අබලි ද්‍රව්‍ය එකතු කරන ස්ථාන සම්බන්ධව.තවත් ඒ වගේ තියෙනවා.ඒවාට නිසි නියාමනයක් නෑ. අධීක්ෂණයක් නෑ. එතකොට ඒවට අලුතින් නීති හදන්න වෙයි. තියන නීති සංශෝධනය කරන්න වෙයි. මස් මාළු වික්ණීමටත් අතුරු ව්‍යවස්ථාවක් දැනට තියෙනවා. ඒවගේ තියන අඩුපාඩුකම් ඒවට තව

එකතු කරලා තමයි අපිට එතෙන්ට යන්ඩ වෙන්නෙ.දැන් තියෙන්නෙ අපිට නීතියෙන්නෙ. අපිට ඒ දේවල් කරන්ඩ වෙන්නෙ.අපි අර වැඩෙත් කරන ගමන් ඒ කියන්නෙ පොළට මිනිස්සු ගෙන්න ගන්නව වගේම පොළට වෙළෙන්දොත් ගෙන්න ගන්න එකත් අපි ඒ කාර්යයන් දෙකම අපි කරමු

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
උප සභාපතිතුමනි,අදහසක් වැදගත් වෙනව. පොල භූමිය දවස් දෙකක් කලොත් එහෙම ටිකක් අපිට ආදායම් උත්පාදනවල මාර්ගවලට ප්‍රවේශ වෙන්න පුළුවන්.ඒ කියන්නේ අනික් දවස් ටිකේ පොළ භූමිය දෙන්න පුළුවන් සංවර්ධන කටයුතු වලට එහෙම උත්සව කටයුත්වලට භාවිතා කරන්න පුළුවන්. අපේ පොළ භූමිය දවස් දෙකක් නීත්‍යානුකූලව දවස් දෙක තියෙන පොල භූමිය. ක්‍රියාත්මක කරන්ඩ පුළුවන් නම,එතකොට අපිට පුළුවන් උත්සව සඳහා දෙන්න ගොඩනැඟිල්ල පොළ භූමියේ. අනෙකුත් අවශ්‍යතා සඳහා භාවිතා කරන්ඩ පුළුවන්. අපි ඒ ක්‍රියාමාර්ග සඳහා ප්‍රවේශයක් ගමු.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒ කියන්නේ අපි අපේ පොළ භූමියේ දැනට ව්‍යාපාර කරන 34 දෙනෙක් ඉන්නවා.ඒ අයත් එක්ක සාකච්ඡා කරලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගමු නේද?

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි, අර දැන් ඔය පොළ භූමිය ඇතුලෙම මාළු වෙළඳාමට වෙනම ස්ථානයක් හදල තියෙනව. හැබැයි එහෙම තියෙද්දි දැන් මෙතන ධීවර සංස්ථාව කියල වෙනම එකක් තියෙනව. මෙතන සම්පූර්ණම අපවිත්‍ර වෙලා.සම්පූර්ණම මාළු හෝදන වතුර ටික සම්පූර්ණම මේ අපි එන තැන තමයි තියෙන්නෙ. ඒකට හරි දැන් පාරෙ ඉදන් මාළු වෙළඳාම කරන අය හරි ඒ තැන තියෙද්දී එතනට යොමු කරන්න බැරිද අපිට ඒ මාළු වෙළඳාම.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු මන්ත්‍රිතුමා, මෙතන තියෙන මත්ස්‍ය වෙළඳාම ගැන කථා කළා. විවිධ සේවා සමූපකාර සමිතිය ඒගොල්ලොත් බලාපොරොත්තු වෙනව ඇහැලියගොඩ ඒ කියන්නේ මත්ස්‍ය වෙළඳසැලක් හදන්න.බලපිටිය සමූපකාරයෙන් මාළු ගෙන්නගෙන.අපි ටෙන්ඩර් කළොත් ව්‍යාපාරිකයෝ ඉන්නවා ඒක ගන්න.දැන් වැඩේ වෙලා තියෙන්නේ,වෙළෙන්දො ඔක්කොම ඉන්නේ පාරේ.අපි බලමු දැන් මෙතන ගත්තොත් මධ්‍යම රජයෙන් මොකක් හරි අපි බලමු යෝජනා කිහිපයක් තියෙනවා.

ඒ අනුවඋපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.45.ඇහැලියගොඩ පොල භූමියට පිවිසෙන පිවිසුම් මාර්ගයේ පොල හන්දියේ පොල භූමියේ පවත්වාගෙන යන සේවාවන් පිළිබඳව හොඳින් ප්‍රචාරය වීම සඳහා මාර්ගය දෙපසට හොඳින් දර්ශනය වන ලෙසත් රාත්‍රියට දර්ශනය වන ලෙසත් ආකර්ශනීය ප්‍රචාරණ පුවරුවක් ස්ථාපනය කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපි ඊළඟ එකට යන්න කළින් අපිට පුළුවන් දැන් ,කාලය ගිහින් තියෙන නිසා දැන් කෑම කාල හරියටම් පැය භාගයකින් සභාව පටන් ගන්න.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,සභාව පැය භාගයකට කල් දැමීමට මම යෝජනා කරමි.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි,ඒ යෝජනාව මම ස්ථිර කරමි.

**සභාපතිතුමා:-**
සියලු දෙනාට සුභ දහවලක් වේවා.අපි එහෙනම් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරමු.

**සභාපතිතුමා:-**
මී ලඟට උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.46.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරුසභාපතිතුමනි,
**6.46.මීටිපොල දියවේල්ල මාර්ගයේ සිමෙන්ති කොට්ට 160 ක් හා¾කොන්ක්‍රීට් ගල් කියුබ් 07 ක් සභා අරමුදලින් ලබා දිම සුදුසු බව මම යෝජනා කරමි.(දියවේල්ල සංවර්ධන පදනම,මීටිපොල- ඉල්ලීමකි.)**

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සුරිආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,මීටිපොල දියවේල්ල සංවර්ධන පදනම එතන පාර අබලන් වීම නිසා ඒගොල්ලෝ අපෙන් පාර හදල දෙන්න කියලා කිව්වා ගොඩක් කාලෙක ඉඳන්.දැන් අපි ඇත්තටම අපිට දැන් ගොඩක් පාරවල්

තියෙනවා.දැන් සභා අරමුදල හරි ප්‍රාදේශිය සභා අරමුදලින් ප්‍රමාද වන නිසා ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ මුදලින් ශ්‍රම දායකත්වය අරගෙන වැලි අනම් මනම් ටික අරගෙන ,ඉතුරු ටික සභාවෙන් දිලා තියෙන්නේ.එතකොට ඇත්තටම මේ මේ මේක ඇත්තටම අපි දීලා නිකන් ඉන්නවා නෙමේ ,අපි ඇස්තමේන්තුවක් හදලා තියෙනවා.ඒකත් අපි සභාවෙන් කරන ව්‍යාපෘතියක් හැටියට තමයි TO මහත්තයගේ අධික්ෂණයට යටත්වයි සිද්ධ වෙන්නේ.ඉතින් මෙන්න මේක මේ පරමාර්ථය සඳහා අසීරු පාරක්.එතන තියෙන්නේ.මේ ටික ලබා දීලා ඒ කර්මාන්තය කරමුයි කියලා මං යෝජනා කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ඇත්තටම මේ මිටිපොල දියවෙල්ල කර්මාන්තය ඉතාම අත්‍යවශ්‍ය දෙයක්.සෑහෙන ජනතාවක් ඉන්න ප්‍රදේශයක් සමහර වෙලාවට ත්‍රිවිල් එකක්වත් යන්න බැරි ස්ථාන තියෙනවා.ඒ හින්දා උපසභාපති තුමා ගෙනෙන ලද යෝජනාව කාලොචිත හා අත්‍යවශ්‍ය දෙයක්,මම සභාවට ප්‍රකාශ කර සිටිනවා.ඒ සඳහා සම්පුර්ණ මැදි හත් වීම ඉතා අගයකොට සලකනවා.ගරු උපසභාපතිතුමාගේ යෝජනාව ඒක හැකි ඉක්මන් කරලා දෙන්න,අවශ්‍ය කටයුතු කරලා දෙන්න අපි උනන්දු වෙමු.ඒ වගේම එම මාර්ගයේ එම ප්‍රදේශයේ තරුණ තරුණියන් එකතු වෙලා ඒකට කටයුතු කරලා තියෙනවා.දැනට අවශ්‍ය කරන වැලි ටික පවා ගොඩ දාල තියෙනවා.එම නිසා මේ කටයුත්ත සාර්ථකව කරගෙන යැමා ඔබතුමාගේ සහය සභාවේ සහය මම බලාපොරොත්තු වෙනවා.

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**

ගරු සභාපතිතුමනි,උපසභාපති තුමාගේ යෝජනාවට දිගුවක් එකතු කරන්න මං හැදුවේ.මං ගිය වාරේදී ඉදිරිපත් කලා දියවෙල්ල සුසාන භූමිය බිම් කොටස වෙන් කරා දෙන්න කියලා.ඉතින් ඇත්තටම ඒ පාරේ තමයි සුසාන භූමිය තියෙන්නේ.ගම් දෙකකට අයිති සුසාන භූමියක්.ඉතින් ඇත්තටම අත්‍යවශ්‍ය පාරක්.මිටිපොල ප්‍රදේශයේ විශාල නිවෙස් ප්‍රමාණයක් තියෙන්නේ දියවෙල්ල ප්‍රදේශයේ.

**සභික සුජීව විජේසුරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මං හිතන්නේ මේ ප්‍රදේශය නියොජනය කරන මන්ත්‍රිවරු ගණනාවක්ම ඉන්නවා.හොඳ අදහසක්.ඒ වැඩ සටහනට අපි මුදල් කමිටුවේ අනුමැතිය අපි ඔබතුමාට ලබා දුන්නා.එතකොට අපේ ක්‍රිෂ්ණා මන්ත්‍රිතුමියයි දීපාල් මන්ත්‍රිතුමයි ප්‍රියන්ත මන්ත්‍රිතුමයි ඒ කටයුත්තේදී සෑම කටයුත්තනටම සම්බන්ධ කරගෙන ඔබතුමාගේ මැදිහත් විමෙන් උපසභාපති ඇතුළු අපේ මන්ත්‍රිතුමන්ලා ඒ යෝජනාවට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිතුම්ගේද සහය අරගෙන ඒ සංවර්ධන කටයුත්ත සාර්ථකව කරන්න කියලා අදහසක් විදිහට මම ඉදිරිපත් කරනවා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මමත් පොඩි අදහසක් දක්වන්න කැමතියි.මොකද ඒ පාර වසර ගනනාවක් තිස්සේ සංවර්ධනය වෙලා නැති පාරක්.ඇත්තටම මම තමයි උප සභාපතිතුමාට කිවුවේමේ මොකද ඒ ගමේ පිරිසක් තරුණයෝ ටිකක් එකතු වෙලා මාත් දන්න හිතවත් අය එතන ඉන්නවා.මටත් කතා කරලා කිවුවා අයියේ මෙන්න මෙහෙම වැඩක් අපි කරනවා මුදලුත් එකතු කරගෙන මං හිතන්නේ,ඒ ගොල්ලෝ වැලිත් ගොඩ දාල තිබුණා.සිමෙන්තිත් මං හිතන්නේ මේ ගොල්ලෝ ටිකක් එකතු කර ගෙ තිබුණා.ඒ ගොල්ලෝ පාර එහෙම ස්වෙච්ඡාවෙන් හදන්න හදනකොට තමා මම උපසභාපතිතුමාටත් දැන්නුවේ.මෙන්න මෙහෙම වැඩක් යනවා මේ ගමේඅපි ඇත්තටම මේකට ප්‍රමුඛතාවයක් දැක්වුවොත් වටිනව,මොකද ස්වෙච්ඡාවෙන් කරන වැඩක්නේ.ඒ කියන්නේ ගමේ තරුණයන් එකතුවෙලා කරනකොට අපි සහයෝගය දෙන්න ඕනෙ අනිවාර්යෙන්ම.ඒ නිසා එකට අපේ උපසභාපතිතුමා ඇත්තටම ප්‍රතිචාර දැක්වුවා.අපේ කොට්ඨාශයේ මන්ත්‍රිතුමීය ඒ යෝජනාව එතකොටම මම කියනකොටම කියලා තිබුණා.ඒ නිසා දෙකම ක්‍රියාත්මක වුණා.එතකොට අපේ අනිත් මන්ත්‍රිවරු සමහරවිට දන්නවා ඇති. සභාවෙන් තමයි එකට ඉතා ඉක්මනින් ප්‍රතිචාර දක්වලා මුදල් කමිටුවටත් දාල ඒක ඉතා ඉක්මනින් කරන්න කටයුතු කරලා තිබ්ච්චි එක ගැන බොහොම සංතෝෂයි.ඒක ඉක්මනටම කරමු කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව උපසභාපති යු.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.46.මිටිපොල දියවෙල්ල මාර්ගයේ සිමෙන්ති කොට්ට 160 ක් හා ¾කොන්ක්‍රිට් ගල් කියුබ් 07 ක් සහා අරමුදලින් ලබා දිම සුදුසු බව යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.(දියවෙල්ල සංවර්ධන පදනම,මිටිපොල - ඉල්ලීමකි.)

**සභාපතිතුමා:-**

මී ලඟට සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමාගේ 6.47. යෝජනාව

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,

**6.47. පලීගල පාසල අසලින් දිවෙන බොරළුව පාර කොන්ක්‍රිට් කිරීමට මම යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි මේකෙ මෙතන පන්සල නෙමෙයි පාසල වෙන්න ඕන.,මම කෙටියෙන් මේ පාර ගැන සඳහන් කරන්නම්.ඇත්තටම මේ පලීගල බොරළුව පාර,විශාල ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගන්න පාරක්.හැබැයි ඒ පාරේ ගොඩක් තැන්වල තියෙන්නේ ගල් ගොඩවල් තමයි.ඒ ගොල්ලෝ යන්නේ.ඇත්තටම කියනව නම්

ගොඩක් ගමන් කිරීමට අපහසු පාරක් කියල මං කියනවා.මේකට අවධානය යොමු කරලා දෙන්න කියලා මං කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ අනුවසභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමාගේ 6.47.පලීගල පාසල අසලින් දිවෙන බොරළුව පාරකොන්ක්‍රිට් කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**

මී ලඟට සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමාගේ 6.4. යෝජනාව

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,

**6.48. ඉද්දමල්ගොඩ මිටිහෙලලගල්පොත්ත විපුලතිස්ස මාහිමි මාවත කොන්ක්‍රිට් කිරීමට මම යෝජනා කරමි.**

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,අජන්ත විජේසිංහ මන්ත්‍රිතුමා කරපු යෝජනාව මට අදාළ කොට්ඨාශයේ පාරක්.එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මේකෙත් මෙතන මේ ඉද්දමල්ගොඩ මිටිපොල කියලා තිබුණට මිටිහෙල තමයි මම යෝජනා කරලා තියෙන්නේ.ඒක ඇත්තටම කියනව නම් අර අලුතෙන් මෙහෙන් අයින් වෙලා ගියපු ජනතාවක් ඉන්න ගෙවල් විශාල ප්‍රමාණයකට යන පාරක්.ඒ පාරත් ඉතාමත් දූෂකරයි.මම ඒකෙ අර කොට්ඨාශයේ මන්ත්‍රිතුමාට මම යෝජනා කරනවා මේ පාර කොන්ක්‍රිට් කිරිම සඳහා සුදුසුයි කියලා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මේක ඉද්දමල්ගොඩ කොට්ඨාශයේ ගනේගොඩ වසමට අයත් පාරක්.මේක අර නාය ගියපු පුද්ගලයන් සඳහා ගෙවල් දීපු ගම්මානයේ පාරක්.මේක යෝජනාව දාල තියෙන්නේ අජන්ත සහෝදරයා.ඒ මන්ත්‍රිතුමා කරපු යෝජනාව අපි ඉද්දමල්ගොඩ වසමේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේදී අපි ප්‍රමුඛතා ගත කරලා තියෙන පාරක ඒක.ඒක නිසා මම හිතන්නේ ඒනිසා ඒක අපි ප්‍රාදේශිය සභාවෙන් කරන්ඩ උත්සහ කරමු.එහෙම නැති වුණොත් අපි විමධ්‍යගත මුදල් වලින් හෝ ඒ පාර අපිට කරන්න පුළුවන් වෙයි.මොකද අපි කරලා තියෙනවා.ඔබතුමාගේ යොජනාව පළාත් සභාවෙන් හෝ අපි කරන්න උත්සහ කරමු කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික ජී.එච්.එන්.අජන්ත විජේසිංහමැතිතුමාගේ 6.48.ඉද්දමල්ගොඩ මිටිහෙලගල්පොත්ත විපුලතිස්ස මාහිමි මාවත කොන්ක්‍රිට් කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**

මී ලඟට සභික දිලීන් කරුණාපාල මැතිතුමාගේ 6.49. යෝජනාව

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,

**6.49. සභිකයන්ට සභා අරමුදල හරහා ලබා දෙන මාසික යැපීම් හා ගමන් වියදම් දීමනාව රුපියල් 8000.00 සභික දීමනාව සමග එකතු කර ලබා දීම.**

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,අපේ කණ්ඩායමේ ගරු සභිකවරුන් විශාල ප්‍රමාණයකගේ ඉල්ලීම පරිදි තමයි මම මේ යොජනාව ගෙනාවේ.මොකද සභිකයන්ට සභා අරමුදල

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මම කලින් කිවුවා වගේ විශාල සභික ප්‍රමාණයකගේ ඉල්ලීමක් තමයි මම මේ යෝජනාව විදිහට ගෙනාවේ.අපි දන්නවා සභිකයන් විදිහට තේරිපත් වුණහම ඒ සමාජ සේවා කටයුතු කරන කොට විශාල පිරිවැයක් පුද්ගලිකව දරන්න සිද්ධ වෙනවා.ඒක රහසක් නෙමේ.මොකද අපි වෙනත් වෘත්තියක් කරන ගමන් තමයි මේක කරන්නේ.මේක සමහරවෙලාවට පූර්ණ කාලීනව මෙම මන්ත්‍රී ධූරයේ කටයුතු කරන අයත් ඉන්නවා.හිටියා.ඉතින් ඒ අයට රුකුලක් වෙන්න තමයි කාර්යක්ෂමව සලකලා බලලා ඒ කාර්යක්ෂම සේවය අගයන්න තමයි මේ සභික දීමනාවක් විදිහට මේ රු.15000.00 දෙන්නේ.මීට අමතරව කලින් නම් ඉන්ධන දීමනාවක් හා දුරකතන දීමනාවක් කියලා අපට ලබා දුන්නා.රු.8000.00 ක්.නමුත් මෙවර පලාත් පාලන ඡන්ද විමසිමෙන් පසුව පිහිටවපු ඒ පලාත් පාලන ආයතන සඳහා මාසික හැපීම් හා ගමන් වියදම් දිමනාව කියලා තමයි මේ රු.8000.00 ක මුදල යෝජනා කරලා තියෙන්නේ.එතකොට මේකෙදී අපිට ඒ රීති පද්ධතිය හරහා අපිට එවලා තියෙනවා ආකෘති පත්‍රයක්.මේ රු.8000.00 ඉල්ලුම් කරන්න.හැබැයි ආකෘති පත්‍රයක් විතරයි එවලා තියෙන්නේ.ඒකට නියමිත උචිත මාර්ගොපදේශයක් නෑ.මෙතන මේ රු.8000.00 ගන්න නම් මෙන්න මේ විදිහට මේ ආකෘතික පත්‍රය පුරවන්න ඕන.එතකොට ආකෘති පත්‍රයේ තියෙනවා දෛනික යැපීම් දිමනාව රු.700.00 ක් කියලා.ඒ දෛනික යැපීම් දීමනාව ගන්නත් පැය 12 ක කාර්ය භාරයක් පෙන්නන්න ඕන.සාමාන්‍යයන් දෛනිකව රු.700.00 ක් කියන එක පැය 12 ක් කැප කරනවා කියන එක මේ වර්තමානය

වන විට ,මිනිහෙකුට ඒ දේ කරන්න බෑ ප්‍රායෝගිකව.ඒක හින්ද මේ රු.8000.00 ගන්න අපි සභිකයෝ හැටියට අපිට බොරු ලියන්න වෙනවා මේ ආකෘතික පත්‍රයේ.ඒක එච්චර එලදායී නෑ.ඒක එච්චර හොඳ වැඩක් නෙමෙයි.ඒක හින්ද කලින් සභාවාරවලත් මේ ප්‍රශ්නය ආවා.එතකොට සභාපතිවරුන්ගේ සංසදය මඟින් කතා කරලා,සභාවේ මේ මොකද මේ රු.8000.00 ක් ගෙවන්නේ සභා අරමුදලෙන්.ඒක හින්ද මේකමං විශ්වාස කරනවා මේක සභාවේ යෝජනාවක් සම්මත වුණොත් එහෙම අපිට මේමේක ඉස්සරහට ගෙනියන්න.ආණ්ඩුකාරතුමිය ඉස්සරහට ගිහිල්ලා මේකසභික දීමනාවත් එක්ක එකතු කරලා ලබා දෙන්න කියලා යෝජනා කරන්න පුළුවන් කියලා විශ්වාස කරපු හින්දා මං මේ සභාවට මේ යෝජනාව ගෙනාවා.ඒ අනුව සභාපතිතුමනි සභික දීමනාව රු.15000.00 එකක් මේ රු.8000.00ත් ඒකට එකතු කරලා ගලපලා ඒ නියමිතදවසෙදි මේ මහජන මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඒ ලබා දෙන වේතනය ලබා දෙන්න කියලා මං ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ දිලින් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව අපේ ඔබතුමාගේ දකුණුපස ඉන්න මන්ත්‍රීවරු බෝහොමයක් සතුටට පත් වෙයි.මොකද එතුමාලා මුදල් සම්බන්ධව දීමනා සම්බන්ධව කතා කරන් නෑ.නමුත් අපි දන්නවා එතුමලාගේ මේ රු.15000.00 ක මුදලත් මං හිතන්නේ එතුමලා ගන්නෙ නෑ පරිත්‍යාග කරනවා.මං හිතන්නේ අපි ආර්ථික වශයෙන් එහෙමයි.එහෙම පරිත්‍යාගශීලී සභාවක් තුළ ඒ රු.8000.00 ගන්න බැරි වුණොත් ලොකු අපහසුතාවයකට ලක් වෙයි.මොකද මං හිතන්නේ ඒ වගේම විශ්‍රාම සුවයෙන් සුවයෙන් ඉන්න මන්ත්‍රීවරුත් ඉන්නවා. හැබැයි අපේ දිලින් මන්ත්‍රීතුමා කිවුව වගේ දේශපාලනය කරත් මං හිතන්නේ අපේ දකුණුපස සහොදරයෝ වැඩි පිරිසක් වෘත්තීය වශයෙන් ඒ කියන්නේ දීමනාවක් හෝ පඩියක් හෝ මොකවත් නොගෙන කැප කිරීම් කරන පක්ෂෙපුර්ණකාලිනව මං හිතන්නේ උපසභාපතිතුමා, සභාපතිතුමා වගේ අනෙකුත් මන්ත්‍රීවරුත් මෙතන ඇති.අපි රැකියාවක් කරන ගමන් තමයි මේ කටයුත්ත කරන්නේ. යම් පිරිසක් මෙතන ඉන්නවා.අපි 36 දෙනාගෙන් මං හිතන්නේ 10 දෙනෙක්වත්, මං හිතන්නේ රජයේ ඒ කටයුතුවල තමයි නියලිලා ඉන්නේ.ඒක නිසා මං හිතන්නේ ඔබතුමා අවධානය යොමු කරන්න.මං හිතන්නෑ විරුද්ධ වෙයි කියලා.මං හිතන්නේ සභාවේ ඒකමතික තීන්දුවක් විදිහට යවන්න ඕන.ඒ විදිහට වැඩ කරන්න.පළාත් පාලන සංසදය තියෙනවනේ ඔබතුමාලගේ.සභාපතිවරු එක්කත් සාකච්චා කරන්න.ආණුඩුකාරතුමිය,අපට විතරක් නෙමේ මුළු ලංකාවටම ආවේනික ප්‍රශ්නයක් වෙන්න ඕන මේක.මොකද ඇත්තටම සබාපතිතුමනි පුනරුදය ආණ්ඩුවේ මුලයමය වංචා වෙන්නේ නෑ.ඒ වගේ කටයුත්තකට ඉඩ දෙන්නෙත් නෑ අතිගරු ජනාධිපතිතුමා.අපි ඒක අගය කරනවා.හැබැයි අපි මේ රීතිය අනුව අපි නිකන් බොරුවට පවු පුරවනව, මං දන්නෑ ඔබතුමා මොන මතය දරයිද දන්නෑ.අපේ දිලින් මන්ත්‍රීතුමාකිවුව වගේ, ඉන්ධනවලට රු.5000.00,දුරකතනවලට රු.3000.00 දෙනවා,ඇයි අපි බොරුවට පව් පුරව ගන්නේ.මෙතන ගොඩක් බෞද්ධයෝ ඉන්නේ.අපි සියලු දෙනා පවු පුරව ගන්න ඕන් නෑනේ.ඒ නිසා මං හිතන්නේ කාලෝචිත යෝජනාවක්.ඒකමතිකව අනුමැතිය දුන්නා කියලා සටහන් කරන්න.සටහන් කරලා ගරු සභාපතිතුමා අතේ පළාත් සභා,සභාපතිවරුන්ගේ සංසදය එක්ක සාකච්ඡා කරන්න.සාකච්ඡා කරලා ආණ්ඩුකාරතුමියගේ නිර්දේශය අරගෙන පළාත් පාලන කොමසාරිස් හරහා මේක අනුමැතියක් ගේන්න.මේක අත්‍යවශ්‍ය කටයුත්තක්.

**සභිකපී.එම්.චන්ද්‍රදාසමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම විශ්‍රාම යන්න පෙර වැඩ කළේ දුම්රිය දෙපාර්තමේන්තුවේ.අපිට ටයිමින් ෂීට් එකක් කියලා මේ වගේම කොළයන් දෙනවා ඒකෙ අපි තමයි සේවා වාරයක් යනකොට ,සේවා වාරය සටහන් කරන්න,ON එක off එක ඊළඟට ඒ සේවා වාරයේගෙවන otඑක bata එක ආටස් ඒ සියල්ල සටහන් කරන්නේ අපි.අපිම සටහන් කරලා ඊට පස්සේ office එකට භාර දෙනවා.එතනදී අපි බොරුවක් කරලා අපි නියමිත සේවා වාරයට නියමිත otඑක අර ගෙන නියමිත ආටස් එක අරගෙන ඒක සටහන් කරන්නේ අපි. නමුත් මේ අපි මේ යන්නේ රු.8000.00 ලබා ගැනීමසඳහා දීලා තියෙන කොළේ මම ඇගයීමක් කළාට පස්සේ මට හිතුනා මොකද මේ වැඩේ තේරුම කියලා.අපි මොනතරම් බොරුවක් කරන්න ඕනද මේ මුදල ගන්න කියලා.අපි හදවතට එකඟව ඇයි අපි බොරු කරන්නේ.අපි අද මේ අද දහවල් කෑම වේලක් අපි කෑවා.මේ කෑම වෙල කන්නෙත් කාගෙ මුදල් ද.ඒනිසා අපිට බොරු කරන්න ඕන නෑ.බොරු කරන් නැතුව නියම විදිහට කරන වැඩේට එලදායී මුදලක් ලැබෙන විදිහට අපි වැඩ කරන්න ඔනේ.අපි ඇවිල්ලා ඉන්නේ මහජනයගේ අවශ්‍ය කටයුතු ඉෂ්ට කිරීමට.ඒ නිසා මේ සටහන් කිරීමට දීලා තියෙන කොළේ අරගෙන මං ඇත්තටම සෑහීමකට පත්වෙන්නේ නෑ.එහෙම නැතුව මේ මුදල දෙනව නම් ඒ මේ දීමනාව වන රු.15000.00ට එකතු කරලා දෙන්න කටයුතු කරනව නම් හොඳයි. නැත්නම් මේක බලපුවහම,කිලෝමීටරයට ත්‍රිවිල් රථයකට රු.10.00 ක් අය කරන්න කියලා තියෙන්නේ.ඉතින් ඒවා විහිළු වැඩ.ඒනිසා මේ දේ දෙන්න අපහසු නම් නොදුන්නත් ප්‍රශ්නයක් නෑ.දෙනව නම් අපි ඇත්ත විදිහට කටයුතු කරලා ,කරන දේට ලැබෙන පිරිවැයක් වශයෙන් කටයුතු කිරීමට ඔබතුමාගේ අවධානය යොමු කරන හැටියට මමත් ඉල්ලා සිටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම මේ යෝජනාවත් ඊට අදාළව අපේ මන්ත්‍රීවරුත් කතා කරපු යෝජනාත් ඇත්තටම ඇත්ත.මම කියන්නේ මට ගත්තොත් එහෙම උපසභාපති හැටියට මට ඇත්තටම මට මේකෙ වාර්තා කරන්න දේවල් ඕන තරම් දේවල් තියෙනවා.නමුත් දැන් ගමන් වාර සටහන් අපි ගත්තොත් අනිත් මන්ත්‍රීවරුන්ට ගත්තොත්,ගොඩක් වෙලාවට අසත්‍ය තමයි මේකේ සටහන් කරන්න වෙන්නේ. අසත්‍ය නෙමෙයි, කවුරුවත් ඒක මතක තියා ගන්නේ නෑ නේ .ඉතින් මාසෙ ගමන් ටික මතක තියා ගන්නේ නෑ කවුරුවත්.අර ප්‍රායෝගික තත්ත්වයෙන් මිදිලා.ඒකගන්න විදිය ප්‍රායෝගික නෑ.මට හිතෙන්නේ ඇත්තටම පසුගිය සභා කාලයේදීදුරකතන දීමනා හා ඉන්ධන දිමනා විදිහට මං හිතන්නේ අපි මේක කතා කරන්න ඕන. මෙතන යෝජනා වුණා වගේ ආණ්ඩුකාරතුමියත් එක්කත්.මං හිතන්නේ අනිත් සභාවලත් මේ ප්‍රශ්නය ඇති.එහෙම කතා කරලා මේකට මොකක් හරි ක්‍රමවේදයක් සකස් කරමු කියන යෝජනාව මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා:-**

ඔව් බොහොම ස්තූතියි.ඇත්තටම මේක අපේ දිලීන් මන්ත්‍රීතුමාගේ විතරක් යොජනාවක් නෙමෙයි.අපේ කාගෙත් යෝජනාවක් .ඒක පිළිබඳ විවිවාදයක් නෑ.ඇත්තටම මේ ගැන මීට මාසෙකට ඉස්සෙල්ලා ගරු ආණ්ඩුකාර තුමිය හම්බෙච්ච වෙලාවේ මං සාකච්ඡා කළා.ඒ කතා කරන වෙලාවෙත් රුවන්වැල්ලෙ සභාපතිතුමත් කෝල් එකක් දාල තියෙනවා.මේ ඔය ගැටලුව මයි.ඇත්තටම ආණ්ඩුකාරතුමියටත් හිනා ගියා.ඉතින් මේක මං හිතන්නේ අපි ඒකමතිකව සම්මත කරමු. අපට සමහරවිට පුළුවන් වේවි ඉස්සරහට ඇත්තටම මේක අනවශ්‍ය කරදරයක්.අනික තමයි අනවශය වියදමක්.තවත් කාලය යනවා. ලිපිගොණු පුරවනවා කියන්නේ එතනත් සෑහෙන්න වියදමක්.අනික අපේ නිලධාරීන්ට ලේකම්තුමා ඇතුළු අනෙකුත් අයටත් කාලය හා ද්‍රව්‍ය අපතේ යනවා.ඒකහිනදා මේක කාලෝචිත යෝජනාවක්.

ඒ අනුව සභික දිලීන් කරුණාපාල මැතිතුමාගේ 6.49.සභිකයන්ට සභා අරමුදල හරහා ලබා දෙන මාසික යැපීම් හා ගමන් වියදම් දීමනාව රුපියල් 8000.00 සභික දීමනාව සමග එකතු කර ලබා දීම යෝජනාව සම්බන්ධව ආණ්ඩුකාරතුමිය දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික දිලීන් කරුණාපාල මැතිතුමාගේ 6.50. යෝජනාව

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.50.1987අංක 15 දරණ පළාත් පාලන පනතේ 107 වගන්තිය යටතේ සැබෑ වශයෙන් අවධානමට ලක්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා පරීක්ෂණ ගාස්තු නිදහස් කිරිමේ යෝජනාව.**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ මේ පැත්තේ කණ්ඩායමේ ගොඩක් ගරු මන්ත්‍රීවරුන්ට තාම පනත හම්බෙලා නෑ.ඒ ගැනත් මං අවධානය යොමු කරනවා.කරුණාකරලා ඉක්මනට පනතයි ඒ රීති මුද්‍රණය කරපු පිටපත් ටිකයි ඉක්මනට ලබා දෙන්න කියලා.ලබා දුන්නොත් මේ ගැන අධ්‍යනය කරන්න පුළුවන් කියලා.ඒකත් මතක් කරනවා මේ වෙලාවේ.මං මේ 107 වගනතිය යටතේ සභාපතිවරයාට බලතල පැවරිලා තියෙනවා යම් ප්‍රාදේශිය සභාවක ප්‍රදේශයක් තුළ යම් ගසකින් හෝ ගසක යම් අත්තකින් කඳකින් ගෙඩියකින් හෝ වෙනත් කිසිවකින් ගොඩනැගිල්ලට අලාභ හානි සුදුවෙනව නම් හෝ අලාබ හානි වීමට ඉඩකඩ ඇති හෝ අවස්ථාවක නැතහොත්ගොඩනැගිල්ලක පදිංචිකරුවන්ට හෝ යම්යම් ප්‍රසිද්ධ මාර්ගයක ගමන් කරන්නන්ගේ ආරක්ෂාවට අනතුරුදායක තත්ත්වයක පවතින අවස්ථාවක ප්‍රාදේශිය සභාවක සභාපතිවරයා විසින් ඒ ගස පිහිටියා වූ ඉඩමේ අයිතිතරු වෙත හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් දැන්වීමකින් භාර දීමෙන්,ඒ දැන්වීමේ නිශ්චිතවසඳහන් කරන ලද කාලය ඇතුළත ඒ ගස බැද තැබීමට හා ආරක්ෂාවට අනතුරුදායක නොමැති ලෙස තැබීමට හෝ ඒ ගස හෝ ගසේ අත්ත කඳ ගෙඩි හෝ වෙනත් යම් කොටසක් කපා ඉවත් කිරීමට ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකිය.කියන වගන්තිය තමයි 107.මේකට සමගාමීව 107 ආ කියලා වගන්තියකුත් තියෙනවා.ඔබලට අවධානය යොමු කරන්න පුළුවන්.සභාපතිතුමනි අනෙක් මන්ත්‍රීවරුන්ට පනත හම්බුණාට පස්සේ. එතකොට එතකොට මෙතනදී මං ගියවර මට මතකයි සභා වාරයකදී මේ වගන්තියේ ගැටලුවක් තිබ්ලා.අපේ යෝජනා සම්මතයකින් ඒ ගැටලුව නිරාකරණය කළා මගේම යෝජනාවකින්.මං නැවත වරක් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.මෙතනදී ඇත්තටම අපි හිතමුකෝ ඉතාමත් දුප්පත් ගෙයක් තියෙනවා.ඒ ගෙදරට වැටෙන්න කොස් ගහක් තියෙනවා.එතකොට ඒ වැටෙන කොස් ගහ කපන්න විදිහක් නෑ.ග්‍රාම නිලධාරී අනුමැතිය දෙන්නේත් නෑ,ඉඩමේ ඔප්පුව නිරවුල් නෑ.පත්ඉරු ගේන්න කියලා තියෙනවා.මේ වගේ ප්‍රායෝගික අවස්ථා මත ඒ කොස් ගහේ අත්තක් හරි ඒ ගහ හරි කපන්න ඉඩ හම්බෙන් නෑ.වෙනත් ආයතන වලින්.නමුත් ඒකට පැහැදිලිව අපේ පනතේ බලය දීලා තියෙනවා අනතුරුදායක තත්වයක් තියෙනව නම් ෙක ඉවත් කර ගන්න.හැබැයි ඒක අන්ත දුගී ගෙදර,ඒ නිවසියා ප්‍රාදේශි සභාවට ඇවිත් කිවුවාහම මට මේ ගහ කපා ගන්න ඕනෙ,අත්තක් ඉවත් කර ගන්න අවස්ථාව දෙන කිවුවහම ආ මේ ෆෝම් එක තියෙනවා පුරවලා රු.1000.00 ක් එක්ක නෑ මං හිතන්නේ දැන් ඒක රු.1500.00 යි.කොස් ගස් අනතුරුදායක ගස් ඉවත් කිරීමට ඒක රු1000.00 ක් හරි රු.1500.00 ක් හරි ගෙවන්න කියනවා. එහෙම ගෙවන්නත් බැරි අය ඉන්නවා.සභාපතිතුමනි අපේ මේ ප්‍රදේශවල මම කියන්නේ ඔබතුමාට බලය පවරලා තියෙනවා එහෙම ගෙවන්න බැරි අයට යම් කිසි සාධාරණ ගාස්තු නිදහස් කිරීමකින් ඔබතුමාගේ අනුදැනුම යටතේ ඒ ගාස්තු නිදහස් කිරීමකදි ඒ අනතුරු දායක තත්ත්වයෙන් ඔවුන්ට මුදවන්න පුළුවන්නම් අපට මේ සමාජ සේවය මේ ප්‍රාදේශිය සභාවෙන් කරන සමාජ සේවය තවදුරටත් කාර්යක්ෂම කරන්න පුලුවන්.හැබැයි මේ මෙතන මේ සිස්ටම් එක හැදිල තියෙන්නේ,එහා ගෙදරින් තමයි ෆෝම් එක ගේන්න ඕන,තමන්ගේ ගෙදර ඒ අනතුරු දායක තත්ත්වයේ ගහ ඉවත් කරන්ඩ නම් එක්කො අර එහා ගෙදරින් තමයි ෆෝම් එක ගෙනත් දෙන්නේ.ඒකත් ඇත්ත.ඒකත් අර කලින් කතා කරා වගේ. එතනත් බොරුවක් කරන්නේ.ප්‍රායෝගික තත්ත්වය එතන බොරුවක් කරන්නේ.අපේ ගෙදර ගහක් අනතුරු දායකයි අෙපිට ඒ ගහ අයින් කරගන්න ඕන නම්,අල්ලපු ගෙදරට ෆෝම් එකක් දෙනව මේක ඉවත් කරගන්න කියලා.මං කියන්නේ ප්‍රායොගික තත්ත්වය තුළ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මම මහා සභාව මේ මොහෙතේ සිට කාරක සභාවක් බවට යෝජනා කරමි.

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, මම කාරක සභාව මේ මොහොතේ සිට මහා සභාවක් බවට යෝජනා කරමි.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අනේ සමාවෙන්න.අනවශ්‍ය ප්‍රශ්න අහනවා කියලා හිතන්න එපා.මේකෙදී අපි කතා වුණා නිතිය අවභාවිතා විමක් සම්බන්ධව.අපේ ගෙදර ගහ අල්ලපු ගෙදර ලිපිනය දාලා ගන්න පුළුවන් කියලා.ගරු සභාපතිතුමනි, එහෙම අවස්ථාවලදීඅපට සහනය ලබා දෙන්න පුළුවන්ද කියන ඒක පොඩ්ඩක් අපි තීන්දු කරලා සාකච්ඡා කරන්ඩ වෙනවා.දැන් ඇත්තදාල කිරීමට අපහසු අය ඉන්නව නම් ඔවුන්ට සහනයක් දෙන්න.ඒත් හැබැයි ඒදෙනකොට චක්‍රාකාරව අපි අවස්ථාවක් දෙනවා නිතිය අවභාවිතා කිරීමට.හැමෝම දන්න දෙයක් මෙච්චර කාලයක් පවතුන දෙයක් හැබැයි.ඉතින් එතකොට ඒවා අපි පොඩ්ඩක් සභාවේ තින්දුවක් ගන්න කොට ඒ වා ගැනත් කල්පනා කරලා තීන්දුවක් ගන්න වෙනවා.හරි අපේ වාර්තාවට ලියලා තියෙනවා.

**සභාපතිතුමා:-**
හරි අපි ඒකට අවසර දෙන්නේ බලපත්‍ර අවශ්‍ය කරන අයට ගස් කපන්න නෙමෙයි.මෙතුමා යෝජනාව සම්මත කර ගත්තේ,අඩු ආදායම් ලාභී අයගේ ප්‍රවාහන හා නිරීක්ෂණ ගාස්තු නිදහස් කරන්න ,නැතුව බලපත්‍රයක් ඇති ඒවා කපලා ඉවත් කරන්න නෙමෙයි.අපි ඒක අනුමත කළේ.මේ මන්ත්‍රිතුමාට ඒක පැහැදිලි වෙන්න නැතුව ඇති.නැතුව අපි අරක අවභාවිතා කලේ නෑ.එහෙම නේද දිලීන් මන්ත්‍රිතුමා.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඔව් ඔව් සභාපතිතුමනි අපි කාරකසභාවේ කතා කර ගත්තා වගේ දැනට ක්‍රමවේදයක් තියෙනවා ඒ සාධාරණය කරන්න ඕන පවුල් වලට අඩු ආදායම් ලාභීන් කියලා සහතිකයක් ගත්තොත් එහෙම ග්‍රාම නිලධාරී තුමාගෙන් ඔවුන්ව පරික්ෂණ ගාස්තුවලින් නිදහස් කරන්න.කාරක සභා අවස්ථාවේ සාකච්ඡාවේදි අපට ඔප්පු වුණා.ඒ අනුව ඉතින් මේ යෝජනා අවස්ථාව උදා වෙයි කියලා විශ්වාස කරනවා.

ඒ අනුව සභික දිලීන් කරුණාපාල මැතිතුමාගේ 6.50.1987අංක 15 දරණ පළාත් පාලන පනතේ 107 වගන්තිය යටතේ සැබැ වශයෙන් අවධානමට ලක්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා පරික්ෂණ ගාස්තු නිදහස් කිරිම යෝජනාව සඳහා,පරික්ෂණ ගාස්තු වලින් නිදහස් කිරිමට සභාපතිට බලය තිබෙන බවට ප්‍රකාශ වීමෙන් පසු පරික්ෂණ ගාස්තු නිදහස් කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික පී.එම්.චන්ද්‍රදාසමැතිතුමාගේ 6.51. යෝජනාව

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,

**6.51.විලේගොඩ හරහා බෝපැත්ත වෙලන්ගල්ල මාර්ගයේ බෝපැත්ත පිරිවෙන අසලින් පොල්හනාව දක්වා ඇති මාර්ගය ආරම්භක පිවිසුමට බෝක්කුවක් යොදා පොල්හනාවේ සරත් මහතාගේ නිවස අසලට සුදුසු ක්‍රමයකට සංවර්ධනය කිරීම.(මෙය පවුල් 50 කට පමණ ප්‍රයෝජනවත් වන අතර එම ප්‍රදේශයේ කුඹුරු ඉඩම් සඳහා යන මාර්ගයකි.)**

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ මාර්ගය දැනට අවුරුදු ගණනාවක සිට සංවර්ධනය වෙලා නෑ.මේ මාර්ගයේ වැසි දිනවලට යාම ඉතාම අපහසුයි.වැසි දිනවලදී දිය පාරක් හා සමානයි.මේ මාර්ගයෙන් නිවාස 50 කට පමණ යනවා.ඒ විතරක් නෙමෙයි කුඹුරු අක්කර 5 කට පමණ මේ මාර්ගයේ යනවා.කෘෂිකාර්මික හා ගොවිතැන් කටයුතු සඳහාත මේ දෙමෝදර වෙල් යායා,.......කොස් ගහ කුඹුර යන මේ කුඹුරු වලට තමයි යන්නේ.ඒ නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කර හැකි ඉක්මනින් සංවර්ධන කටයුත්තක් කරලා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මම ඒ චන්ද්‍රදාස මැතිතුමා කරපු යෝජනාව ස්ථිර කරන ගමන්ම මම කියන්න කැමතියි අපි ග්‍රාමීය සංවර්ධන සැලැස්මට යෝජනා දාන්න කැමති වෙලා තියෙනව,අනුමැතියත් ලබා ගෙන තියෙනවා.ඒ වගේම මෙතන සඳහන් වෙනවා පවුල් 50 තට පමණ ප්‍රයෝජනවත් වන අතර එම ප්‍රදේශයේ කුඹුරු ඉඩම් සඳහා යන මාර්ගය කියලා.කුඹුරු ඉඩම්මාර්ගය කිවුවහම ඇත්තටම ඒක සත්‍ය කාරණාවක්.ඊළග කන්නය සඳහා විමධ්‍යගත අයවැයෙන් ලක්ෂ 10 ක් වෙන් කර ගෙන ඇල වේලි සුද්ද කරගෙන තියෙනවා.ඒ දෙමොදර යාය,...ඒ ඇල මාර්ග සියල්ලම.ඒ නිසා මං හිතන්නේ ඒ යෝජනාව කුඹුරු ඉඩම්වලට යන මාර්ගය හදල දෙන්න කියන එක.මං හිතන්නේ අර පුරන් කුඹුරු අක්කර 5 ක් පමණ තිබෙන ඒ ප්‍රදේශය ඒ ඇල වේලි සුද්ද පවිත්‍ර කරලා දීම හේතුවෙන්ම,මේ පාර හදල දුන්නොත් මං හිතන්නේ ඉතාමත්ම කාලෝචිතයි.මේ සියලු දෙනාටම මාර්ගය භාවිතා කරන්න පුළුවන්.මොකද ඊළග කන්නේ ඒ පුරන් කුඹුරු අස්වද්දන නිසා.

ඒ අනුව සභික පී.එම්.චන්ද්‍රදාසමැතිතුමාගේ 6.51.විලේගොඩ හරහා බෝපැත්ත වෙලන්ගල්ල මාර්ගයේ බෝපැත්ත පිරිවෙන අසලින් පොල්හනාව දක්වා ඇති මාර්ගය ආරම්භක පිවිසුමට බෝක්කුවක් යොදා පොල්හනාවේ සරත් මහතාගේ නිවස අසලට සුදුසු ක්‍රමයකට සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (මෙය පවුල් 50 කට පමණ ප්‍රයෝජනවත් වන අතර එම ප්‍රදේශයේ කුඹුරු ඉඩම් සඳහා යන මාර්ගයකි.)

**සභාපතිතුමා:-**
මී ලඟට සභික පී.එම්.චන්ද්‍රදාසමැතිතුමාගේ 6.52. යෝජනාව

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.52.බෝපැත්ත වෙලන්ගල්ල මාර්ගයේ බොපැත්ත දිද්ද කොට්ඨාශයට අයත් තෝරපලාව එම්.කේ.ඥානවතී මහත්මියගේ නිවස අසල සිට ඉදිරියට අන්නාසිගල උඩ හේන පාර සංවර්ධනය කිරීම මම යෝජනා කරමි.(නිවාස 25 කට පමණ යන මාර්ගයකි)**

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ මාර්ගය නිවාස 25 කට පමණ යන මාර්ගයක්.මං හිතන්නේ එම මාර්ගය ඊලග කොටස මෙතෙක් සංවර්ධන කටයුතු කරලා නෑ.ඒ නිසා ඒ ප්‍රදේශවාසීන්ට සේවාවක්වන මේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන හැටියට කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික පී.එම්.චන්ද්‍රදාසමැතිතුමාගේ 6.52.බෝපැත්ත වෙලන්ගල්ල මාර්ගයේ බොපැත්ත දිද්ද කොට්ඨාශයට අයත් තෝරපලාව එම්.කේ.ඥානවතී මහත්මියගේ නිවස අසල සිට ඉදිරියට අන්නාසිගල උඩ හේන පාර සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(නිවාස 25 කට පමණ යන මාර්ගයකි)

**සභාපතිතුමා:-**
මී ලඟට සභික පී.එම්.චන්ද්‍රදාසමැතිතුමාගේ 6.53. යෝජනාව
**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.53.බෝපැත්ත දිද්ද මාර්ගයේ එන්.පියදාස මහතාගේ නිවස අසලින් ඇති හෙල්හේන වත්ත පාර එම්.ආර්.මෛත්‍රිපාල මහතාගේ නිවස අසලට සංවර්ධනය කිරීම මම යෝජනා කරමි.(නිවාස 07 කට හා තේ වගා කර ඇති ඉඩමට යන මාර්ගයකි.)**

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙය පොල්හේන නෙමේ,හෙල්හේන වත්ත පාර විය යුතුයි.මෙම මාර්ගය නිවාස 07 කට හා අක්කර 2 ක පමණ වී වගාව සහිතප්‍රදේශයකට යන මාර්ගයක්.ඉතින් මේ පාර දිග 60 ක් පමණ,කිලෝමීටර 60 ක් පමණ වන මාර්ගයක්.එය සංවර්ධනය කරල දීම ඉතාම උචිත බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිමි.මේ මගේ යෝජනාතුනම ඔබතුමා අනුමත කිරීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මේ එන්. පියදාස මහතාගේ නිවස අසලින් කිවුවහම මීටර් 100 ක් පමණ ඒ කොටස සංවර්ධනය වෙලා තියෙනවා.ඒ පාර කොටසට මීටර් 150 ක් විතර ඉදිරියට සංවර්ධනය විය යුතු පාරක්.දැඩි අබලන් තත්ත්වයේ තියෙනවා.මෛත්‍රිපාල මහතාගේ නිවස කියන තැනට විතරක් සීමා නොවී මං හිතන්නේ ඉතාමත් අබලන් කොටසත් සංවර්ධනය වෙනව නම්.මං හිතන්නේ ඒ අවධානය සභාපතිතුමා වෙත යොමු කරනවා.

**සභාපතිතුමා:-**
කොහොම හරි බෝපැත්ත මන්ත්‍රිතුමයි මන්ත්‍රිතුමියයි දෙන්න එක්ක ලැස්තිවෙලා යෝජනා 6 ක්ම සම්මත කර ගත්තා.

ඒ අනුව සභික පී.එම්.චන්ද්‍රදාසමැතිතුමාගේ 6.53.බෝපැත්ත දිද්ද මාර්ගයේ එන් .පියදාස මහතාගේ නිවස අසලින් ඇති හෙල්හේන වත්ත පාර එම්.ආර්.මෛත්‍රිපාල මහතාගේ නිවස අසලට සංවර්ධනය කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(නිවාස 07 කට හා තේ වගා කර ඇති ඉඩමට යන මාර්ගයකි.)

**සභාපතිතුමා:-**
මී ලඟට සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමාගේ 6.54. යෝජනාව

**සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,
**6.54.මින්නාන නාගහවත්තේ සිට නාගොඩ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිමට මම යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා

**සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක මං හිතන්නේ අපි කුඩා කාලයේ ඉදන්ම කවදාවත් සංවර්ධනය වෙලා නෑ.යාවත් කාලීන වෙන විදිහට කල් පවතින විදිහට සංවර්ධනය වෙච්ච නැති පාරක්.මොකද මේ පාර ගත්තොත් එහෙම නාගොඩ වෙලන්ගල්ල මාගේ මීන්නාන වසමේ නාගොඩ දක්වා තිබෙන මානියංගම දක්වා තියෙන අතුරු මාර්ගයක්.අපේ බල ප්‍රදේශයේ තියෙන මාර්ගයක්.මේ මාර්ගය වැසි වහින වෙලාවට මං හිතන්නේ මින්නාන නාගහවත්ත හන්දියට නාගොඩට හැරෙන තැන අතර මීටර් 20 ක් මීටර් 30 ක් පමණ යනකොට විශාල වලවල් ටිකක් තියෙනවා.මං හිතන්නේ මේ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙක් මැතක දී ගල් පස් ටිකක් දාලා ගොඩ කරලා තියෙනවා.මං යෝජනා කරනවා සභාපතිතුමාට ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ දෙපැත්තේ කාණු පද්ධතිය සකස් කරලා ඒ මාර්ගය පිළිසකර කරලා දෙන්න කියලා.

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මේ නාගහවත්ත හන්දියේ සිට නාගොඩ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කියන යෝජනාව මින්නාන කොට්ඨාශයේ ගරු මන්ත්‍රීතුමිය කොට්ඨාශ සභාව හරහා සම්බන්ධිකරණ කාර්යාලයටත් යොමු කරපු ලිපියක් තියෙනවා.ඒක මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි.මොකද ඊට පස්සේ 6.30 වෙනි යෝජනාව පිළිබඳව සඳහන් කරන ලිපිය ඊට පස්සේ 7.14 සබරගමුව පලාත් සභාවට යොමු කරන ලද ලිපියකුත් ඒ සඳහා පරීක්ෂණයක් පවත්වන්න ලෙස ,සදහන් කරන ලිපියක තියෙනවා.මං හිතන්නේ මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රිතුමා වගේම මින්නාන කොට්ඨාශයේ ගරු මන්ත්‍රීතුමියත් මං හිතන්නේ එකම යෝජනාව යෝජනා කරලා මේ දක්වා ඒ සම්බන්ධව පොඩි ක්‍රියාත්මක කිරීමක් ඇවිල්ලා තියෙනවා.දෙදෙනාම ඒ සඳහා කැප වීමෙන් ඒ සංවර්ධන යෝජනාව ඉදිරියට කරගෙන යයි කියලා මම ඒ මන්ත්‍රීතුමිය මේ අවස්ථාවේ නැති නිසා ඒ සඳහා පැහැදිලි කිරීමක් මේ අවස්ථාවේ කරේ.

ඒ අනුව සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමාගේ 6.54.මින්නාන නාගහවත්තේ සිට නාගොඩ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමාගේ 6.55. යෝජනාව

**සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.55.නාගොඩ සුද්දාගේ වත්ත මාර්ගය (ලෙටර්ඩයස් වත්ත) ජයසේන මහතාගේ නිවස අසල සිට ප්‍රජා ශාලාව දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට මම යෝජනා කරමි.**

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ යෝජනාව මං සභාවට දැම්මෙ 7.10 වන දින. ඒ සුද්දාගේ වත්ත ප්‍රදේශයේ සහොදර ජනතාව දැඩි මහන්සියෙන් එකතු කරපු සල්ලි වලින් සිමෙන්ති කොට්ට් දෙක තුන එකතු කරගෙන සිමෙන්ති කොට්ට 100 ක් පමණ එකතු කරගෙන විශාල ව්‍යාපාතියක් කළා. ලොකු ශ්‍රමයක්.මං ඒ පිළිබඳව ස්තූතිවන්ත වෙනවා සුද්දගේ වත්තෙ ජනතාවට.නමුත් මේකෙ තව යම්කිසි කොටසක් ඉතුරු වෙලා තියෙනවා ඒ කොටස අපි ප්‍රාදේශිය සභාව හැටියට මං බැලුවේ ඒක අපි ඉටු කරන්න.ඔබතුමන්ගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මම ඒකට දිගුවක් එකතු කරන්න කැමතියි.මම අල්ලපු කොට්ඨාශයේ නිසා මට වුණත් දැනුම් දීලා තිබුණා මේ පාර සම්බන්ධව.මං හිතන්නේ ඒ ගමේ ජනතාව ඉදිරිපත් වෙලා සිමෙන්ති එකතු කරමින් ගල් වැලි එකතු කරමින්,මං හිතන්නේ රටේ වෙනස තමා මේ ඇති වෙන්නේ.රටේ මේ ප්‍රාදේශිය සභාවකින් මේ සියලුම දේ ප්‍රතිපාදන අරගෙන සංවර්ධනය කරගෙන කියන තැනට වඩා අපි අපේ ගම සංවර්ධනය කරමු කියන තැනට ආකල්ප වෙනස් වෙගා.මේ නව පුනරුදයේ ආකල්ප වෙනස් වෙලා කියන තැන සුද්දගෙ වත්ත ගම අපට උදාහරණයට ගන්න පුළුවන් ගරු සභාපතිතුමනි.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ජානක මන්ත්‍රිතුමා යෝජනා කරපු පාර මං හිතන්නේ ආර්ථික වහයෙන් අපට විශාල ආදායමක් එන මාර්ගයක්.විශාල ප්‍රමාණයයක් ඒ මාර්ගයේ ගමන් කරනවා.තේ දළු ලොරි ඒ මාර්ගයේ තමා යන්නේ.එතකොට අපට විදේශ විනිමය ලබා දෙන මාර්ගයක් වෙනවා.ඒ මාර්ගය.ඒ මාර්ගය ඉහල කොටස අබලන් වෙලා.ඒ පාර අලුතින් අපි එකතුවෙලා ඉහල කොටස සංවර්ධනය කළා.අපි මුදල් යොදවලා කිප වතාවක්.ඒ නිසා ඒ මාර්ගය තව සුද්දගේ වත්ත ප්‍රදේශයේ තව මැද කොටසකුත් තියෙනවා.තව සුළු කොටසක්

ඉතුරු වෙලා අපට කරන්න.ඒ මාර්ගය සංවර්ධනය කරනව නම් ඉතාම උචිතයි කියලා මං ඔබතුමාට ඒකත් යෝජනා කරනවා.

ඒ අනුව සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමාගේ 6.55.නාගොඩ සුද්දාගේ වත්ත මාර්ගය (ලෙටර්ඩයස් වත්ත) ජයසේන මහතාගේ නිවස අසල සිට ප්‍රජා ශාලාව දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමාගේ 6.55. යෝජනාව

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.56.කිරිපෝරුව ශ්‍රී නාගරුක්කාරාම විහාරස්ථානය පහල වීරසිංහ නාගොඩ පාර ආරියසේන මුදලාලිගේ නිවස අසල දක්වා කොන්ක්‍රිට් කිරීමට මම යෝජනා කරමි.**

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම මාර්ගයේ අඩම අපේ කිරිපෝරුව කියන ගම්මානයේ වීරසිංහගොඩ කියලා කුඩා ගම්මානයක් තියෙනවා.ඒ ප්‍රදේශයේ නිවාස මංහිතන්නේ 150 ක් වගේ තියෙනවා.ඒ මාර්ගයේ හදිස්සියකට යන්න බෑ.වලවල් හැදිලා වතුර පිරිලා,අපේ මන්ත්‍රිතුමියගේ නිවසට යන මාර්ගයත් මේක.කැඩිලා තියෙන්නේ.එම නිසා එම මාර්ගය අපට සංවර්ධනය කරලා දෙනව නම් ඉතාම හොඳයි.ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

**සභිකඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒක මන්ත්‍රිතුමිය යන පාර විතරක් නෙමෙයි.ආර්ථික වශයෙනුත් වැදගත් මාර්ගයක්.මං හිතන්නේ කුඩා තේ වතු රාශියක් තියෙනවා.ඒ මාර්ගය හරහා.ඒකත් ලොකු පිටුවහලක් වෙනවා මාර්ගය සංවර්ධනය කරලා දුන්නොත්.පන්සල පාර පිටිපස්සෙන් යන පාර කියන්නේ. ඒ නිසා ඒ පාර සංවර්ධනය කිරිම කාලෝචිතයි.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මේ පාරෙන් රොහලට, පාසලට ළමයි යනවා.පන්සලට යනවා.ඒ වගේම දළු ලොරි ප්‍රවාහනය වෙනවා.ඒ වගේම ආර්ථික වශයෙන්, පිටි මෝලක් අපේ ගමේ කරගෙන යනවා ඒ වගේ.ගොඩක් සංවර්ධනය විය යුතු පාරක්.දැනටත් මඩ වගුරු ප්‍රදේශයක් තමා තියෙන්නේ.ඒක සංවර්දනය කිරිම ඇත්තටම සුදුසුයි මමත් යෝජනා කරනවා.

ඒ අනුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමාගේ 6.56.කිරිපෝරුව ශ්‍රී නාගරුක්කාරාම විහාරස්ථානය පහල වීරසිංහ නාගොඩ පාර ආරියසේන මුදලාලිගේ නිවස අසල දක්වා කොන්ක්‍රිට් කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමාගේ 6.57. යෝජනාව

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.57.කිරිපෝරුව අක්කර 15 මාර්ගය කොන්ක්‍රිට් කිරීමට මමයෝජනා කරමි.**

**සභිකඑච්.එල්.දීපාල් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අක්කර 15 ප්‍රදේශයේ විශාල ජනතාවක් ජිවත් වෙනවා.ඒ වගේම තේ වතු තියෙනවා, රබර් වතු තියෙනවා.පාසල් දරුවන් විශාල ප්‍රමාණයක් එනවා.අපට හදිසියේ රෝගියෙක් හිටියොත් ඒ රෝගියාව රෝහලට අරගෙන යන්නටත් ඉතාම අමාරු තත්ත්වයේ තියෙන්නේ අක්කර 15 උඩ කොටස.එම නිසා එම කොටස කොන්ක්‍රිට් කරලා සංවර්ධනය කිරිම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමාගේ 6.57.කිරිපෝරුව අක්කර 15 මාර්ගය කොන්ක්‍රිට් කිරිම යෝජනාව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමාගේ 6.58. යෝජනාව

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,

**6.58.මීටිපොල දියවෙල්ල මුක්කරදෙණිය මාර්ගය ප්‍රසංගගේ නිවස අසල සිට මීටර් 100 ක් සංවර්ධනය කර කොන්ක්‍රීට් කිරීමට මම යෝජනා කරමි.**

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මීටිපොල දියවෙල්ල මුක්කරදෙණිය කියලා මාර්ගයක් තියෙනවා.මේ පන්විල මාර්ගයට යන්න තියෙන මාර්ගයේම දකුණට යන්න තියෙන පාරක්.මම මේ ප්‍රදේශයේ ගිය අවස්ථාවක දැක්කා ඇත්තටම අසරණ රෝගියෙකුට හදිස්සියකට ත්‍රිවිල් එකකවත් යන්න බෑ.උත්සගෙන එන්නත් බෑ.ඒ තරමට පාර සවුත්තු වෙලා.අපේ ගරු මන්ත්‍රීතුමිය මීට පෙර මං හිතන්නේ ඒ ගැන යෝජනා කරලා තිබුණා,ඒ ප්‍රදේශයේ අඩුම ගානේ මීටර් 100 යක්වත්.තව කොටසක් තියෙනවා කඳු සහිත කොටසක් තියෙනවා.ඒටික කොන්ක්‍රීට් කරලා යන්න පුළුවන් විදිහට හදලා දෙන්න කියලා තමයි මම යෝජනා කරන්නේ.

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහමැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මේ යොජනාවට මේ මාර්ගයේ කොටස් දෙකක් තියෙනවා.යෝජනාව ස්ථිර කරනවා.මුක්කරදෙනිය ප්‍රදේශයේ සාමාන්‍යයෙන් මීටර් 50 ක් වගේ වාහනයක් ,ත්‍රිවිල් එකක් ගන්ඩ බැරි කොටස් දෙකක් තියෙනවා.ඒ ස්ථාන දෙක පිළිසකර කරලා දෙන්න කියලා තමයි යෝජනා කරන්නේ.

ඒ අනුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමාගේ 6.58 මීටිපොල දියවෙල්ල මුක්කරදෙණිය මාර්ගය ප්‍රසංගගේ නිවස අසල සිට මීටර් 100 ක් සංවර්ධනය කර කොන්ක්‍රීට් කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණියගේ ගේ 6.59. යෝජනාව

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණිය:-**
ගරු සභාපතිතුමනි,
**6.59.පාළු ගෙදරවත්ත ප්‍රජා ශාලාව සිට බේරුවාන වත්ත පාර කොන්ක්‍රීට් කිරීමට මම යෝජනා කරමි.(රංග මහතාගේ නිවස ඉදිරිපිට)**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මෙතන ඒ පාරේ එක එක දේශපාලන පක්ෂවල ආණ්ඩු තියෙන වකවානුවල ඒ ඒ අදාල අය ඒ ඒ තැන්වල පිලිසකර කරගෙන පාරවල් සංවරධනය කරගෙන තියෙනවා.මං හිතන්නේ මෙතන මාලිමා පාක්ෂිකයෙක් තමයි මේ ගෙදර ඉන්නේ.ඒ ගේ ඉස්සරහා තමයි බයික් එකකටවත් යන්න බෑ.ඒ ගේ ළඟ මේ වෙනකොට දෙතුන් දෙනෙකුත් බයික් එකෙනුත් වැටිලා තියෙනවා.පයින්වත් යන්න බැරි මාර්ගයක්.මීටර් 100 ක් වගේ තමයි තියෙන්නේ.ඒ වුණාට එතනින් තමයි පාර පටන් ගන්නේ.මොන දේශපාලන පක්ෂෙයෙන් මොනව කරත් එතනින් තමයි පාර පටන් ගන්නේ.මෙතන රංජන් මහත්තයාගේ නිවස ඉදිරිපිට.මං හිතන්නේ මලිත් මහත්තයා හිටියනම් මේක කතා කරයි.එතුමාගේ පෝස්ටර් ටික ප්‍රදර්ශනය කරලා තිබුණෙත් ඒ ගෙදර.නමුත් මේක කතා කරන්නම ඕන කියන්නේ ඒක ඒ පාරෙන් ඒ ගමට යන්න බැරි හින්ද.විශාල හානියක් වෙලා තියෙනවා.මොකද පයින්වත් යන්න බෑ.ඒ පාරේ යන්න බෑ.ඒ පාරෙ මං දැක්ක,ඒ කියන්නේ මං දැනුවත්වම කාන්තාවෝ දෙතුන් දෙනෙක් එතන වැටිලා එහෙම ප්‍රශ්න වුණා.ඒක හින්ද ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා ඒක පිළිසකර කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණියගේ ගේ 6.59.පාළු ගෙදරවත්ත ප්‍රජා ශාලාව සිට බේරුවාන වත්ත පාර කොන්ක්‍රීට් කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(රංග මහතාගේ නිවස ඉදිරිපිට)

**සභාපතිතුමා:-**
මී ලඟට සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණියගේ ගේ 6.60. යෝජනාව

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණිය:-**
**6.60.දීගල්ලට යන මාර්ගය සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික එච්.ජේ.පී.හිරිපිටියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණිය:-**
ගරු සභාපතිතුමනි,දිගල්ල කියන්නේ උඩුමත්ත වසමේ කෙළවර තියෙන ගමක්.ගෙවල් 25 විතර තමයි තියෙන්නේ.වැහි කාලයට මොකද මං හිතන්නේ අපේ පළාතට වැස්ස තමයි වැඩියෙන්ම ලැබෙන්නේ.වැහි

කාලයට යන්තම් වතුරක් ගැලුවත් මේ පාරේ යන්න බැ පැය 3 ක් 4 ක් යනකම්.ඒ ජනතාව බලාගෙන ඉන්න ඕන වතුර බහිනකම්. වෙන විකල්ප මාර්ගයකුත් නැ.මෙතන පාලමෙන් එහා කොටස දැනට දෙපැත්ත පැති බැම්ම ගහලා සංවර්ධනය කරලා තියෙනවා.ඊට මෙහා මීටර් 100 ක් වගේ කොටසක් තමා තියෙන්නේ.ඒක අපිට සංවර්ධනය කරගන්න පුළුවන් නම් විශාල පිටුවහලක් වෙනවා.ඒත් එක්කම මගේ යෝජනාවේ ඉවත් කරලා තිබුණා මොකද මේ ගමට බල්බ් තුනක් අලුතින් දාල දෙන්න කියලා.කිසිම බල්බ් එකක්,කිසිම මොනවත් මෙහෙට කෙරිලා නැ.ඒ හින්ද ඒ යෝජනාව මං මේත් එක්කම කරනවා.ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව කඳු ආශ්‍රිත ප්‍රදේශයක් තමයි දීගල්ල ප්‍රදේශයේ තියෙන්නේ.මේ මාර්ගය සංවර්ධනය නොකළොත් විකල්ප මාර්යක් නැති එක ඇත්ත.ඒක දුෂ්කර,ආර්ථික වශයෙන් යම් තත්ත්වයක් ගොඩනැගෙමින් පැවතෙන ප්‍රදේශයක්.මං හිතන්නේ ඒ පාර හදල දෙන්න පුළුවන්නම් වටිනවා.ඒත් එක්කම වීථි ලාම්පු කියන එක අර සෝලා පවර්, තියෙන ඒවා අලුත්වැඩියා කර දෙන්න බැරි නම් සෝලා පවර් එකක්වත් දීලා ඒහරියට බල්බ් එකක් ලබා දෙන්න තියෙනව නම් ගොඩක් වටිනවා.

ඒ අනුව සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණියගේ ගේ 6.60.දීගල්ලට යන මාර්ගය සංවර්ධනය කිරීම යෝජනව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකපී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ 6.61. යෝජනාව

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.61.නැදුරන කහටගහ බට්වත්ත පාරේ බට්වත්ත කඩේ ළඟ මීටර 20 ක පමණ ඉතාම අබලන් කොටස ඉතා කඩිනමින් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක කහටගහ හේන කියලා නිවරදි වෙන්න ඕන.මේක ඇත්තටම මේ මාර්ගය පවුල් ඒකක 100-150 ක් විතර ජීවත් වෙනවා.එතකොට එතන කඩයක් තියෙනවා.බට්වත්ත කඩේ ලග කියන්නේ එතන.ඇත්තටම එතන බලන්ව තියෙන්නේ ඒ පාර,ඒ ස්ථානය.එතන ස්ථානයෙන් පාසල් ළමුන් මං හිතන්නේ යන්නේ සපත්තු දෙක ගලවගෙන.එම ස්ථානයෙන්.ඉතින් ඒ හින්ද මීටර් 20 ක් විතර කියන්නේ පොඩි ප්‍රමාණයක්.ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා ඉතා කඩිනමින් ඒක සංවර්ධනය කරලා දුන්නොත් හොඳයි කියලා මම යොජනා කරනවා.

ඒ අනුවසභිකපී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ 6.61.නැදුරන කහටගහහේන බට්වත්ත පාරේ බට්වත්ත කඩේ ළඟ සිට මීටර 20 ක පමණ ඉතාම අබලන් කොටස ඉතා කඩිනමින් සංවර්ධනය කිරීම යෝජනව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකපී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ 6.62. යෝජනාව

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.62.කැන්දන්ගමුව පහළගම ග්‍රාමසේවක වසමේ කොට්ටම්බා කඩේ ළඟ සිට කොට්ටගොඩ දක්වා මාර්ගය සුදුසු පරිදි සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒන ඊට කලින් සුමිත් මන්ත්‍රීතුමාගේ යෝජනාව වූ 6.37 එම යෝජනාව.ඒක මං හිතන්නේ ස්ථිර වුණා.ඒ මාර්ගය.ඒ හින්ද ඒක ඉතා කඩිනමින් කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා:-**
හරි බොහොම ස්තුතියි.අපිට ඒ වගේ අපේ කාලය කළමණාකරණය කරලා දුන්නට.ඒකට ඇත්තටම බොහොම ස්තුතියි.

ඒ අනුවඑම යෝජනාවම **6.37**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ගේ යෝජනා වූකෝට්ටගොඩ පාර පැතිබැම්ම සහිත පාර සංවර්ධනය කිරීම බැවින් නැවත සභා තීරණයක් අවශ්‍ය නොවන බව යෝජනා කළසභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

**සභාපතිතුමා:-**
මී ලඟට සභිකපී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ 6.63. යෝජනාව

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,
**6.63.මීටිපොල පන්විල පාර මරු කන්ද දක්වා සුදුසු පරිදි සංවර්ධනය කිරිමට මම යෝජනා කරමි.**

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,

ඒක මං ඒක යෝජනා කරලා තියෙන්නේ කැන්දන්ගමුව පහලගම6.10 චමිලා සුරිආරච්චි මිය විසින් එම යෝජනාව කරලා තිබුණා.ඒක මම හිතනවා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලාඉතා කඩිනමින් කරලා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුවඑම යෝජනාවම **6.10.**සභිකඑස්.ඒ.ටී.එස්.චමිලා සුරිආරච්චි මැතිණිය ගේ යෝජනාව වූ මීටිපොල පන්විල මාර්ගයේ ඩී. අජිත් වීරතුංග මහතාගේ වත්ත අසල සිට මාර්ගය සංවර්ධනය කිරීම බැවින් නැවත සභා තීරණයක් අවශ්‍ය නොවන බව යෝජනා කළසභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

**සභාපතිතුමා:-**
මී ළඟට තියෙන්නේ සභාපති හැටියට මගේ යෝජනාවක්.

**සභාපතිතුමා:-**
**6.64.සබරගමුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හදාරමින් සිටින අංක සී 65,පනාවලපාර,ඇහැලියගොඩ ස්ථිර ලිපිනයෙහි පදිංචි එම්.ආර්.එෆ්.සාරා මෙයගේ ඉල්ලීම පරිදි,අවම මාස 2ක කාලයක් සඳහා දිනකට රු.1000.00 ක දිමනාවක් ගෙවීමේ පදනම මත ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රායෝගික පුහුණුව ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
ඇත්තටමමන්ත්‍රිවරුනි සියලු දෙනාටම මම කියන්නේ මේක ඇත්තටම කවුද කියලවත් මම දන්නේ නෑ.මාස දෙකකට කරන ඉල්ලීමක් කිව්වා.ඉල්ලීම් ලිපියක් එව්වා.එකෙ කියලා තිබුණේ කිසිම මුදලක් අය කරන් නැතුව සේවය කරන්න කියලා.නමුත් විද්‍යාවේදී උපාධිධාරිනියක්.අපිට මං යෝජනා කරන්නේ දෛනිකව පැමිණෙන දවසෙ විතරක් රුපියල් 1000.00 ක් දෙමු කියලා.ඒ කියන්නේ අපෙත් දරුවෝ ඉන්නවනේ.ඒක නිසා මං මේක යෝජනා කරන්නේ ,සභාවට පුළුවන් තීරණය ගන්න රු.1000.00 ක් දෙනවද එපාද කියලා.මේ ඉල්ලන්නේ මාස 2 ක පුහුණුවක්.ඇත්තටම මේ ශිෂ්‍යාව කවුද කියලවත් මං දන්නේ නෑ.සුදු ද කළු ද කියලවත්.මට හිතුණ අහිංසක ළමයෙක් හින්දා දීමනාවක් එක්ක හරි,රු.1000.00 ක් කමක් නෑ කියලා මං යෝජනා කළේ. ඒකෙ තීරණය බලාපොරොත්තු වෙනවා සභාවෙන්.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ ළමයෙක් ඉන්නවා HND කැම්පස් එකේ ගිහිල්ලා, එයා කළමණාකරණ ඩිප්ලෝමාවක් කරන්නේ.ඊට පස්සේ එයාටත් මාස 6 ක පුහුණුවකට ඒ අතර තුර කාලයේදී යන්ඩ කියලා තියෙනවා.දැන් රත්නපුර විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ Head Office එකේ පුහුණුවට යනව. එයාට ගෙවන්නේ රු.9500.00 යි.මාසෙකට.දවසකට නෙමෙයි.රු.9500.00 යි.ඒ අනුව මං හිතනවා රු.500.00 ක් වගේ මුදලක් ලබාදුන්නොත් ප්‍රමාණවත් නැද්ද කියලා,දවසකට.අදහසක් ගේනවා.

**සභාපතිතුමා:-**
කමක් නෑ.තීරණය කරන්න සභාවෙන්.මොකද ඇත්තටම අපි සභාවෙන් තීරණයක් කළත් අපිට අනුමතකරන්න බෑ.ඇත්තටම අපි තීරණය සමඟ අපි ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් ගාවට යවන්ඩ ඕනේ.ප්‍රධාන ලේකමතුමාට යවලා තමයි මේක දෙනවද නැද්ද කියලා තිරණය කරන්නේ.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එතකොට සභාපතිතුමනි ,අපිට මේකට අත්සන් කරන්න පුළුවන්ද?ගරු සභාපතිතුමාට හරි ,ලේකම්තුමාට හරි මේක සම්බන්ධව.
**සභාපතිතුමා:-**
මේක සභාවේ අනුමත කරගෙන ,ඊට පස්සෙ මේක ප්‍රධාන ලේකමතුමාට යවන්න ඕන.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඔය දරුවෙක් අපෙන් ඉල්ලීමක් කළාම අපේ දේශපාලන භේදයක් නොවන හින්දා අපි ඒක ළමයින්ට දෙන්න ඕන.මං හිතන්නේ.මාලින්ද මන්ත්‍රිතුමා මතු කරන්ඩ උත්සහ කළේ ඒ පුහුණුවෙන් පස්සේ අපි සහතිකයක් නිකුත් කරන්න අවශ්‍යයි නම් ඒ සහතිකය නිකුත් කිරීමේ හැකියාව සභාවේ සභාපතිතුමාට හෝ ලේකම්තුමාට හෝ නිලධාරියෙකුට තියෙනවාද කියන එකතමයි.ඒ සම්බන්ධව දැන ගන්න තමයි ප්‍රශ්න කළේ.මාලින්ද මනත්‍රිතුමා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,චන්ද්‍රදාස මන්ත්‍රීතුමාගේ කතාවේ දරුවාගේ අධ්‍යාපනයේදී දෙන මුදලට මේක අදාළ කරණයක් නෙමේ.ඒයා ගමනක් යන්න අපි හදලා දෙන්න එපැයි.එතුමා ගත්ත තීරණය ඉතාම වැදගත් තීරණයක්.ඔබතුමා සභාවේ මුදල් තියෙනව නම් 1000.00 වුණත් කමක් නෑ.නමුත් මෙන්න මෙහෙම එකකුත් තියෙනවා.ඒ නිසා ඒක කල්පනාකාරීව කරන්න කියන එක තමා.මේක 1000.00 හරි 2000.00 ක් හරි අපිට දෙන්ඩ තියෙනව නම් සභාවේ මුදල් වලින්.ඒක කිසි ප්‍රශ්නයක් නෑ.නැත්නම් වැරදියට තේරුම් යයි.මොකද මේ සභාවේ මේ කියන්නේ 1000.00 ක් නෙමෙයි 1500.00 ක් හරි කමක් නෑ.දවස ගානේ එන්නෙ නැති වෙයි.ඒ නිසා ගැටලුවක්කර ගන්න එපා.ඒ ගෙවීම් කරන්න. ගරු ලේකම්තුමා මුදල් වියදම් ,ඔය අනිත් ඒවා වගේ නීති රීති අණපණත් වලට යටත්ව ගෙවීම් කරන්ඩ කියන යෝජනාව මම කරනවා.ඒක ප්‍රශ්නයක් නෑ.සභාපතිතුමා ඒකයි පැහැදිලි කිරීමක් කළේ.අපේ නීති රීති අණපණත් වලට ගැටලුවක් නැතුව අපිව නීතිමය ගැටලුවකට පත් නොවන ආකාරයට කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

**සභාපතිතුමා:-**
මේක මාස දෙකක්

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
හරි ඒක තමයි.දැන් හැම දාම එන එකකුත් නෑ.සමහරවිට එහෙම වෙයි.මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ ඒ අදහස.නැත්නම් ඕක වැරදි වැටහීමක් යයි.

**සභාපතිතුමා:-**
අපි ඒක රුපියල් 1000.00 ක්ද රු.500.00 ක්ද?

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්නමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම නම් 1000.00 ක් දෙන එකට එකඟයි.මම නම් රුපියල් 1000.00 ක් දෙන්ඩ එකඟයි.මොකද මේ දවසට රු.1000.00 ක් කියන එක සාමාන්‍ය මුදලක්.කුලී රස්සාවක් කළත් රු.2500.00 ක් රු.3000.00 ක් විතර ගන්නවා.ඉතින් මේ ළමයෙක් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් මහන්සි වෙන ළමයෙක්.කවුද කියන්න දන්නේ නෑ,නම විතරයි දන්නේ.එතකොට මාසෙම එන්නෙත් නෑ.වැඩ කරන දවස් 25 උපරිම රස්සාව තියෙන්නේ.මාසෙට.උපරිම ආවොත් තමා රු.25000.00 ක් වෙන්නේ.ඒකත් දෛනිකව ආවොත් තමා.අධ්‍යාපන කටයුත්තක් සම්බන්ධව,තමයි.මං දන් නෑ ඔබතුමාට මොනව හරි සම්බන්ධයෙන් තියෙනවද කියලා.කිසිම දෙයක් අපි දන්නේ නෑ.අපි පෞද්ගලිකව එකගයි.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,නෑ නෑ මේකයි.ඇත්ත මේකයි අර බෝපැත්ත මන්ත්‍රීතුමා කිවුවේ.සාමාන්‍යයන් වෙනත් ආයතනයකට යනකොට සභාපතිතුමා ගෙවන්නේ රු.9500.00 වගේ කියලා.එයාල දන්න එකක් තමා කිවුවේ.එතකොට අපේ සභාවේ අරමුදල් අනුව ,අර එතුමා කිවුවේ හොඳ චේතනාවෙන් තමයි කිව්වේ.එතකොට කට්ටිය කතා කරලා තීරණයක් එන එක හොඳයි.නමුත් මං හිතන්නේ රු.500.00 ක් කියන එක හොඳයි කියලා.දැන් එයා එන්නේ පුහුණුවකටනේ නේද එන්නේ?පුහුණුවක් ගන්නේ.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්නමැතිතුමා:-**
මාගේ පුහුණුව ඉවර වෙලා,මගේ පලවෙනි ට්‍රේනින් එකට ගියා.රු.100.00 යි පඩිය මාස හයටම.ඒවා නෙමේ කතාව.

**සභාපතිතුමා:-**
අපි රු.500.00 ක් ඒකමතිකව තීරණය කරමුද?(ඝෝෂාව)ඒක විවාද කරන්න ඕන් නෑ.අපි මේක ඉස්සරහට ගෙනියනියන්න ඕන හින්ද?.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සුජීව මන්ත්‍රීතුමා එතනදී මතු කලේ පුහුණුවෙන් පස්සේ දෙන සහතිකය පිලිබඳ අත්සන තබන්නේ,මොන නිලධාරියෙක්(ඝෝෂාව)

**සභාපතිතුමා:-**
ඒක පුළුවන් සභාපතිවරයාට

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ආ එහෙනම් කිසි කතාවක් නෑ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි රු.500.00 නම් තිරණය කරන්නේ,අපේ කසල කළමණාකරණ සේවකයෝ ඉන්නවනේ,ඒ සේවකයන්ට දෛනිකව ඔවුන්ලේ වැටුප මං හිතන්නේ රු.1350.00 ක් වගේ.(ඝෝෂාව)අන්න ඒ වගේ දෛනික වැටුප් ගන්න අය ඉන්නවනේ ප්‍රාදේශිය සභාවේ. එයාලගෙ වැටුපත් එක්ක ගලපලා ඒ අදාළ රු.500.00 වගේ එක ලබා දෙන එක උචිතයැයි මං විශ්වාස කරනවා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චිමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මමත් පොඩි කාරණාවක් කියන්නම්.මටත් මතකයි 96-97 කාලයේ එතකොට හිටියේ සුනිල් අමරකෝන් කියන මන්ත්‍රීතුමා තමා.එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළේ.ඒ වෙලාවේ අපේ ඥතිවෙන අක්කා කෙනෙක්,එතකොට කොම්පියුටර් එහෙම නෑ.ටයිපින් වලට තමා පුහුණු කලේ.එමන්ත්‍රීතුමා එයා කෝස් එකක් කළා ටයිපින්. දැනටත් ඒ රස්සාව කරනවා එයා තාම. ඒ අවස්ථාවේ මම ඉල්ලීමක් කළා මම

ප්‍රාදේශිය සභාවේ පොඩි පුහුණුවක් ගන්න, අවස්ථාව ලබා දෙන්න කියලා.මං ඇවිත් මං මන්ත්‍රීතුමාට ප්‍රකාශ කළාම බොහොම සත්භාවයෙන් එතුමා මාවත් එක්කගෙන ඇවිත් කතා කරලා ඉවර වෙලා එවකට හිටපු සභාපතිතුමා,දැන් නම් නම මතක නෑ.කතා කරලා ඒ අවස්ථාව ලබා දුන්නා.එතනදී හැබැයි ගෙවීමක් සිදු කලේ නෑ.ඒකට එකඟතාව අනුව පුහුණුව ලබා දුන්නා.ශතපහක්වත් ගෙවීමක් කළේ නෑ. මම කියන්නේ ඒ නිසා මේකෙදී අර අපි පුහුණුව ලබා දෙමු. සභාවෙ මුදල් තියෙන විදිහට බලලා ගෙවීමක් කරන්න පුළුවන් නම් සාමාන්‍යමුදලක් ලබා දුන්නට අකමැත්තකුත් නෑ හැබැයි.මම අර ප්‍රකාශයක් කළේ.ඒ කාලෙත් වෙලා ශත පහක්වත් ගෙවීමක් කළේනෑ.ඒ පොරොන්දුව පිට තමා, අපිත් කිවුවා ශතපහක්වත් අපට ශතපහක්වත් එපා ,අපට පුහුණුව ලබා දෙන්න කියලා.එතකොට ඒ කෙනා පුහුණුව ලබා ගන්න එනව නම් ,ඒ කෙනා වෙන්න ඕන,ප්‍රධාන කාරණය.ප්‍රධානම දේ.අවස්ථාව දෙන්න ඕන.අපි මේක මුදල ලබා දෙන එකට වඩා ,අවස්ථාව ලබා දෙන එක තමා හොඳම දේ.ගෙවීමක් කරන්න පුළුවන් නම් මුදලක් තීන්දු කරලා ගෙවීමක් කරමු.මං ඉතිහාසය ගැන කිවුවේ.සභාවේ කරපු දෙයක් ගැන.

**සභාපතිතුමා:-**
ඇත්තටම මුදලක් බලාපොරොත්තුවෙන නෙමේ මේ ඉල්ලීම කරලා තියෙන්නේ,මට මේ පුහුණුව ලබා දෙන්න කියලා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,1997 යි අදයි ගත්තාහම ලොකු වෙනසක් තියෙනවනේ ඇත්තටම.ඒ දරුවා පනාවල පාරේ ධර්මපාල ඉස්කෝලෙ ඉස්සරහ වගේ.අපේ සීමාවේ.පයින් එන්නත් පුළුවන්.හැබැයි අපි යම් මුදලක් දෙමු.(ඝෝෂාව) 500.00 ක් කියන්නේ 500.00 ත්‍රීවිල් එකකින් එන්නත් බැරි තත්ත්වයක්නේ තියෙන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ ළමයට මාස දෙකක පුහුණුවක් තමා ඉල්ලන්නේ.ඒ සඳහා ඉදිරිකාලය ගැනත් සලකලා බලලා අපි රු.500.00 ක් වගේ දෙමු කියලා යෝජනා කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දැන් ඒ දරුවගේ ඉල්ලීම ඇත්තටම හොඳයි.ඇත්තටම තව දරුවෝ දෙන්නෙක් තුන් දෙනෙක් පුහුණුව ඉල්ලුවොත් අර දරුවට දුන්නා හා සමානව අපිට දෙන්න වෙනවා.එක්කෙනෙක් වෙන්න පුළුවන් තුන හතරක් පහ හයක් වගේ අපට බැහැයි කියන්න බැරි තරමට සමහරවිට පත් වේවි.මං හිතන්නේ අපේ සෙනරත් මන්ත්‍රීතුමා කිවුව වගේ ඒ දරුවගේ ගම අහල පහල නම් සභාවට පයින් එන දුරකනම්,එහෙම නැත්නම් පොඩි මුදලකින් එන දුරක් නම්,එම ළමයට හැකි උපරිම පුහුණුව අපි ලබා දිලා සභාවෙන් යම් මුදලක් පරිත්‍යාග කරන්න පුළුවන් නම් දුන්නට කමක් නෑ මොකද අද ගමන් වියදම කියන එකත් හරි අමාරුයි.පුළුවන්නම් මං කියන්නේ.ඉදිරියට ළමයෙක් හෝ දෙන්නෙක් හතර පස් දෙනෙක් ආවොත් එහෙම අපිට එන හැමොටම ඒ දේ කරන්න සිද්ධ වෙයි කියලා මතක් කරනවා.

**.සභාපතිතුමා:-**
මේක ට්‍රේනින් පිරියඩ් එකක්.මම අද උදේ දුව ඇරලවල ආවේ මේ වගේ ට්‍රේනින් එකකට.ඇත්තටම ගෙවනවා.ඒක අපිට සේවයක් වෙන්නේ.බැංකු වලත් ගන්නවා.පොඩි ගෙවීමක් කරනවා.ඒක හින්ද අපිට වැඩක් එක්ක තමයි යන්නේ.එයා අපිට උදවු කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඔබතුමාගේ අදහස හොඳයි.මම වැඩ කරන ආයතනය පෙට්‍රෝලියම් එක.එකටත් විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ එක අවුරුද්දකට එනවා 15,20,25 ,30.අපෙ ආයතනය එන හැම කෙනාටම රු.500.00 ගානේ ගෙවනවා.අපේ ආයතනයේ ආර්ථිකය හොඳ නිසා ප්‍රශ්නයක් නෑ.මෙතන දි දරුවට දෙන්න එපා කියන එක නෙමේ කියන්නේ.තව තුන් හතර දෙනෙක් ආවොත්

**සභාපතිතුමා:-**
එහෙම උනොත් සීමා කරනවනේ

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
එහෙම සීමාවක් කරනව නම් ප්‍රශ්නයක් නෑ.

ඒ අනුව සභාපතිතුමාගේ 6.64 සබරගමුව විශ්ව විද්‍යාලයේව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හදාරමින් සිටින අංක සී 65,පනාවල පාර,ඇහැලියගොඩ ස්ථිර ලිපිනයෙහි පදිංචි එම්.ආර්.එෆ්.සාරා මෙයගේ ඉල්ලීම පරිදි,අවම මාස 2ක කාලයක් සඳහා දිනකට රු.1000.00 ක දීමනාවක් ගෙවීමේ පදනම මත ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ප්‍රායෝගික පුහුණුව ලබා දීම සුදුසු බවට වූ යෝජනාවට උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා විසින් රුපියල් 500.00 ක දීමනාවක් ගෙවීමට යෝජනා කළ අතර,සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා ස්ථිර කිරිමෙන් පසු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ළඟට 6.52. යෝජනාව

**6.65.ස්ථිර සේවක වැටුප් ගෙවා අවසන් වූ පසු සභා අනුමැතිය සඳහා ඉදිරිපත් ඉදිරිපත් කිරීමට මම යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,6.65 යෝජනාව ගැන සාකච්ඡා කරන්න මම මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙතැන් සිට කාරක සභාව මහා සභාවක් බවට මම යෝජනා කරමි

**සභිකසුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි ස්ථිර සේවක වැටුප් මධ්‍යම ආණ්ඩුවෙන් ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපූර්ණය වෙනකම් මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුවස්ථිර සේවක වැටුප් ගෙවා අවසන් වූ පසු සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනාවට,උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා විසින් ස්ථිර සේවක වැටුප් ගෙවීම සුදුසු බවට යෝජනා කළ අතර සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා ස්ථිර කිරිමෙන් පසු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ළඟට හදිසි යෝජනා කිහිපයක් තියෙනවා.හදිසි යෝජනා- 01

**සභාපතිතුමා:-**

**හදිසි යෝජනා- 01**

**ඇහැලියගොඩ නගරයේ රාත්‍රි ධාවනය ට්‍රැක්ටර් රථය සඳහා තත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරුවෙකු දෙදෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුවඇහැලියගොඩ නගරයේ රාත්‍රී ධාවනය වන ට්‍රැක්ටර් රථය සඳහා තත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරුවකු බඳවා ගැනීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

**හදිසි යෝජනා- 02**

**ඇහැලියගොඩ නගරයේ රාත්‍රි ධාවනය වන කසල එකතු කිරිමේ ට්‍රැක්ටර් රථය සඳහා තත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුවඇහැලියගොඩ නගරයේ රාත්‍රී ධාවනය වන කසල එකතු කිරීමේ ට්‍රැක්ටර් රථය සඳහා තත්කාර්ය පදනම මත සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු බඳවා ගැනීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

**හදිසි යෝජනා- 03**

**පනාවල මාර්ගයේ සිට අස්ගගුල දෙසට දිවෙන කලව්ටිගොඩ මාර්ගයේ කොන්ක්‍රිට් කොටසක් ගැලවී ඇති අතර ඇළ මාර්ගයට වැටිමට පෙර ප්‍රතිසංස්කරණය කිරිමට මම යෝජනා කරමි.**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඕක මං පැහැදිලි කිරීමක් එදා කළා.ඒක දැන් කරලා තියෙන්නේ.

**සභාපතිතුමා:-**
මේ මාර්ගය කඩා වැටුණොත් එහෙම ඒ යන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විකල්ප මාර්ග ඔස්සේ යන්න වෙන්නේ.ඒ හින්ද අපි ඒක හදිසි යෝජනාවක් විදිහට ගත්තා.

ඒ අනුවපනාවල මාර්ගයේ සිට අස්ගගුල දෙසට දිවෙන කලවිටිගොඩ මාර්ගයේ කොන්ක්‍රීට් කොටසක් ගැලවී ඇති අතර ඇළ මාර්ගයට වැටීමට පෙර ප්‍රතිසංස්කරණය කිරීම, යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
**හදිසි යෝජනා- 04**
**අගුරුවාමුල්ල පහළ කොටස මාර්ගය කොන්ක්‍රිට් කර පිලිසකර කර ගැනිම සම්බන්දවයි.පවුල් 18 ක් පමණ ජීවත් වන අගුරුවාමුල්ල පහළ කොටස මාර්ගයනිතර නිතර ජල ගැලීම්වලට ලක්වන මාර්ගයකි.මෙම මාර්ගය මීටර් 400 ක් පමන දුරට කිසිම සංවර්ධන වැඩසටහනක් වි නොමැති බැවින් ගංවතුරට සේදී ඇති අතර ගම්වාසීන් සියලු දෙනා එදිනෙදා කටයුතු වලදී මහත් අපහසුතාවකට ලක්වන බවත් වාර්තා වේ.මාර්ගය දෙපස පැතිබැම් රජයේ මුදලින් කොටසක් කර ඉදී ඇති අතර ඉතිරි කොටස අඩි 130 ක් පමණ ගම්වාසී සියලු දෙනාගේ දායකත්වයෙන් මේ දිනවල පැති බැම් සකස් කරමින් ඇත.මේ කරුනු සැලකිල්ලට ගෙන මෙම මාර්ගය ඉතා ඉක්මනින් සකස් කර දෙන මෙන් ගම් වාසීන් විසින් ඉල්ලීම් කර ඇත.ඒ නිසා අගුරුවාමුල්ල පහළ කොටස මාර්ගය කොන්ක්‍රිට් කර පිලිසකර කර ගැනිම සඳහා යෝජනා කරමි.**

**සභිකසුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුවඅගුරුවාමුල්ල පහල කොටස මාර්ගය කොන්ක්‍රිට් කර පිලිසකර කිරීම යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
හදිසි යෝජනා මේ වනවිට අවසන් වෙනවා.

**සභාපතිතුමා:-**
**07.ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.**

**07.01.** විමධ්‍යගත අයවැය වැඩසටහන 2025 යටතේ ප්‍රතිලාභ වෙන් කර ඇති බුළුගහපිටිය වසමේ ගඩිගුඩු ඇලේ සිට ගිණිහිරිය වෙල් යාය හරහා ඔතු කුඹුර දක්වා දිවෙන ඇළ මාර්ගය පළල් කිරීම හා සුද්ද කිරීම.ඒ සදහා ප්‍රාදේශිය සභා මුදල් රු.1369144.72 ක්ද යොදවා කර්මාන්තය ඉටු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ ආසනයට මේ පාර ලක්ෂ80 වෙන් වුණේ.ඒකෙ එක යෝජනාවක් තමා මේක.සම්බන්ධීකරණ කමිටුවේදී කතා වුණා.ඉතින් මේ යෝජනාවෙන් අපි කරන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඇල කපලා දෙනවා.ඒ ගොල්ලන්ගේ ප්‍රතිපාදන වලින්.අපේ ප්‍රතිපාදන වලිනි තමයි,එතන අර ඉඩම් දෙකක් තියෙන තැනක්.එතන බෝක්කු ටිකක් දාල හරි ගස්සලා දෙන්නේ.ඉතින් මේ ව්‍යාපෘතිය සම්පූර්ණ වෙන්නේ මේ වැඩේ කළොත්.මේක දැන් පටන් අරන් තියෙන්නේ.මේ කර්මාන්තය ප්‍රාදේශිය සභා අරමුදලින් කිරිමට යෝජනා කරනවා.

**සභිකසුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025.07.02 සම්බන්ධිකරණ කමිටුවේ ගරු සභාපතිතුමා සංස්කෘතික ඇමතිතුමා එදා බොහොම උනන්දුවෙන් ඒ ගැන කතා කළා.ඔබතුමාට උපදෙස් දුන්නා,ඒ සම්බන්ධව කටයුතු කරන්න කියලා.අපි ඒකට විරෝධතාවක් නෑ.බුළුගහපිටිය වසම හෝ වේවා වසම් 44 ඕනෑම වසමක යම් සංවර්ධන කටයුත්තක් වෙනකොට අපි ඒනට ආශිර්වාද කරන්න ඕන.මං දන්නවා ගිය සතියේ ඒ කටයුත්ත ආරම්භ කළා.අපේ උපසභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මුදලින් වැඩ ටික කරන් ඉස්සරහට යනකොටමේ මුදල නොගෙවුවොත් ඒ කටයුත්ත අංග සම්පූර්ණ වෙන්නේ නෑ.ඔබතුමාට එදත් මතක ඇති ගරු සංවර්ධන කමිටු සභාපතිට මම ප්‍රකාශ කළේ.මෙතන ගෙවල් දෙකක් තියෙනවා ඒ ගෙවල් දෙක පෞද්ගලික ගෙවල් හිමියෝ එහි දේශපාලන භේදය කිවුවොත් ඔබතුමාට අදාළත් නෑ මට අදාලත් නෑ.වෙනම කතාවක්.ඇත්ත කතාව කියන්නේ.වෙනම දේශපාලන ප්‍රතිපත්තියක් අනුගමනය කරන මිනිස්සු.හැබැයි මේ කටයුත්ත අපි කරන්න ඕනේ මේ ගෙවල් දෙකටම කිසිම හානියක් නොවන විදිහට ගරු සභාපතිතුමනි.විය යුතු වැඩක්.ඒක මං පිළිගන්නවා.ගැටලුවක් නෑ.හැබැයි අපි මේ ව්‍යාපෘතිය ඉවර වෙනකොට ඒ ගෙවල් දෙකේ මිනිස්සු

,පොඩි ගෙවල් දෙකක් තියෙන්නේ.ඇත්තටම හරිම අහිංසකයි.දේශපාලන වශයෙන් මටත් සම්බන්ධයක් නෑ,ඔබතුමාටත් සම්බන්ධයක් නෑ.හැබැයි අවංක කතාව මේ කියන්නේ.හැබැයි ඒ මිනිසුන්ට හානියක් නොවන විදිහට වැඩපිළිවෙලක් හදන්න.එහෙම නොවුණොත් ඒ මිනිස්සු පවු.අපි කොච්චර සංවර්ධන ක්‍රියාත්මක කරලා යම් යම් යහපතක් වුණාට, ඒ අහිංසක මිනිසුන්ට කර ගන්න දෙයක් නැති මට්ටමක් තියෙන්නේ.ඒ බුළුගහපිටිය වසමේ ගෙවල් දෙක.ඒනිසා මම ඒකට අවධානය යොමු කරලා මේ කටයුත්ත නිමා කරලා දෙන්න කියලා මං ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.බොහොම ස්තුතියි.

ඒ අනුව**07.01.** විමධ්‍යගත අයවැය වැඩසටහන 2025 යටතේ ප්‍රතිලාභ වෙන් කර ඇති බුළුගහපිටිය වසමේ ගඩිගුඩු ඇලේ සිට ගිණිහිරිය වෙල් යාය හරහා ඔතු කුඹුර දක්වා දිවෙන ඇළ මාර්ගය පළල් කිරීම හා සුද්ද කිරීම.ඒ සඳහා ප්‍රාදේශිය සභා මුදල් රු.1369144.72 ක්ද යොදවා කර්මාන්තය ඉටු කිරීම සුදුසු බවට වූ යෝජනාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මීලගට කාරක සභා වාර්තා

**සභාපතිතුමා:-**

**08.**කාරක සභා වාර්තාව

**08.01.**2025.07.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව

**08.02**. 2025.07.15 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්ථාව

**08.03.**2025.07.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්ථාව

**08.04.**2025.07.24 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

**08.05**. 2025.07.16 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව

**08.06**. පරිසර හා සේවා පහසුකම් කමිටුව-නොපැවැත්විණි

**සභාපතිතුමා:-**
මේ කාරක සභා වාර්තාවල අඩුපාඩු තිබබනවා නම් පෙන්වා දෙන්න.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,2025.07.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවත්,2025.07.15 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවත් හා 2025.07.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවත් යන වාර්තා මං අනුමත කරමි.

ඒ අනුව2025.07.07 ,2025.07.15 හා 2025.07.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහමැතිතුමා:-**
2025.07.24 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවහා2025.07.16 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාවයන වාර්තා මං අනුමත කරමි.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ප්‍රජා සංවර්ධන කමිටුවේ ගැටලුවක් තියෙනවා.යෝජනාව තියෙන්නේ දෙවැනි පිටුවේ.ජී.කේ.නිමල් මයා සම්බන්ධ කාරණයේදී සභාව විසින් යම් කිසි තීන්දුවක් ගන්න වෙනවා.ඉහත නම් සඳහන් අයගේ පැමිණිල්ල සම්බන්ධව ස්ථාන පරීක්ෂාවක් සිදු කළ අතර දෙදෙනා සමඟ සුහදව කතා කළ බවත් එහිදී වැසි ජලය පාරේ රදා පැවැත්ම හා එම ජලය නිවෙස්වලට ගලාගෙන යාම පිළිබඳව අවධානය යොමු කරන ලදී.මීට පෙර පළාත් සභා ඉන්ජිනේරු මහතා පැමිණ ස්ථානීය පරීක්ෂණයෙන් පසුව කොන්ක්‍රීට් සිලින්ඩර් යොදා ජලය බැස යාම සඳහා කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.කරුණු පැහැදිලි කිරීමෙන් පසු එයට ඔවුන් එකඟ වූ බව ප්‍රකාශ කළ නිසා සභාව මැහැදිහත් වී එම ගැටලුවට විසඳුම් ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරණ ලදී.ඒ අනුව අපි සභාව විසින් තීන්දුවක් ලබා දෙන්න ඕන.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි නිවාස කමිටුවේ මමයි සෙනරත් මන්ත්‍රිතුමයි,ආරියදාස මන්ත්‍රිතුමයි ස්ථානිය පරික්ෂණය සඳහා සහභාගී වුණා.අපි ගිහිල්ලා ඒක දෙපාර්ශවයටම ගැටලුවක් නොවන ආකාරයට තේරුම් කරලා දුන්නා. නමුත් නිමල් කියන පාර්ශවයෙන් ලොකු ඉල්ලීමක් කරනවා නසීර් පාර්ශවයට එයාගේ වත්තෙන් කාණුවක් දාලා පාරෙන් වතුර බස්සන කියන එක.අපි මේක,කවුරුවත් කැමති නැනේ තමන්ගේ වත්තෙන් කාණුවක් දාලා වතුර බස්සන්න කවුරුවත් සූදානම් නෑ.එතන කොච්චර පැහැදිලි කරත් එයා ඒ මතවාදෙම ඉන්නවා.අපි තේරුම් කරා හැබැයි.අර ඒ ගොල්ලෝ කියනවා කාණුවක් තියෙනවා,ඒකෙන් බස්සන්න පුළුවන් ,ඒක හානියක් නෑ කියලා.නමුත් දැන් ඒතන කාණුවකින් වතුර බස්සන්න හදන්නේ මේ ගමට ඉස්සෙල්ලා ගොඩ වෙච්ච පාරකින්.රොස්ලින් වත්තේ කෙටි මාර්ගයක්.ඒක තමා තිබ්බ්ච පාර.ඒ පාර තමයි කාණුවක් බවට මේ ගොල්ලෝ පරිවර්ථනය කරන්න හදන්නේ.එතකොට අපි ඒකත් දැක්කා.නමුත් කාණුවක් වත්තෙන් දාන්න ඕනත් නෑ.අපි අදහසක් ගෙනාවා දාල තියෙන කොන්ක්‍රීට් එක අඩි භාගයක් කපලා ඒ අදාල තැනින් අපට පුලුවන් කාණුවක් හදලා දෙන්න.නමුත් ඒ කට නිමල් පාර්ශවය කැමති නෑ.නසීර් පාර්ශවයේ තාප්පෙ ගාවින් අඩි බාගයයි කපන්න ඕනේ.නමුත් නිමල් පාර්ශවය කැමති නෑ.ඒ අය කියන්නේ වත්තෙන්ම කාණුව කපන්න

කියලා.අමානුෂික ඉල්ලීමක් එයාල කරන්නනේ.ඔබතුමත් ගියා කියලා කිව්වා.මොකුත් කරන්න ඕන් නෑ.මෙහා පැත්තෙන් කාණුවක් දාලා එතනින් බස්සන්නත් පුළුවන්.සභාවට දාල මොකක් හරි තීරණයක් ගමු කියලා අපි ඒ වෙලා ආවේ කතා කළා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ගන්න පුළුවන් ඕන තරම් ක්‍රියාමාර්ග තියෙනවා.නමුත් අර නිමල් කියන පාර්ශවයෙන් මේකට එකග වෙන්නේ නැති එතත් තියෙන්නේ.සුළු දෙයක් තියෙන්නේ.

**සභාපතිතුමා:-**
මං හිතන්නේ එතන පෞද්ගලික කාරණාවක් තියෙන්නේ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ ප්‍රශ්නෙට ලේසි උත්තරයක් තියෙන්නේ.අපි එතන වෙන වෙනමත් කිව්වා.ඒ කිව්වත් මුස්ලිම් පාර්ශවයෙන්,මං කොහොම හරි කර ගන්නම් මතවාදයක් එක්ක වගේ ,වත්තෙන් කාණුවක් ඉල්ලලා පාරෙන් බස්සන්න කියලා ඉල්ලීමක් කරන්නේ.ඔබතුමාගේ තීරණය තමයි එතන තියෙන්න ඕන.මොකද කරන්න ඕන කියලා.

**සභාපතිතුමා:-**
අපිත් ගිහින් බැලුවා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මමයි සුමිත් මන්ත්‍රීතුමයි ආරියදාස මන්ත්‍රීතුමයි අපි ගිහිල්ලා පැ එකහමාරක් වගේ හිටියා මේ ප්‍රශ්නය මෙව්වා කරලා එන්න කියලා.නමුත් මොන හේතුවක් නිසාවත් මං හිතන්නේ අපටත් පෙර සභාවේ මං හිතන්නේ කීපවතාවක්ම එතනට ගිහිල්ල තියෙනවා.සභාපතිතුමත් ගියා කියලා කිව්වා.අපි හොඳටම කරුණු පැහැදිලි කරලා දුන්න ඒක විසඳන්න පුළුවන් ආකාරය.නමුත් නිමල් කියන පාර්ශවයෙන් ඒකට එකඟ වෙන් නැති එක .තවත් එතන පුද්ගලයෙක් ඉන්නවා.එයාගේ නම අහගන්න බැරි වුණා.ඒ දෙදෙනම එකතු වෙලා තමයි අමානුෂික විදිහට තමයි ,ඒ ගොල්ලෝ කියනවා වතුර බස්සන්න කියන තැන ඒ කාණුවක් නෙමේ.පාරක්.ඒක තමයි ඉස්සෙල්ලා ප්‍රයෝජනයට අරන් තියෙන්නේ.ඒක මං හිතන්නේ ලේසියෙන් විසඳගන්න පුලුවන් ප්‍රශ්නයක් නෙමෙයි.අපි යෝජනාවක් විදිහට ඒ ගොල්ලන්ට ගෙනාවේ නසීර් කියන පුද්ගලයාගේ (වචන පැහැදිලි නැ)කොන්ක්‍රිට් පාලමක් ඇවිත් එතනින් තියෙනවා වතුර බස්සන්න තැනක්.ඒ එතනින් වතුර බස්සන්න කියලා තමයි අපි ඒ ගොල්ලන්ට යෝජනා කළේ.ඒක තමයි සුදුසු.

**සභාපතිතුමා:-**
නසිර් මහතාගේ තාප්පය අසලින් ද? පාරෙන් ද?

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
එළියෙන්.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ඒකට තිරණයක් දෙන්න.කොන්ක්‍රිට් එක අපි භාගයක් වගේ කපලා එතනින් කාණුවක් දාන්නද?

**සභාපතිතුමා:-**
සභාව යෝජනා කරමු එහෙම.මම යෝජනා කරන්නම් එහෙනම්.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම කමිටුවේ තීරනයක් විදිහට යෝජනාවක් විදිහට මම සභාවට ඉදිරිපත් කරනවා ඒ අපි කියන විදිහට ඒ බැම්ම අයිනෙන් තාප්පෙ අයිනෙන් කොන්ක්‍රිට් කාණුවක් යොදා මැදින් තියෙනවා වතුර බස්සන්න තැනක් ඒකෙන් පිටට වතුර ගලා ගෙන යාම සඳහා සුදුසුයි කියලා මම යෝජනාවක් විදිහට යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුව2025.07.24 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවසභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ළඟට ආදායම් වියදම් පිළිබඳ වාර්තා

**සභාපතිතුමා:-**
**09. ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා,වෙනත් වාර්තා**
**09.01. 2025 ජූලි මස ආදායම් වියදම් වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,2025 ජූලි මස ආදායම් වියදම් වාර්තාව මං ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
**09.02. 2025 ජූලි මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025 ජූලි මසවාර්තාව මං ස්ථිර කරනවා.

ඒ අනුව 2025 ජුලි මස ආදායම් වියදම් වාර්තාව හා 2025 ජුලි මස හිඟ ආදායම් වාර්තාවසභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
මී ළඟට ගෙවා අවසන් බිල්පත්
**සභාපතිතුමා:-**
**10.ගෙවා අවසන් බිල්පත්**

**10.01. 2025 ජුලි මස ගෙවීම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025 ජුලි මස ගෙවීම් වාර්තාව මං ස්ථිර කරනවා.

ඒ අනුව 2025 ජුලි මස ගෙවීම් වාර්තාව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**11.වෙනත් කාරණා**

**11.01**. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.

**සභාපතිතුමා:-**

මං මෙතනදී ගරු සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ විශේෂයෙන්ම අද අපිට මේ සභාවේ අපේ ලේකම්තුමා ඉන්න අවසාන සභාව.මොකද ඒතුමාට ස්ථාන මාරුවීම් ලැබිලා තියෙනවා.ඉතින් ඇත්තටම අවුරුදු ගාණක් මං කියන්නේ මට අපේ මෙම සභාව නියෝජනය කරපු සුජීවමන්ත්‍රීතුමා, දිලීන් මන්ත්‍රීතුමා ඇතුළු අපේ උපසභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය දන්නවා ඇති.ඉතාමත්ම අවංකව සේවය කරපු ලේකම්තුමෙක්.ඉතින් අපිට දරා ගන්න බැරි පාළුවක්.නමුත් අපට ඉහළ ඒවට අතපොවන්න අපට පුළුවන් කමක් නෑ.ඉතින් අපි උපරිම ඒතුමාව තියා ගන්ඩ උත්සහ කළා. අපිට ඒක කරන්න පුළුවන්කමක් වුණ් නෑ.ඉතින් අපි මේ අවස්ථාවේදී මම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට අපේ සියලුම මන්ත්‍රීවරුන්ගේ සියලු දෙනා වෙනුවෙන්ම මං ඔබතුමා අපිට කරන ලද සේවයට අපි අපගේ හාර්දයාන්ගම ස්තූතිය පුද කරනවා.ඉතින් අපිට ඔනෑම අවස්ථාවක රජය් සේවකයෙක් කියන්නේ, නැවත වතාවක් අපි වැඩි කාලයක් අපි වැඩි කාලයක් නොගිහින් අපට පුළුවන් නම් අපිට සේවය ලබා දෙන්න ඒන්න පුළුවන් නම් අපිට නරුවත ඒන්නප්‍රකාශ කරනවා.ඉතින් බොහොමත්ම ස්තූතියි.මේ කාලයෙත් ඉතාමත්ම සුහදව කිසිම ගැටලුවකට පාත්‍ර නොවී අපි ඒක්ක කටයුතු කිරිම සම්බන්ධව මගේ අපේ හිතවත් සහොදර සහෝදරියන් කියන්නත් පුළුවන්.වර්තාකරුවන් සියලුම දෙනා වෙනුවෙන් මං මේ අවස්ථාවේදී ස්තූතිවන්ත වෙනවා.මං හිතන්නේ දැන් කාටත් කරුණු පැහැදිලි කරන්න පුළුවන්.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි ඒතුමාටත් යම්කිසි ප්‍රකාශයක් කරන්න ඇති.අපි මහා සභාව කාරක සභාවක් බවට පත් කරල ඒතුමට අදහස් ප්‍රකාශ කරන්න තියෙනව නම් ඒ අදහස් ප්‍රකාශ කරන්න.

**සභාපතිතුමා:-**
ඔව් ඒක හොඳයි.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම මෙතැන්සිට මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කරමි
.
**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒම යොජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම මෙතැන්සිට කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කරමි.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒම යොජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ වෙලාවේ ලේකම්තුමා වචනයක් කතා කළොත් හොඳයි කියලා.මං හිතන්නේ විටින් විට විට පෙර සභාවට ආවත් යම්යම් කාරණාවලට ලේකම්තුමා හමුවීමට නමුත් අපි මෙතුමා ගැන ඒච්චර දෙයක් දැනුවත් නෑ. දැක්කෙත් නෑ.සභාවට ඇවිල්ලමුල් දවසෙම සහ මුල් දින තුනේම මංහිතනනේ ලේකම්තුමා කියන චරිතය ඒක හරි විද්වත් කමක් ඇති වුණා.විශේෂයෙන්ම ඔබතුමා සභාපති විදිහට පලවෙනි කතාවෙන්ම මම හැමොටමත් කිවුවා මං හිතන්නේ මං ඔබතුමාට ප්‍රකාශයක් කළා,ඔබතුමා අපි දේශපාලනය කොච්චර කළත්

අපි ලොකු සම්බන්ධතාවයක් තිබුණේ නෑ.ඒ ඒතුමා ගේ තියෙන දැක්ම හා සමාන ඔබතුමාට මම විග්‍රහ කළ පරිදි මෙතුමත් මේ කාල පරාසය තුළ අපිට නොදන්නා දෙයක් කියලා දෙන්නද හරි ලෙන්ගතුව කටයුතු කළා.මං හිතන්නේ ඔබතුමා ඒකට සාකච්චා කරලා ඔබතුමත් දරන්න ඕන උපරිම උත්සහය දරලා මාත් ඒක්ක කතා කරලා තියෙනවා.ඔබතුමා තියා ගන්න දැරුව උත්සහය මට කිවුවා.නිලධාරීන්ව දැනුවත් කළා.ඉතින් ඇත්තටම ලේකම්තුමා ඔබතුමාගේ අත්දැකිම් හා පරිනතභාවය අපි සභාවට අපි මොකද අපි අලුත් මන්ත්‍රිවරු උපසභාපතිතුමත් සභාපතිතුමත් අපි අලුතින් පත්වෙලා තියෙන්නේ.ඉතින් ඔබතුමාගේ අත්දැකිම් අපේ සභාවට හරි ලොකු ශක්තියක් හරි ලොකු හයියක් හරි ලොකු බලයක්.මාරුව අවලංගු කරලා ඊට පස්සේ ඒතුමාට ඇත්තටම ඒතුමාට තව විශ්‍රාම යන්න ලොකු කාලයක් නෑ. මං කියන්නේ ඒ දේ පවා සාකච්චා කරලා ඒ කියන්නේ සාකච්චා කරන්න පොයින්ට ඒකක් ගත්තොත් නමුත් අපිටත් යම්කීසි තැනක අපිටත් තැනකින් ඒහාට යා ගන්න බැරි අවස්ථා ඒනවා.ඒතකොට ඒ නිසා ඇත්තටම ඒකියන්නේ ඒ වගේම ලේකම් මහත්තයා මෙතන සඳහන් කළා වගේ ගම් ප්‍රදේශය තමයි කෑගල්ල.කෑගල්ල ගත්තත් බුලත්කොහුපිටිය ප්‍රාදේශිය සභාව ගත්තත් මාලිමාවට තියෙන ප්‍රාදේශිය සභාවක්.මේතන ඒ ප්‍රාදේශිය සභාව අපේ ප්‍රාදේශිය සභාව තරම් ලොකු ප්‍රාදේශීය සභාවක් නෙමෙයි.ඒ කියන්නේ ආදායම් තියෙන ප්‍රාදේශිය සභාවක් නෙමෙයි.ලේකම්තුමා අපේ ප්‍රාදේශිය සභාවට ලොකු සේවයක් කලා.අපේ ප්‍රාදේශිය සභාව මේ මට්ටමට ඒතුමාගේ ධුර කාලය ඇතුළත විශාල කාර්යන් ටිකක් ඉටු කරලා තියෙනවා.ඒක මං හිතන්නේ ඒක ඔබතුමාවෙනුවෙන් ඇගයිම අපි මේකෙන් ලබා දෙනවා,රාජ්‍ය සේවය වෙනුවෙන්.ඉතින් කොහොමත් දැන් අර ස්ථාන මාරුව ,ඒක වෙනස් කරගන්න වේලාසන මැදිහත් වුණා නම් හොදයි කියලා තමයි හිතන්නේ ඒතුමා අපට ලොකු සහයක් දුන්නා.ඉදිරියේදි කොහොම වුණත් නතර කර ගන්න බැරි තරමට ඒක ගිහිල්ලා තිබුණා.මම ත් වේලාසන ඒන්න ලැබුනොත් දායකත්වය ලබා දෙයි.ඉතින් ඒතුමා ඔහුගේ රාජකාරී ජීවිතය ඉතාමත් බොහොම සාර්ථකව ඉටු කරලා ඒතුමාගේ අනාගතය සර්වප්‍රකාරයෙන් සාර්ථක වෙන්න කියලා ඒතුමා කරපු සේවය වෙනුවෙන් අපි අපේ මන්ත්‍රිවරු සියලු දෙනාම ස්තුති වන්ත වෙනවා.ඒකට අපි කෙටිකාලයක් තුළ අපි ඉදිරිපත් වෙලා කෙටිකාලයක් තුළ නැතිවෙනවා කියන්නේ අපේ සභාවට ලොකු පාඩුවක් කියලා මට හිතෙනවා.ඒ නිසා මමත් රජයේ නිලධාරියෙක් හැටියට මේ මමත් අපිටත් ට්‍රාන්සර් අපටත් ඒනවා.ඒ වගේම යන්ඩ උණොත් යන්ඩ වෙනවා.ඒක ඔබතුමා රජයේ සේවකයෙකුට ලැබෙන දෙයක් මම හිතනවා.මේ කරපු සේවය ඉතාමත් විශිෂ්ඨයි.ගරු කරමින් ඒබතුමා ඊළඟට යන ස්ථානය මම හිතන්නේ සලු දෙනාගේ ම සිත්සතන් තුළට සතුටක් ගේන විදිහට ඒම ප්‍රාදේශිය සභාව ඒම සභාව ඒ සඳහා ගොඩ නගාගෙන සභාපතිතුමට සහය දිලා කටයුතුකරන්න.ඔබතුමාට සියලු ශක්තිය ධෛර්ය ලැබෙන්න කියලා ඔබතුමා සුභාසිංහන කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි ඇත්තටම වෙනත් පෞද්ගලික පැහැදිලි කිරිම් ඇතුළේ වචනයක් කියන්න ඕන අපේ ලේකම් මහත්තයා ගැන.විශේසයෙනම 2023 අපි ප්‍රාදේශිය සබාව අවසන් වුණාට පස්සෙත් ඊට කලිනුත් ඒතුමා ඉතාමත් ලේකමවරයෙක් විදිහට සබාවේ තියෙන සියලුම වගකිම සභාපතිවරයාට පෙන්වමින් සභාපතිවරයාට සහය දෙමින් මන්ත්‍රිවරුන්ට සහය දෙමින් අවශ්‍ය උපදෙස් දෙමින් කරපු කාර්ය ඉතාම ප්‍රශංශනීයයි.ඒ වගේම දැන් අපි මේ සභාව පටන් අරන් මාස කීපයක් වගේ වෙන්නේ.ඒතකොට ඇත්තටම සුමිත් මන්ත්‍රිතුමත් කිවුවා වගේ මේ අපේ දේශපාලනයට අලුත් නොවුනට නමුත් මේ කාර්යාලීය ආයතනය පළාත් පාලනයට ක්ෂේත්‍රයේදී ඇත්ත වශයෙන්ම අවශ්‍ය වෙනවා අපිට පිටිපස්සෙ ඉඳන් අපිට හොඳ සහෝදරයෙක් වගේ වැඩිමහල් සහෝදරයෙක් වගේ අපිට මග පෙන්වීම අවශ්‍ය වෙනවා.ඉතින් අපි මඟපෙන්වීම ඇත්තටම මෙතෙක් දවසක් ලේකම් මහත්තයාට ඉතාම හොඳ සහයක් ලැබෙනවා.මමත් උපරිම මගේ මට්ටමින්,එතුමාට විශ්‍රාම යන්න ලොකු කාලයක් නෑ.අපිටත් යම්කිසි තැනකින් යා ගන්න බැරි අවස්ථා එනවා.එතුමා සඳහන් කළා වගේ එතුමා යන්නෙත් එතුමගේ ගම් ප්‍රදේශයට මයි.කෑගල්ලට.බුලත්කොහුපිටියත් මාලිමාවට අයත් ප්‍රාදේශිය සභාවක්.ඒ ප්‍රාදේශිය සභාව අපේ එක තරම් ලොකු ප්‍රාදේශිය සභාවක් නෙමේ.ආදායම් තියෙන ප්‍රාදේශිය සභාවක් නෙමේ.ලේකම්තුමා ලොකු සේවයක් කරලා ප්‍රාදේශිය සභාව මේ මට්ටමට ගන්න එතුමාගේ ධුර කාලය තුළ විශාල කාර්ය භාර්යක් දුන්නා.එතුමාගේ ඒ සේවය වෙනුවෙන් ඒ ඇගයීම අපි මෙතනදීත් ලබා දෙන්න ඕන.එතුමාගේ සේවය වෙනුවෙන්.ස්ථාන මාරුව ගත්තොත් ඒක වෙනස් කර ගන්න,ඒක නතර කරගන්න බැරි මට්ටමකට ගිහිල්ලා තිබුණේ.මම ත් ඒකට වේලාසන මැදිහත් වුණානම් හොදයි කියලා හිතුණා.කොහොම ළුනත් එතුමා අපට ලොකු සහයක් දුන්නා.එතුමාගේ රාජකාරී ජිවිතේ සේවා කාලයේ ශක්තිමත්ව බොහොම සාර්ථකව ඉටු කරලා ,එතුමාගේ අනාගතය සර්වප්‍රකාරයෙන් සාර්ථක වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,අපේ ලේකම්තුමාගේ නික්ම යාම අපට ඇත්තටම මේ සභාවට ආවට පස්සේ,අපි හදිසියේ නීතිමය පැත්ත කතා කලත් ඒ පිළිබඳව අපිත් ඒක්ක කථා කරලා මෙහෙමයි කියලා පැහැදිලි කරලා අපි ඒ ගමන ගියා.බල්බයක් දාන්න ඕන කිවුවහම ඒ වෙලේම ඒක බලලා කොහේ පාර (සෝෂාව) ඒනිසා අපට විටෙක රාජ්‍ය නිලධාරියෙක් තවත් විටෙක පියෙක් සේ ඒතුමා පවසුවා. අපි ඔබතුමාගේ නික්ම යැම අපට ශෝකයක් වුනත් නිතිය ඉදිරියේ ඔබතුමාට යන්න සිදු වෙනවා. ඔබතුමා දක්ෂ පරිපාලන නිලධාරියෙක් කියලා අපි දන්න නිසාම අපි ඔබතුමාට අපේ ගෞරවය ස්තුතිය පුදකරමින් තව ඒක දෙයක් අපි මේ වෙලාවේ,මේක කියන්නත් ඕන මං කිවුවෙත් අවස්ථාවක් වුනෙත් නෑ.අපේ සහොදර ගයේෂාන් චින්තක කරුණාරත්න ගරු මන්ත්‍රිතුමා ඒතුමාගේ පක්ෂයේ ඉතින් දිස්ත්‍රික් සම්බන්ධිකාරක ධුරයෙන් පිදුම් ලැබුවා.ඒනිසා අපට ඒ සතුටත් මේ වෙලාවේ මේ වෙලාවේ ප්‍රකාශ කරන්නට ඕන.ඒවගේම උදැසන සිට මේ දක්වාම විශාල කාලයක් ගියත් සභා වාර්තා ගැන අපි කථා කළා.මෙහි යම් යම් ගැටලු සහගත තැන් තියෙනවා.මේක මෙතන මතක් කරන්න සිද්ධ වෙනවා.මොකද මේ සභා වාර්තාව කියන්නේ නීතියක් .ඒක නිසා මේක අවදානෙට යොමු කරනවා මේ වෙලාවේ.මෙන්න මෙහෙම මේකෙ මම කතා කළා අර ඔබතුමාට අර විදුහල්පතිතුමා ,කාරණය පිළිබඳව.මම

ඒක ගියවර සභා වෙලාවේදී මුන්සීර් මන්ත්‍රිතුමා යෝජනාවේදීමං ඒ අදහස් දැක්වීමේදී,කියලා තියෙනවා අල්ලක්ෂා කියලා.ඒක අල්-අක්ෂා ලෙස නිවරදි වෙන්න ඔන.අල්-අක්ෂා මෙතන.මුන්සීර් මන්ත්‍රිතුමාගේ ගේ අසලින් නෙමෙයි රාෆි කපූර් මන්ත්‍රිතුමාගේ ගේ අසලින්.ඊටපස්සේ තියෙනවා අල්හික්මා ප්‍රාථමික විද්‍යාලයට යන මාර්ගය කිවුවහම ඒකට ලියනවා අල්ලක්මා කියලා.ඊට පස්සෙ මං කතා කළා ඇහැලියගොඩ වත්තෙන් ඒන ත්‍රිවිල් රථ රියදුරන් ඒනකොට ත්‍රිවිල් ඒකේ ළමයි 10 ක් 15 ක් ළමයි පටවල ඒනකොට මේ ඇළට කඩාගෙන වැටෙයි කියලා.ඒක ලියලා තියෙනවා බැරි වෙලාවත් ගහක් ඇද ගෙන වැටුනොත් ලොකු අපහසුවකට පත් වෙනවා කියලා.ගහක් නෙමෙයි,ගහක්.මේක ගොයම් කොලේට මුවා වි වෙඩි තිබ්බා කිවුවා කියලා කිවුවා.ඒ නිතියේ දී....ඒ නිසා මේවා නිවරදි කරන්න.ඒ වගේම තමයි තව ඒකක් දාල තිබුණා රංජිත් බණ්ඩාර මන්ත්‍රිතුමා ,පී රංජිත් බණ්ඩාර කියලා මගෙ නමත් වෙනස් කරලා තිබුණා. නිලධාරිතුමියන්ලාඔයගොල්ලන්ගේ අවධානය යොමු කරන්න කියලා ප්‍රකාශ කරමින් අද දවසේ....

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ලේකම් සමඟ අපට දිර්ඝ කාලයක් රාජකාරිමය වශයෙන් කටයුතු කරන්න අවස්ථාවක් ලැබුන් නෑ.ඒත් ඒතුමා අපි දන්නවා ඒම විෂය සම්බන්ධව ඒතුමාගේ මේ සභාවට ලබාගත යුතු දැනුම නොලැබී යාම සම්බන්ධව අපි කනගාටු වෙනවා.කෙසේ වෙතත් රාජ්‍ය සේවයේ යම් දිනක ස්ථානමාරුවක් ආවොත් යන්න ඕනේ.දැන් මට ඇවිත් තියෙන්නේ පළාත් සේවයේ ස්ථාන මාරුවක්.ඒක පනිෂ්මන්ට් ඒකක්.කිසිම හේතුවක් නැතුව.ඒතුමගේ ඉල්ලීම මත මේ සිදුවීම වෙලා තියෙන්නේ.ඒනිසා මෙතුමට අපි සුභ පතනවා.ඉදිරි අනාගතය අපේක්ෂා කරන විදිහට කටයුතු කරගෙන යැමට ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ස්තුතිවන්ත වෙමින් ඒත් ඒක්කම මට ඔබතුමාට ස්තුතිවන්ත කරන්න තියෙනවා මේ මොහොතේ.මම ගිය සභාවාරයේදී අදහස් දක්වපු අවස්ථාවේ මම ඉල්ලිමක් කලා.මේ ප්‍රාදේශිය සබාවේ ඔබතුමා සතු නිල රථය පාසල් අරින වේලාවේදී ඉවත් කරලා දෙන්න කියලා.ඒක ඉවත් කරලා තියෙනවා.බොහොම ස්තුතිවන්ත වෙනවා.විශාල දෙනෙක්ගේ ප්‍රසාදයට ලක් වෙලා තියෙනවා.ඒ ඔබතුමාගේ ක්‍රියාව පිළිබඳව.ඔබතුමාට ස්තුතිකරන්න අවස්ථාවක් කර ගන්නවා.මේ මොහොතේදී බොහොම ස්තුතියි.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ඇත්තටම අද ස්ථාන මාරුවක් ලබා යන අපේ ලේකම්තුමා මේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට ඉතා විශිෂ්ය සේවයක් සැපයු නිලධාරියෙක් විදිහට අපිට හදුනා ගන්න පුළුවන්කම තියෙනවා.මොකද අපිට හා හා පුරා කියලා සබාපති විදිහට වැඩ කරන්නහැකියාවක් හම්බුණේ ඒ ප්‍රතිඵලය ඒකතු කිරීමේ ප්‍රමුඛ වුණේ මෙතුමා.කියන ඒක මං මේ වෙලාවේදී මතක් කරන්ඩ කැමතියි.මං ඇවිල්ලා ඇහු අවා ලේකම් තුමාගෙන් සභාපති වුණොත් ඒහෙම මේ කෙ වැඩ කරන්න සල්ලි තියෙනවද කියලා.ඔව් මන්ත්‍රිතුමා කොටි තුනක් ඒකතු කරලා තියෙනවා කියලා කිවුවා.ඒනිසා අපි වැඩිපුර මහන්සිවෙලා කම්පේන් ඒක කළා.සභාපති වෙන්න බැරි වුණා.ඉතින් ඉතා විශිෂ්ය නිලධාරියෙක් විදිහට අපට සලකන්න පුළුවන්.ඒතුමා ඇත කාලයේ ඉදන් අපිත් ඒක්ක හිතවත්. අපි මෙනව හරි නොදන්න කාරණාවක් සම්බන්ධව ඒතුමා නිහතමානිව අපට කරුණු පහදල දීපු අවස්ථා ඔන තරම් තියෙනවා.ඒතුමා ප්‍රායෝගිකයි.ඉතින් අපි විශ්වාස කරනවා ඊළඟ සේවා ස්ථානයේදීත් ඒතුමාගේ විශිෂ්ය දායකත්වය ඒක්ක බුලත්කොහුපිටිය ප්‍රාදේශිය සභාව මාලිමා ප්‍රාදේශිය සභාවක් කියලා කිවුවා.ඒ සභාවත් ඔසවා තබන්න ඔබතුමාට ශක්තිය ධෛර්ය ලැබෙයි කියලා .ඉතින් ඒතුමාගේ අනාගතය ඉතාමත් සුභ අනාගතයක් වේවා කියලා ප්‍රාර්තනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ඇත්තටම අද දිනයේ අපේ ලේකම්තුමාගේ ස්ථානමාරුව සම්බන්ධව හැම කෙනෙක්ම බොහොම දුක්වෙන අවස්ථාවක්.මං විශ්වාස කරනවා ලංකාවේ ආයතන 168 ක් තියෙනවා.ඒ ආසන 168 න් ගරු සභාපතිතුමා ඇහැලියගොඩ ආසනය තමා බහු පක්ෂ තියෙන්නේ.වැඩිම පක්ෂ තියෙන ආසනය ඒ ආසනවලිනුත් ඇහැලියගොඩ බල ප්‍රදේශයේ අපේ සභාව තමයි.විශාල පක්ෂ ප්‍රමානයක් නියෝජනය කරන ඇහැලියගොඩ බල ප්‍රදේශය තමයි.ඒ වගේ සභාවක සියලු දෙනාම බැලන්ස් කරමින් මං හිතන්නේ ලේකම්තුමා වැරදියට තේරුම් ගන්න ඒකක් නෑහැම දෙනාටම ලේකම්තුමා අර පක්ෂෙද මේ පක්ෂෙද ආණ්ඩු පක්ෂෙද කියලා නෑ.හැම කෙනාටම තමන්ට කරන්න පුළුවන් උපරිමය කරපු ලේකම් කෙනෙක්.මට මතකයි 2020 තමයි ඔබතුමා ආවේ.අපේ ආණ්ඩුව යටතේ .ඒ ඔබතුමා ගන්නකොට විවිධ මත ඵල වුණා.සමහර සභිකයන් අනවබෝධයෙන් යුතුව මෙතුමා පිළිබඳ ප්‍රකාශ කළා.හැබැයි මං විශ්වාස කරනවා දිලින් මන්ත්‍රිතුමා කිවුව වගේ මේ වසර 5 තුළමෙතුමා ඔබතුමාට වැඩ කරන්න විහාල මුදලක් ඒකතු කළා.මං හිතන්නේ කොයි යෝජනා ගෙන ආවත් සමහර වෙලාවට මහ ආණ්ඩුව වෙන්න පුළුවන් කොමසාරිස්තුමාගෙන් වෙන්ඩ පුළුවන්.ආණ්ඩුකාරතුමාගෙන් වෙන්ඩ පුළුවන් කොමසාරිස්තමාගෙන් වෙන්න පුළුවන්.ඒ හැම අවස්ථාවකදීම මෙතුමා මුදල් ඒකතු කළා.මුදල් වියදම් කළේ බොහොම ප්‍රවේශමෙන්.ඒක අපි දන්නවා.අපි අහලත් තියෙනවා.අපි සභාවේ නැති කාලේ ඒ නිලධාරින් ඒක්ක කතා කරනකොට ලේකම්තුමා ඒක්ක නම් වියදම් කරන්න බෑ කියලා කොයි තනතුර දැරුවත් ඒහෙම කෙලින් හිටියා.ඒක මං හිතන්නේ ඔබතුමාට ශක්තියක් වුණා.ඔබතුමාට මේ යෝජනා ක්‍රියාත්මක කරන්නේ ඒ මුදල් හින්දා.ඒ වගේම තම් කාගෙවත් හිත රිද්දුවේ නෑ.බොහොම නිර්යාජව කියන්න ඕන ඒක තමන්ට කොච්චර පාඩුවක් වුණත් ඒ වෙලාවේදී ඒ පුද්ගලයාගේමහජන නියෝජිතයෙක් වෙන්න පුළුවන් සංවිධායක වරයෙක් වෙන්ඩ පුළුවන් දේශපාලන ක්‍රියාකාරි පුද්ගලයෙක් වෙන්න පුළුවන්.ඒ හැම තැනකදිම ඒතුමා බොහොම විචක්ෂණශිලිව හැසුරුවා කිවුවොත් නිවරදියි.ඒක තමයි රාජ්‍ය සේවයේ රාජ්‍ය පරිපාලනයේ තියෙන අවබෝධය හා අත්දැකීම.ඒහෙම කටයුතු කරපු ලේකම්වරයෙක්. මට කියන්න සතුටුයි.2022 මෙතුමට මීට වඩා ප්‍රබල ප්‍රශ්න ටිකක් බලපෑවා.ඒතනදි අපි කෙලින් හිටියා ඒතුමත් ඒක්ක ඒ වෙලාවේ.තවත් අපේ මන්ත්‍රිවරු සභාපතිවරු ඒක්ක ඒකතු වෙලා ඒ වගේම ඒ වෙලාවේ ගරු පවිත්‍රා වන්නිආරච්චි අමාත්‍යතුමිය බොහොම නිර්භිතව මුහුණ දුන්නා.ඒ කාලේ හිටපු ආණ්ඩුකාරතුමත් එක්ක ඒවගේම පලාත් ලේකම්තුමත් එක්ක සටන් කරලා එතුමා ආරක්ෂා කරලා දුන්නා.හැබැයි අද මෙතුමා කිවුව විදිහට සභාපතිතුමත්

උපසභාපතිතුමත් ගොඩක් මහන්සි වුණා.හැබැයි මහන්සියේ ප්‍රතිඵලයක් නැති වුණා.හැබැයි මහන්සියේ ප්‍රතිඵලයක් නැති වුණත් අපිට තව මාස 3 ක් 4 ක් යනකොට තේරෙයි එතුමා අපෙන් ගිහිල්ලා අපි මේ යන වැඩපිළිවෙලත් එක්ක අපිට අපි කොහොමද වැටෙන්නේ කියන එකට.මට ලොකු දේශපාලන දැනුමක් තියෙන මිනිස්සු නෙමෙයි.හැබැයි ඒ කරපු ආදරය,මේ සභාවේ නිලධාරීන් සමඟ එකට කරපු කටයුතු කාර්ය මණ්ඩලයත් එක්ක,අපේ මාර්ග කම්කරුවොත් එක්ක ලොකු සම්බන්ධතා ටිකක් තියාගත්තා.අපි ඒක දන්නවා.සෑම අවස්ථාවකම ඒ වෙනුවෙන් පෙනී ඉදල කටයුතු කළා.ඒ නිසා තමයි ඔබතුමාට අපිටමේ වගේ සබාවකින් ප්‍රතිපාදන වෙන් කරන්න හරි මොනම කටයුත්තකට ඉතුරු වෙලා තියෙන්නේ.ඒ නිසා මං ඔබතඅමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. එතුමා දැන් මං හිතන්නේ බුලත්කොහුපිටිය ඔබතුමාගේ ඒ දේශපාලන සම්බන්ධතා සහිතව කටයුතු කරලා අපට ගෙන්නගන්න පුළුවන් වුණොත් අපට හොඳ වෙයි.අපි දන්නෙ නෑ එන්නෙ කවුද කියලා.එතුමා මීට වැඩිය දක්ෂ වෙන්න පුළුවන්.එතකොට ප්‍රශ්නයක් නෑ.එහෙම රාජකාරී කටයුතු සර්වප්‍රකාරයෙන්ම ශ්‍රී සුමන සමන් දිව්‍ය රාජෝයෝත්තමයාගේ ආශිර්වාදයෙන්. එතුමා සමන් දෙවි අඩවියට තමා යන්නේ.කෑගල්ල දිස්ත්‍රික්කයේ.ඒ නිසා මං හිතනවා ඔබතුමාට වරදින් නෑ.ඔබතුමාගේ සෑම අවස්ථාවකදීම සෑම දෙනාගේම සිත් නොරිදා මලෙන් රොන් ගන්නවා වගේ වැඩ කළේ.ඇත්තම කතාව ඒක තමයි.කවුරුත් පිලි ගත්තත් .නොගත්තත්.අපි මොනව හරි කිවුවත් නෑ නෑ නෑ මන්ත්‍රිතුමා ඒක වෙන්ඩ එහෙම බෑ අපි එතුමටත් සහයෝගය දෙන්න ඕන ලේකම්වරයෙක්.ඒක අපි අත්දැකීමෙන් දන්නවා.එහෙම ලේකම්වරයෙක් තමයි.සහෝදරයෙක්. අපි අතරින් දැන් නික්මෙනවා වගේ හැඟීමක්.නමුත් රාජකාරී ස්වභාවය ඒකයි.රාජ්‍ය සේවයේ ස්වභාවය ඒකමයි.අපි ඒකටත් අනුගත වෙලා කටයුතු කරමු.එතුමාගේ කටයුතු සාර්ථක කර ගන්න අපි සුභාශිංසන එකතු කරමු. ඒ වගේම අපේ ගරු සභාපතිතුමාගෙන් අපේ ගරු මන්ත්‍රිවරුන්ට පනත ලබා දෙන්න කියලා කියනවා.ඒ ගැන වැඩපිළිවෙලක් හදන්න.ඒගැන ඔබතුමාගේ අවධානය යොමු කොට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,බොහොම ස්තුතියි.වැඩි වේලාවක් ගන්නේ නෑ.විනාඩි තුනෙන් හතරෙන් ඉවර කරනවා.කාරණා 3 ක් 4 ක් තියෙනවා කතා කරන්න මොකද?අපි ගේන යොජනා 65 ක් ලබා දිලා තියෙවා.නමුත් මේවනවිට සබාවට යෝජනා 100 කට ආසන්න ප්‍රමානයක් තියෙනවා.ඉතින් ගරු සභාපතිතුමනි මං ඔබතුමාගේ අවධානය යොමු කරනවා.මන්ත්‍රිවරයෙකුට මාසෙකට හරි අවුරුද්දකට හරි යම්කිසි නිශ්චිත මුදලක් වෙන් කරන්න.ඒක ඇතුළේ යොජනා 3 ක්ද 5 ක්ද 10 ක්ද 100 ක්ද නැත්නම් එක යෝජනාවක් කර ගන්නත් පුළුවන්.එහෙම යම්කිසි ප්‍රතිපාදනයක් ලබා දීමේ වැඩපිළිවෙලක් මම යෝජනා කරනවා.ඒක සභාව කතා කරලා ලබන සතියකදී ඒ ගැන කතා කරමු.එතකොට යම්කිසි කෙනෙක්ගේ යෝජනාව ලක්ෂ 25 ක 30 ක් වෙන්න පුළුවන්.ගව කෙනෙක්ගේ යෝජනාව රුපියල් පනස්දාහක් වෙන්ඩ පුළුවන්.එතකොට මුදල් බෙදීමේදී සභාවේ තියෙන දේපල මුදල් සාධාරණව බෙදී යාමක් නොවන වග මම දකිනවා.ඉතින් ලරු සබාපතිතුමාට යොමු කරනවා සියලුම මන්ත්‍රිවරුන්ට ,වැඩි කොටස ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයෙන් ගන්න.ඒක කිසිම ගැටලුවක් නෑ.විපක්ෂයේ මගේ පෞද්ගලික යොජනාවක් විදිහට හැමෝටම යම්කිසි නිශ්චිත මුදලක්,රුපියල් ලක්සයක් වෙන්ඩ පුලුවන්.ලක්ෂ පහක් වෙන්ඩ පුලුවන්.ඒක කිසියම් නිශ්චිත කාලයකට ලබා දෙන්න.එතකොට ඒකෙන් තමන් කැමති සංවර්ධන යෝජනාවක් වැඩසටහනක් කරන්න පුලුවන්.

ඊටපස්සේ දෙවනි යෝජනාව මම සභාපතිතුමනි විපක්ෂයේ මන්ත්‍රිවරු සභාවට පැමිණියහම මම බලාපොරොත්තු වෙනවා අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රිවරුන් දෙන්නා කතා කරයි කියලා.දැන් මාස තුනක් වෙනවා.අපි සභාවට ඇවිල්ලා විපක්ෂයේ මන්ත්‍රිවරයෙක් විදිහට සභාව නැති දවසක ආවොත් ඉන්න තැනක් නෑ.ඇවිල්ල අපේ හිතවතෙක්ගේ පාක්ෂිකයෙන්ගේ යම්කිසි අපිට ඡන්දෙ දීපු කෙනෙක්ගේ වැඩකට අපි ආවොත් අපේ ගමක කෙනෙක්ගේ වැඩකට ආවොත් අපිට ලිවුමක් ලියා ගන්න හදිසියේ වුණොත් අපිට ලියාගන්න තැනක් නෑ.කොහේ හරි මේසෙක් නැත්නම් අර එළියේ තියලා තියෙන පොඩි ස්ටුල් එකක්, එකේ හරි තමයි වාඩි වෙන්න තියෙන්නේ.ඉතින් ගරු සභාපතිතුමනි මං ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා පක්ෂ විපක්ෂ සියලු දෙනාටම ඉන්න පුළුවන් තැනක් සුදානම් කරන්න කියලා.ඒ කියන්නේ අර එහා පැත්තේ කාමරයට කියන්න එපා.මොකද අපි එතනදි අපි දේශපාලනය කරන සියලු දෙනාම දේශපාලනය කරන්නේ අපි ඒ මිනිස්සු සමග ගැටීමක් අවශ්‍යයි.වෙන ගැටුමක් නෙමේ.එතකොට ඒකට සුදුසුම තැන මේ සභාව තුළ වෙන් කරන්න කියලා මං කියනවා.මං දැක්කා ඔබතුමාගේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරුත් ඇවිත් ඔබතුමාගේ කාමරයේ ඉන්නවා.එතකොට ඒක හරි අපහසුයි.කවුරු හරි ආවොත් නැගිටින්න ඕන වාඩිවෙලා හිටියොත්.ඉතින් හරි අපහසුයි ඒ කාර්ය.ඉතින් මං ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ඊට පස්සෙ අපි ඊළඟට කතා කළා ඉස්පිරිතාලෙ එක්ක නෑදුරන පාර සම්බන්ධ වන මාර්ගය වන්වේ කිරීම සම්බන්ධයෙන්.ඉතින් මම ඔබතුමාගෙන් ඉල්ලනවා නගරයේ සම්පත් බැංකුව අසලින් ,ඊට පස්සේ කොමර්ෂල් බැංකුව අසලින් දිවෙන මාර්ග දෙක රේල් පාරයි ප්‍රධාන පාරයි සම්බන්ධ කරන්න වන්වේ කරලා තිබුණා.හැබැයි ඒ දෙක ක්‍රියාත්මක වෙන්නේ නෑ.එතකොට මිඩ්ලන්ඩ් එක අසලින් යන පාරට අපි ,ඒ වෙලේ පොලීසිය මොකුත් කරලා තිබුණ් නෑ.ඉතින් මං ඔබතුමාගේ ගරු අවධානය යොමු කරනවා මේ මාර්ග තුන ක්‍රියාත්මක කරන්න විතරයි තියෙන්නේ.බෝඩ් එකක් ගහල තියෙනවා.පොලීසියේ එක්කෙනෙක් ඉදලා දවස් දෙකක් ඇල්ලුව නම් ඔය ප්‍රශ්නෙ විසදෙනවා.එතකොට මේ නගරය පොඩි ක්‍රමානුකූල බවක් එනවා.අරහෙන් එනවා මෙහෙන් එනවා වාහන ටික සම්පත් බැංකුව ගාව හිරවෙනවා.කොමර්ෂල් බැංකුව ගාව පාරෙන් හැමෝම රිවස් කරන්න ඕන.දවසට 10 දෙනෙක් විතර.ඉතින් ඒ සම්බන්ධව මං ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ඊට පස්සේ අපි ප්‍රවාහන දීමනාව ගැන කතා කළා.ප්‍රවාහන දීමනාවේදී පැය 12 ක් විතර මටත් ලියන්න පුළුවන්.මොකද මං පක්ෂෙ විධායක සභාවේ ඉන්නවා.ලංකාව පුරා දේශපාලනය කරනවා.සභාපතිතුමත් දන්නවා.එතකොට ඒවාට ගිහාම දවස් එකහමාර යනවා.හැබැයි අපි සභාවේ වැඩවලට ගියාද නැද්ද කියන එක ගැටලුවක්.හුගක් දේශපාලන වැඩවලට දුවලා තියෙන්නේ.උදේ 7 ට ගෙදරින් ගියොත් රෑ 12 ට තමයි ඇවිල්ලා තියෙන්නේ.පැය 17 ක් ලියන්න පුලුවන්.හැබැයි ඒක සබාවේ වැඩවලටද ගියේ කියලා ප්‍රශ්නෙ තියෙනවා.ඒහින්ද

අපිට මගෙ යෝජනාවක් විදිහට ඉස්සෙල්ලා දුන්නා වගේ ඩීසල් බිල දුන්නහම ඒ ඩීසල් පෙට්‍රල් බිල් වලට ලබා දෙන්න අවස්ථාවක් යෝජනා කරනවා.

ඒ වගේම අවසාන වශයෙන් වසර 5 කට අධික කාලයක් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ලේකම් ලෙස කටයුතු කළ ගුණසේකර මහතාට සුභ පතනවා.ඒ වගේම මන්ත්‍රීවරු ,මහජනනියෝජිතයෝ නොමැති කාලයක පවා සභාව මෙහෙයවලා ගැටලු ඇති නොවන ආකාරයට මෙහෙයවලා සභාව ඉතා හොඳ මට්ටමකට තියාගෙන හිටියා.විශාල කාර්ය භාර්යක් කලා.ඉතින් මං එතුමාට සුභ පතනවා බොහොම ස්තුතියි.

**සභාපතිතුමා:-**
එහෙනම් අපි සභාව අවසන් කරමු නේද?

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මට විනාඩියක් අවශ්‍යයි.මම පොලීසියට ගියාටපස්සේ මේ ඇහැලියගොඩ ප්‍රශ්නයක් තියෙනවා.ගරු සභාපතිතුමනි ප්‍රවාහනය ගැන.රත්නපුර ඉඳන් එන බස් එකක් හෝල්ට් එකේ පං හිතන්නේ පැය භාගෙකට වැඩියි.විනාඩි 20 ක් විනාඩි 15 ක් අතර හෝල්ට් එකේ ටිකක් තියාගෙන ඉන්නවා.මේහෝල්ට් එකේ ටිකක් තියාගෙන ඉන්නවා.මං පොලීසියත් එක්ක ඒ ගැන කතා කරද්දී සභාපතිතුමත් එක්කත් කතා කරලා ඒක සම්බන්ධීකරණයට දාල අපි මාර්ග අධිකාරියට කතා කරලා මොකක් හරි කරමු කියලා, ඊයේ කතා කළා.අපි දැනට කිරිබත්ගොඩ ගම්පහ වගේ බස් වේලාවක් දීලා ඔහොම නතර කරගෙන ඉන් නෑ.අනිවාර්යෙන් සෙනග ගන්න කියලා නීතියක් දාල තියෙනවා.අපි ඇහැලියගොඩටත් ගෙනැල්ල මොකක් හරි කටයුත්තක් කළොත් හොඳයි කියලා.මොකද පෙලක් වෙලාවට විනාඩි 10 ය 15 පැය භාගෙ පෙලක් බස් තියාගෙන ඉන්නවා.හවස් වෙලාවට එහෙම.එය හරිම අසාධාරණයි මහජනතාවට.අපි පොලීසියත් එක්ක කතා කරලා මොකක් හරි ප්‍රයෝජනවත් කටයුත්තක් කරමු කියලා මං යෝජනා කරනවා.

**සභාපතිතුමා:-**
හොඳයි අපි ඒ යෝජනාව මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයා ඇහැලියගොඩ පෞද්ගලික සහ රජයේ සියලුම නිලධාරීන් පොලීසියේ නිලධාරීන් එකතු වෙලා සාකච්චා කිරිමට නියමිතයි.

මේ අවස්ථාව අවස්ථාවක් කර ගන්නවා සභාවේ ගරු මන්ත්‍රී ගයේෂාන් මන්ත්‍රී තුමා මං දැක්කා මාධ්‍යයෙන් තමා දැක්කේ එතුමා දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සංවිධායක වරයෙක් වශයෙන් පත්වීමක් ලැබිලා තියෙනවා.ඉතින් අපි සියලු දෙනාගේම සභාවේ මං ඇතුළු එතුමාට ඉදිරි දේශපාලන කටයුතු කිරිමට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා මේ අවස්ථාවේදී ප්‍රාර්ථනා කරනවා. සියලු දෙනාටම සුභ සන්දෑවක් වේවා.සභාවේ කටයුතු පස්වරු 3.10 අවසන් විය.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව

2025 ක් වූ..................................මස................ දින

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී............